සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාර්යසාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT
2025



ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

කාර්යසාධන වාර්තාව - 2025



සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

CM 44930 - 20 (2026/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

පටුන

පිටුව

අන්තර්ගතය

01	පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01 - 05
02	පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	06 - 76
03	පරිච්ඡේදය 03 -	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	77 - 99
04	පරිච්ඡේදය 04 -	කාර්යසාධන දර්ශක	100 - 101
05	පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	102 - 105
06	පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	106 - 112
07	පරිච්ඡේදය 07 -	අනුකූලතා වාර්තාව	113 - 119
08	සංවර්ධන වැඩසටහන්වලට අදාළ ඡායාරූප		

පරිච්ඡේදය - 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනත මගින් ස්ථාපිත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත 2023.04.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, පැවරී ඇති ප්‍රධානම කාර්යය වන්නේ දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 12 ක් නිශ්චිත කාල සීමාවක් තුළ ආර්ථික, සමාජීය හා මානසික යන අංශයන්ගෙන් සවිබලගැන්වීමය. මෙයට අමතරව සමාජ ආරක්ෂණ අරමුදල මගින් එම පවුල්වල දෛනික වැදගත් අවස්ථාවල දී ආරක්ෂණය සැලසීමට අදාළව දීමනා ලබා දේ. ශ්‍රී ලංකාවේ දිළිඳුකම මුලින් උපුටා දැමීම සඳහා එම පවුල් සවිබලගැන්වීමට ඔවුන්ගේ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් සහ ප්‍රජාමූල බැංකු 1097 ක් මගින් දිවයින පුරා විසිරී සිටින එම දිළිඳු පවුල්වල සහ අඩු ආදායම්ලාභී පවුල්වලට අවශ්‍ය කරන විවිධ ක්ෂුද්‍රමූල්‍ය ණය සම්පාදනය කිරීම ද සිදු කෙරේ. තවද, දිළිඳු පවුල් සහ අඩු ආදායම්ලාභී ජනතාව ඒකරාශී කරමින් ප්‍රජාමූල සංවිධාන ජාලයක් ස්ථාපිත කොට පවත්වාගෙන යාමත්, ඔවුන්ගේ සමාජ හා ආර්ථික සංවර්ධනය උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සිදු කෙරේ.

1.2 දැක්ම හා මෙහෙවර

දැක්ම

"වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම"

මෙහෙවර

අවාසි සහගත තත්ත්වයට පත් ජනතාව ආර්ථික, සමාජීය, භෞතික, මානසික, නෛතික, හා පාරිසරික වශයෙන් බලගැන්වීම සඳහා කාර්යක්ෂම හා සඵලදායී වැඩසටහන් ප්‍රජා සහභාගීත්වය ලබා ගනිමින් තිරසාර ක්‍රමවේද ඔස්සේ ක්‍රියාවට නැංවීම.

පරමාර්ථ

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 4 වන වගන්තිය අනුව දෙපාර්තමේන්තුවේ පරමාර්ථ පහත දක්වා ඇත.

(අ) දිළිඳුබව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කරනු ලබන සමාජයක් බිහි කිරීම සඳහා අවශ්‍ය විය හැකි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම.

(ආ) පුද්ගල, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කෙන්ද්‍ර කරගත් ජීවනෝපාය ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.

(ඇ) එක් එක් පුද්ගලයා සහ පවුල වෙනුවෙන් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම.

(ඈ) ජාතික සංවර්ධනය වේගවත් කිරීම සඳහා ජනතාව ඒකරාශී කිරීම සහ සවිබලගැන්වීම.

(ඉ) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය ඉහළ නැංවීමේ කාර්ය සඳහා ක්ෂුද්‍රමූල්‍ය පහසුකම් සැපයීම.

(ඊ) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි භෞතික සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(උ) ජනතාවගේ ආර්ථික සහ සමාජ සංවර්ධනයට අවශ්‍ය විය හැකි අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සිදු කිරීම.

(ඌ) ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සහ සමාජ ආරක්ෂණයක් අවශ්‍ය පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණ ජාලයක් නිර්මාණය කිරීම.

1.3 ක්‍රියාත්මක ප්‍රධාන ධාරාවන්

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ විධිවිධාන අනුව, දෙපාර්තමේන්තුව පහත පරිදි ප්‍රධාන ධාරා තුනක් යටතේ ක්‍රියාත්මක වේ.

1. නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව
2. ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව
3. ප්‍රජාමූල සංවිධාන ධාරාව

1. නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව

සමෘද්ධි පනතේ 7 (1), (2), (3) වගන්ති අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස්වලට අනුව ජාතික සභාවක් පත් කර ඇත. එහි සාමාජිකයින් 11 දෙනෙකු සිටී. දෙපාර්තමේන්තුවේ සංයුතිය පහත පරිදි වන නිල තන්ත්‍රයකින් සමන්විත වේ. අධ්‍යක්ෂ ජනරාල්ගේ නිල නායකත්වය යටතේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් තිදෙනෙකු සහ ප්‍රධාන අංශ 22 ක ප්‍රධානීන් මගින් ප්‍රධාන කාර්යාලය ඇතුළුව දිස්ත්‍රික් 25 ආවරණය වන ලෙසින් සාධනීය ලෙස සේවාවන් ක්‍රියාත්මක කරනු ලබයි.

දිස්ත්‍රික් මට්ටමින්, දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මෙහෙයවීම යටතේ ඇති දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් සහ එම කාර්ය මණ්ඩලය මගින් දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, කලාප හා ග්‍රාමනිලධාරී වසම් මට්ටමින් සමෘද්ධි පනතේ අරමුණු ලභාකර ගැනීමට අදාළ රාජකාරී ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රජාමූල බැංකු කටයුතු, ප්‍රජාමූල සංවිධාන පිහිටුවීම සහ සංවර්ධන ව්‍යාපෘති ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් ප්‍රාදේශීය නිලධාරීන් වන සමෘද්ධි කළමනාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලු කාර්යාල හා ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි. 2025 වසරේ දෙසැම්බර් 31ක දින වන විට සමස්ත සේවක සංඛ්‍යාව 21,641 වේ.

2. ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව

සමෘද්ධි පනතේ 25(1),(2),(3),(4) ,29 (1),(2),(3),(4) හා 34 වගන්ති අනුව ප්‍රජාමූල බැංකු, බැංකු සමිති හා මහා සංගමයේ කටයුතු අධීක්ෂණය හා නියාමනය සඳහා සාමාජිකයින් 8 දෙනෙකුගෙන් යුත් කළමනාකරණ මණ්ඩලයක් පත් කර ඇත. මෙම අංශයේ කාර්යභාරය වන්නේ, ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂ හා මහා සංගමය යටතේ පාලනය වන කාර්ය මණ්ඩලය මගින් සහ දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 335 ට අදාළ ප්‍රජාමූල බැංකු, ප්‍රජාමූල බැංකු සමිති, කලාප සහ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ක්‍රියාත්මක වන බැංකු 1,097 කට අදාළ සියලු කාර්ය මණ්ඩලය මගින් මෙම බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීමයි. එම පද්ධතිය මගින් ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීමේ

තැන්පතු පවත්වාගෙන යාම, ප්‍රතිලාභීන්ගේ තැන්පතු පවත්වාගෙන යාම හා ඉතුරුම් වර්ධනය, ප්‍රතිලාභීන්ට හා අඩු ආදායම්ලාභීන්ට ක්ෂුද්‍රමූල්‍ය ණය නිකුත් කිරීම, ඉතිරි අරමුදල් වැඩි ප්‍රතිලාභ ලැබෙන මූලාශ්‍රවල ආයෝජනය කිරීම සහ වෙනත් සමාජ සුබසාධන කටයුතු ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.


2025 වර්ෂය තුළ දී ජීවනෝපාය සංවර්ධන කටයුතු නිවාස, පාරිභෝගික, ආපදා සහ වෙනත් ණය පහසුකම් අත්‍යවශ්‍ය ග්‍රාමීය ජනතාවට ණය යෝජනා ක්‍රම 22 ක් යටතේ අඩු පොළී අනුපාතයන්ට ණය පොළි පහසුකම් ලබා දී ඇත. මෙම අංශයේ සියලු කටයුතු නව තොරතුරු තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක කර ජනතාවට වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ඉන් ලබා දීමට පියවර ගෙන ඇත.

3. ප්‍රජාමූල සංවිධාන ධාරාව

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතට අනුව සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා සමෘද්ධි දිස්ත්‍රික් සංවිධාන පිහිටුවීම සඳහා අවශ්‍ය නියෝග හා ව්‍යවස්ථා (සමෘද්ධි පනතේ 42 වන වගන්තිය) ඇතුළත් 2017 මාර්තු 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2009/08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්විය. ඒ අනුව සමෘද්ධි පනතේ මූලික අරමුණ වන දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය ඉටු කිරීම උදෙසා සෑම ග්‍රාම නිළධාරි වසමක්ම ආවරණය වන පරිදි ස්වේච්ඡාවෙන් සංවිධානය වන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 09 වන වගන්තිය) ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 15 වන වගන්තිය) සමෘද්ධි දිස්ත්‍රික් කමිටු පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 19 වන වගන්තිය) සිදුකර ඇත. ප්‍රජා මූල සංවිධානවල කටයුතු පිළිබඳ අධීක්ෂණය, මෙහෙයවීම හා උපදෙස් ලබා දීමට සාමාජිකයින් 18 කින් සැදුම්ලත් සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල නමින් කමිටුවක් ජාතික මට්ටමින් රැස් වේ. ප්‍රජාමූල සංවිධාන පිහිටුවා, ශක්තිමත් කොට, ප්‍රජාව බලගන්වා, ඔවුන් ආර්ථික, සාමාජයීය හා අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කරමින්, ප්‍රජා මූල බැංකු හා ජීවනෝපාය වැඩසටහන් සඳහා යොමු කිරීමේ අරමුණින්, 2025 වර්ෂය වන විට ප්‍රජාමූල සංවිධාන 29,389 ක් ද ප්‍රාදේශීය සංවිධාන 337 ක් සහ දිස්ත්‍රික් කමිටු 25ක් ක්‍රියාත්මකව පවතී.

1.4. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා එහි කාර්ය භාරයන්

අ.අ.	අංශය	කාර්යභාරය
1	අධ්‍යක්ෂ ජනරාල් අංශය	ප්‍රතිපත්ති සැලසුම්කරණය, ප්‍රගති සමාලෝචනය, සම්බන්ධීකරණය , අධීක්ෂණය හා මෙහෙය වීම
2	පාලන අංශය	මානව සම්පත් බදවා ගැනීම මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය
3	ආයතන අංශය	උසස් කිරීම හා පෞද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම
4	විමර්ශන අංශය	සේවක විනයානුකූල කටයුතු හා විමර්ශන කටයුතු සිදු කිරීම
5	විශ්‍රාම වැටුප් ඒකකය	සේවක විශ්‍රාම ලිපිගොනු සම්බන්ධ කටයුතු
6	ගිණුම් අංශය	රාජ්‍ය මුදල් හා ගිණුම් කටයුතු පාලනය කිරීම හා දෙපාර්තමේන්තුව සතු වත්කම් පවරා ගැනීම හා කළමනාකරණය කිරීම
7	ජීවනෝපාය සංවර්ධන අංශය	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය, ග්‍රාමීය හා ප්‍රජා මට්ටමින් ක්‍රියාත්මක කිරීම
8	ක්ෂුද්‍ර මූල්‍ය අංශය	ක්ෂුද්‍ර මූල්‍ය ණය නිකුත් කිරීම, ඉතුරුම් හා ආයෝජන ප්‍රවර්ධනය, බැංකු හා බැංකු සමිති අධීක්ෂණය
9	ව්‍යවසාය සංවර්ධන අංශය	ව්‍යවසායකත්ව සංවර්ධනය හා අලෙවි සංවර්ධනය සඳහා ප්‍රාදේශීය, ග්‍රාමීය හා ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
10	සමාජ සංවර්ධන හා පරිසර අංශය	පරිසර හා සමාජ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
11	සැලසුම් හා මෙහෙයුම් අංශය	වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම්කරණය, ප්‍රගති සමාලෝචනය, පසුවිපරම් කිරීම, අධීක්ෂණය, වාර්තා කිරීම හා පර්යේෂණ කටයුතු සඳහා සහාය වීම
12	ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා අංශය	ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටු පිහිටුවීම හා පවත්වාගෙන යාම හා ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
13	අභ්‍යන්තර විගණන අංශය	සමෘද්ධි පනත හා පොදු උපදෙස් අනුව විගණන කටයුතු පවත්වාගෙනයාම හා කළමනාකරණය
14	තොරතුරු තාක්ෂණ අංශය	තොරතුරු තාක්ෂණ කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය
15	මාධ්‍ය අංශය	මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
16	මානව සම්පත් සංවර්ධන අංශය	නිලධාරීන්ගේ (මානව සම්පත්) ධාරිතා සංවර්ධනය කිරීම
17	සමාජ සුබසාධන හා සමාජ ආරක්ෂණ අංශය	රජයේ සහනාධාර හා සමාජ ආරක්ෂණ අරමුදලේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
18	විශේෂ ව්‍යාපෘති අංශය	ලෝක බැංකු ණය වැඩසටහන යටතේ සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
19	වත්කම් කළමනාකරණ අංශය	වත්කම් පවරා ගැනීම සහ ඊට අදාළව සියලු ආයතන සම්බන්ධීකරණය කරමින් ගැටලු නිරාකරණය කිරීම
20	නීති අංශය	නීති උපදෙස් ලබාදීම හා නෛතික කටයුතු ක්‍රියාත්මක කිරීම
21	ප්‍රසම්පාදන කළමනාකරණ අංශය	ආයතනයට අවශ්‍ය භාණ්ඩ, සේවා හා වැඩ කාර්යක්ෂමව විනිවිදභාවයෙන් සහ නීතිමය ක්‍රමවේද අනුව ලබා ගැනීම
22	අභ්‍යන්තර කටයුතු ඒකකය	දෙපාර්තමේන්තුව තුළ දූෂණය තුරන් කිරීම හා සුපිලිපන් සංස්කෘතියක් ඇති කරලීමේ රජයේ වැඩපිළිවෙලට සහාය වීම.


Organizational Chart – National Level:
Department of Samurdhi Development
HON. MINISTER
SECRETARY
NATIONAL COUNCIL
DIRECTOR GENERAL
BANK MANAGEMENT BOARD
ADDITIONAL DIRECTOR GENERAL Admin & Establishment (SLAS)
ADDITIONAL DIRECTOR GENERAL (EMPOWERMENT)
ADDITIONAL DIRECTOR GENERAL (PLANNING & MONITORING)
CFO
ADDITIONAL DIRECTOR GENERAL (Micro Finance & CBO) (Department)
Chief Internal Auditor - 01 SLAcS.
Director (Admin.) SLAS
Director (Establishment) SLAS
Director (Investigation)
Director (Training)
Director (Land)
Director (Legal) SLPS
Director (Livelihood) SLPS
Director (Marketing) Department
Director (Social Security & Welfare) Department
Director (Micro Finance) Department
Director (CBO) Department
Chief Accountant SLAcS
Internal Auditor- 02
Senior Internal Audit Officers
Internal Audit Officers
AO 01
Media Officer
Driver
SSM SM
SDO
CMA
MA
FA -03
Accountant
KKS

පරිච්ඡේදය - 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. දෙපාර්තමේන්තුවේ නිල ව්‍යුහය, කාර්යභාරය හා වැඩසටහන් ප්‍රගතිය

2.1.1 අධ්‍යක්ෂ ජනරාල් අංශය

ප්‍රධාන කාර්යභාරය

- **ප්‍රතිපත්ති සහ සැලසුම්කරණය**
  දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට සහ උපායමාර්ගික තීරණ ගැනීමට අවශ්‍ය මගපෙන්වීම

- **අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචනය**
  අංශ මට්ටමේ ඉලක්ක සපුරා ගැනීම නිරීක්ෂණය කිරීම සහ කාර්යසාධනය ඇගයීම

- **අංශ අතර අන්තර් සම්බන්ධීකරණය**
  සංවර්ධන, පරිපාලන සහ ක්ෂුද්‍ර මූල්‍ය, ආදී සියලුම අංශ අතර මනා සන්නිවේදනයක් සහ සහයෝගීතාවයක් පවත්වා ගනිමින් කාර්යක්ෂමව සහ නිවැරදිව සේවය සැපයීම.

- **නියාමනය සහ උපදෙස් ලබා දීම**
  චක්‍රලේඛ නිකුත් කිරීම හරහා අංශ වල ක්‍රියාකාරිත්වය නීත්‍යානුකූලව විධිමත් කිරීම.

- **බාහිර සබඳතා කළමනාකරණය**
  අමාත්‍යාංශය සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් දෙපාර්තමේන්තුවට අවශ්‍ය පහසුකම් සලසා දීම.

2.1.2. පාලන අංශය

පාලන අංශයේ කාර්යභාරය

පාලන, ආයතන, විමර්ශන අංශවලට හා විශ්‍රාම වැටුප් ඒකකයට අදාළ කටයුතු සිදු කරනු ලබයි. පරිපාලනයේ දී මුහුණ දෙනු ලබන එදිනෙදා කටයුතු සහ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම ද මෙම අංශය යටතේ ඉටු කෙරෙන ප්‍රධාන රාජකාරි වේ.

ප්‍රධාන අරමුණු

- බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම, විනය පවත්වාගෙන යාම, දෛනික රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ආයතනයේ යහපැවැත්ම තහවුරු කිරීම.
- කාර්යාල පිරි සැකැස්ම සකස් කිරීම හා කාර්යාල සංවිධාන ව්‍යුහය සකස් කිරීම.

දෛනික රාජකාරි

- දෛනික තැපෑල පිළිබඳ කටයුතු කිරීම.
- අංශවල හා අංශ ගත සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.

- සේවක මණ්ඩල ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම.
- කාර්ය මණ්ඩලයේ සියලු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව, පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම හා නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ සියලු රාජකාරී සිදු කිරීම.
- ප්‍රවාහන ඒකකය කළමනාකරණය කිරීම.
- සේවක වැටුප්, දීමනා හා ගමන් වියදම් හා සියලුම ගෙවීම් සම්බන්ධ බිල්පත් ගෙවීම් කිරීමට අදාළ කටයුතු.
- කාර්යක්ෂමතා කඩඉම් විභාග, තරඟ විභාග හා උසස්වීමේ විභාග සංවිධානය කිරීම.
- නිලධාරීන් අනුයුක්ත කිරීම සම්බන්ධ සංඛ්‍යා ලේඛන වාර්තා නඩත්තු කිරීම.
- අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු කටයුතු.
- නිලධාරින් හා සම්බන්ධ විනය පරිපාලන කටයුතු.

විශේෂ පැවරුම්

- පාර්ලිමේන්තු ප්‍රශ්නවලට අදාළ පිළිතුරු ලබාදීම හා අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණය.
- මහජන පෙත්සම් කාරක සභා රාජකාරී කටයුතු.
- පාලන අංශයට අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු සැකසීම හා සම්බන්ධීකරණය.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම්වලින් පැන නඟින කරුණු පිළිබඳව කටයුතු කිරීම හා ඒ පිළිබඳව අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම.
- කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අනෙකුත් උසස්වීම් විභාග පැවැත්වීම/සන්නිවේදන කාර්ය සපුරාලීම.
- පවතින පුරප්පාඩු පිළිබඳ සලකා බලා නව නිලධාරීන් බඳවා ගැනීම.
- තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ තොරතුරු ලබා දීම.
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කෙටුම්පත් සහ මානව හිමිකම් රාජකාරී කටයුතු.
- දෙපාර්තමේන්තුවේ විනය පරීක්ෂණවලට අදාළ මු.රෙ.104 සම්බන්ධ සියලුම රාජකාරී

2.1.3. ආයතන අංශය

අංශය පිළිබඳව හැඳින්වීම

දිස්ත්‍රික් කාර්යාලවල සේවයේ නියුතු සමෘද්ධි කළමනාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 25,000කට ආසන්න පිරිසකගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම.

සිදු කරනු ලබන කාර්යයන්

i. නිලධාරීන්ගේ පත්වීම් ලිපි නිකුත් කිරීම, සේවය ස්ථීර කිරීම, ප්‍රතිඵල සනාථ කර ගැනීම, ශ්‍රේණි උසස්වීම් ලබාදීම් හා විශ්‍රාම ගැන්වීම් කටයුතු ඉටු කිරීම

ii. දිස්ත්‍රික් කාර්යාලවල සේවය කරන ඉහත නිලධාරීන් දෙපිරිසගේම නිවාඩු අනුමත කිරීම් (හදිසි අනතුරු නිවාඩු, ඉකුත් නිවාඩු, මැතිවරණ නිවාඩු, දේශීය නිවාඩු හා විදේශීය නිවාඩු)

iii. සේවය හැරගිය නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් අභියාචනා කමිටු වෙත යොමු කර නැවත සේවයේ පිහිටුවීම

iv. දිස්ත්‍රික් කාර්යාල වල පවතින පුරප්පාඩු සැලකිල්ලට ගෙන රාජකාරී ආවරණය කිරීම හා වැඩබැලීමේ පත්වීම් නිකුත් කිරීම

v. ඇමති කාර්යය මණ්ඩලයට, පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්යය මණ්ඩලයට හා විවිධ ආයතන වලට නිලධාරීන් මුදාහැරීම්, අනුයුක්ත කිරීම් හා නිදහස් කිරීමේ කටයුතු

vi. දිස්ත්‍රික් කාර්යාලවල සේවය කරන සමෘද්ධි කළමනාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් ප්‍රධාන කාර්යාලයට පැමිණ ඉදිරිපත් කරන විවිධ ගැටලු වලට විසඳුම් ලබාදීම හා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම

01. 2025 **වර්ෂයට ප්‍රගතිය**

ඉටු කළ කාර්යයන්	සමෘද්ධි කළමණාකරු	සමෘද්ධි සංවර්ධන නිලධාරී
අන්තර්ග්‍රහණ ලිපි නිකුත් කිරීම්	-	134
පරිවාස කාලයෙන් පසු සේවය ස්ථීර කිරීම්	-	52
පරීක්ෂණ කාලයෙන් පසු /සුපරීක්ෂණ කාලයෙන් පසු සේවය ස්ථීර කිරීම්	80	436
ශ්‍රේණි උසස්වීම් ලබා දීම	116	828
විශ්‍රාම ගැන්වීම	181	844
රාජකාරී ආවරණ පත්වීම් ලබා දීම	නැත	122
වැඩබැලීමේ පත්වීම් ලබා දීම	66	-
නැවත සේවයේ පිහිටුවීම් (අභියාචනා කමිටු ඉදිරිපත් කර)	-	23
සේවයෙන් මුදාහැරීම්	-	65
විදේශ නිවාඩු අනුමත කිරීම්	45	185

2.1.4. විමර්ශන අංශය

අරමුණු

1. නිලධාරීන් විසින් සිදු කරන විෂමාචාරයන් විමර්ශනය කර, විනය දඬුවම් පැමිණවීම මගින් ඔවුන් නිසි මගට ගැනීමට කටයුතු කිරීම.
2. දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය සේවයේ කීර්ති නාමය ආරක්ෂා කිරීම.
3. දෙපාර්තමේන්තු සේවකයින් තුළ විනය පවත්වාගෙන යාම සහ මූල්‍ය විනය පවත්වාගෙන යාම සහතික කිරීම.
4. වංචා හා අක්‍රමිකතා වැලැක්වීම සඳහා අවශ්‍ය යෝජනා / නිර්දේශ ඉදිරිපත් කිරීම.

අංශයේ කාර්යභාරය

- ලැබෙන පැමිණිලි අනුව මූලික විමර්ශන පැවැත්වීම.
- අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන විශේෂ විගණන පරීක්ෂණ සම්බන්ධ ඉදිරි විනය ක්‍රියාමාර්ග සිදු කිරීම.
- නිදහසට කරුණු විමසීම හා චෝදනා පත්‍ර නිකුත් කිරීම.
- විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම.
- විනය නියෝග නිකුත් කිරීම.
- මාණ්ඩලික නිලධාරීන්ට අදාළ චෝදනා පත්‍ර කෙටුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.
- විනය නියෝගවලට එරෙහි අභියාචනා සඳහා රාජ්‍යසේවා කොමිෂන් සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීම.
- ජනාධිපති විමර්ශන අංශය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව හා පාර්ලිමේන්තු පෙත්සම්කාරක සභාව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු.

2025 වර්ෂයේදී සිදු කළ කාර්යයන්හි සංක්ෂිප්ත වාර්තාව

මූලික විමර්ශන රාජකාරී සිදු කරනු ලබන සංවර්ධන නිලධාරීන් සඳහා 2025/08/13 දින සිට 2025/08/15 දින දක්වා නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේදී මූලික විමර්ශන පැවැත්වීම හා චෝදනා පත්‍ර කෙටුම්පත් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුවක් සංවිධානය කරන ලදී. ඒ සඳහා දැනට මූලික විමර්ශන රාජකාරී සිදු කරනු ලබන නිලධාරීන් 30 ක් පමණ සහභාගී වී ඇත.

2025.01.01 සිට 2025.12.31 දක්වා සාරාංශය

විමර්ශන අංශය

අ. අං.	කාරණය	2024.12.31 දිනට	2025												
			ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	2025 වර්ෂයේ එකතුව
1	මූලික විමර්ශන සඳහා පත් කරන ලද සංඛ්‍යාව	4	3	7	6	2	2	1	2	12	1	37	0	0	77
2	I මූලික විමර්ශන වාර්තා සංඛ්‍යාව	10	12	4	9	4	3	5	13	8	0	11	3	6	79
	II විශේෂ විගණන පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව	7	2	2	10	0	1	0	7	0	1	5	0	2	35
3	අනිවාර්ය නිවාඩු/ස්ථාන මාරුවීම්/වැඩ තහනම් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව	5	3	9	17	9	6	4	2	0	1	0	0	1	56
4	විනය පරීක්ෂණවලට යටත්ව නැවත සේවයේ පිහිටුවීම	1	2	1	0	2	1	0	1	0	0	1	0	0	9
5	වැඩ තහනම් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවන ලද වාර්තා සංඛ්‍යාව	2	2	0	2	1	0	3	0	0	6	0	1	1	16
6	(a) නිදහසට කරුණු විමසීම් සංඛ්‍යාව	2	3	5	10	9	8	0	8	3	5	5	0	5	58
7	නිදහසට කරුණුවලට අදාළව තීරණ දැනුම් දුන් සංඛ්‍යාව	4	10	4	5	2	2	0	8	3	1	6	0	0	45
8	(a) නිකුත් කරන ලද චෝදනාපත්‍ර සංඛ්‍යාව	11	4	15	14	16	10	6	21	18	8	16	5	7	139
	(b)රා.සේ.කොා.සභාව /අමාත්‍යාංශය වෙත යවන ලද චෝදනාපත්‍ර කෙටුම්පත් සංඛ්‍යාව	0	2	0	6	0	0	4	1	0	0	0	0	1	13
9	සංශෝධනය කරන ලද චෝදනා පත්‍ර සංඛ්‍යාව	4	1	1	5	1	2	3	5	4	4	5	0	1	35
10	(a)පත් කරන ලද විනිශ්චය සභා සංඛ්‍යාව	3	10	6	4	10	3	1	4	6	3	5	5	3	55

අ. අං.	කාරණය	2024.12.31 දිනට	2025												
			ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	2025 වර්ෂයේ එකතුව
	(b) පරීක්ෂණ මණ්ඩල/වෙත අදාළ ලේඛන ලබා දීම, පැමිණිල්ල මෙහෙයවන නිලධාරි/චූදිත	2	1	6	1	1	1	4	5	2	0	1	3	2	24
11	ලැබුණු පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව	2	1	0	3	1	0	0	2	2	0	3	0	1	14
12	(a) ලබා දුන් විනය නියෝග සංඛ්‍යාව	22	12	14	15	31	5	5	10	2	8	9	12	8	133
	(b)අමාත්‍යාංශය/රා.සේ.කොා.සභාව වෙත නිර්දේශ කර යවන ලද විනය නියෝග කෙටුම්පත් සංඛ්‍යාව	0	2	3	0	0	2	0	1	0	0	0	0	0	8
13	පත්වීම් අවසන් කළ/සේවයෙන් පහ කළ නිලධාරීන් සංඛ්‍යාව	2	0	3	3	5	0	0	0	0	0	0	0	0	13
14	අභියාචනා සඳහා රා.සේ.කොා.සභාව වෙත ඉදිරිපත් කළ පරිශිෂ්ඨ වාර්තා සංඛ්‍යාව	3	4	1	2	0	4	1	6	5	3	4	1	1	33
15	අභියාචනා තීරණ දැනුම් දුන් සංඛ්‍යාව	4	1	1	0	4	0	1	0	1	1	2	3	0	15
16	පසුගිය මාසය අවසානයේ ක්‍රියා කිරීමට ඇති ඉතිරි විනය ගොනු සංඛ්‍යාව	472	450	448	450	439	421	423	421	428	446	444	441	447	
17	අලුතින් ආරම්භ කරන ලද විනය ගොනු සංඛ්‍යාව	27	24	25	18	19	8	8	19	25	8	28	32	10	209
18	මාසය තුළ නිම කරන ලද ගොනු සංඛ්‍යාව	43	28	20	26	36	11	6	17	7	10	20	27	15	224
19	**තවදුරටත් ක්‍රියා කිරීමට ඉතිරි ගොනු සංඛ්‍යාව**	**454**	**445**	**448**	**443**	**424**	**422**	**425**	**424**	**446**	**444**	**452**	**446**	**442**	

2.1.5. විශ්‍රාම වැටුප් ඒකකය

- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරින්ගෙන් මුල්සේවා හා නව සේවා මනාපය පල කරමින් අන්තර්ග්‍රහණය වූ නිලධාරින් වෙත විශ්‍රාම වැටුප් හිමිකම් ප්‍රධානය කිරීම විශ්‍රාම වැටුප් ඒකකය මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යය වේ.

- මේ අනුව 2019 වර්ෂයේ අගෝස්තු මස 01 වන දින සිට දෙපාර්තමේන්තුවේ පාලන අංශය යටතේ මෙම ඒකකය ස්ථාපිත කරන ලදී. එතැන් සිට මේ දක්වා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ හා අමතර වශයෙන් ලබාදී ඇති උපදෙස්වලට අනුගත වෙමින් සමෘද්ධි දෙපාර්තමේන්තුවේ නිලධාරින් වෙත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ පිළිගැන්වීම ක්‍රියාත්මක කරන ලදී.

- මෙහිදී මූලික වශයෙන් පහත ගොනු සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ.

  - විශ්‍රාමික නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් ගොනු**(PD3)**
  - සේවය කරමින් සිටියදී මියගිය නිලධාරින්ගේ මරණ පාරිතෝෂික හා වැන්දඹු අනත්දරු ගොනු**(PD4** හා **PD5)**
  - වැන්දඹු අනත්දරු දායක මුදල් ආපසු ලබාගැනීමේ ලිපි ගොනු
  - සංශෝධිත විශ්‍රාම වැටුප් ගොනු **(PD6)**

2025 වසරේ අත්කරගත් වෙනත් ප්‍රගතීන්

- දිස්ත්‍රික් විශ්‍රාම වැටුප් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් දෙකක් පැවැත්වීම
- රත්නපුර දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම .
- හිඟ විශ්‍රාම වැටුප් ලබා ගැනීමට නොහැකිව සිටි විශ්‍රාමික නිලධාරීන් 1148 දෙනෙකු සඳහා 4% පොලී මුදල අයකර ගැනීමට සකස්කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීම.
- වයස අවුරුදු 55න් ඔබ්බට සේවය කළ අඩු සුදුසුකම් සහිත නිලධාරීන් 14දෙනා සඳහා කැබිනට් පත්‍රිකාවක් අමාත්‍යාංශයට යැවීම.
- අධිකාරී සේවා කාලයට අදාළව වැන්දඹු අනත්දරු දායක මුදල් නොගෙවූ නිලධාරීන්ගේ තොරතුරු ඒකරාශි කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යැවීම.

විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රගතිය 2025.12.31 දිනට

අනු අංකය	කාරණය	විශ්‍රාම ගිය සංඛ්‍යාව	මිය ගිය සංඛ්‍යාව	එකතුව
1	විශ්‍රාම ගිය සංඛ්‍යාව	4384	645	5029
2	නිලධාරීන් විසින් අවශ්‍ය තොරතුරු ලබානොදීම මත ඉදිරි කටයුතු සිදුකිරීමට නොහැකි ගොනු සංඛ්‍යාව	25	41	66
3	විශ්‍රාම වැටුප් ගෙවිය යුතු මුළු සංඛ්‍යාව	4359	604	4963
4*	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කළ සංඛ්‍යාව	3552	431	3983
5	විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා තවදුරටත් සමෘද්ධි දෙපාර්තමේන්තුවේ ඉතිරි සංඛ්‍යාව	807	173	980
4 *	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කළ සංඛ්‍යාව	3552	431	3983
	2025.12.31 දිනට සමස්ත ගෙවීම් එකතුව	3132	393	3525
	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ගෙවීමට ඉතිරි	420	38	458

*නිලධාරීන් විසින් අවශ්‍ය තොරතුරු ලබානොදීම මත ඉදිරි කටයුතු සිදුකිරීමට නොහැකි ගොනු 66 ඇතුළත් නොවේ.සමස්ථ ගොනු සංඛ්‍යාව 1046කි. (980+66)

2.1.6. ගිණුම් අංශය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය වන විධිමත් මූල්‍ය කළමනාකරණයක් පවත්වා ගැනීම ගිණුම් හා මූල්‍ය අංශයේ කාර්යභාරය වේ. ඒ සඳහා ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ ප්‍රධාන ගණකාධිකාරී, දෙපාර්තමේන්තු ගණකාධිකාරී සහ දිස්ත්‍රික් කාර්යාල 25 ක් සඳහා දිස්ත්‍රික් ගණකාධිකාරීවරු 25 දෙනෙකු සහ සහාය කාර්යමණ්ඩලයක සේවය ලබා ගැනේ.

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ක්‍රියාත්මක වන ප්‍රධාන අංශ සහ දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය කාර්යාල, පුහුණු මධ්‍යස්ථාන සහ සංචාරක බංගලා සඳහා වන මූල්‍ය කළමනාකරණයට අදාළ පහත කාර්යයන් ඉටු කරනු ලැබේ.

- ❖ දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා අවශ්‍ය වාර්ෂික ප්‍රතිපාදන සලසා ගැනීම සහ නිලධාරීන්ගේ ණය අවශ්‍යතා සඳහා අත්තිකාරම් බී ගිණුමේ සීමා නියම කර ගැනීම

- ❖ වාර්ෂික අග්‍රිම අවශ්‍යතාවය භාණ්ඩාගාරයට වාර්තා කිරීම, වාර්ෂික අග්‍රිම අවශ්‍යතාවය අග්‍රිම ලබාගැනීම, නිකුත් කිරීම සහ පාලනය

- ❖ ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයන් හි මාසික ගිණුම් සාරාංශ පිළියෙල කර ඒකාබද්ධ ගිණුම් සාරාංශය නියමිත දිනට භාණ්ඩාගාරයට යොමු කිරීම

- ❖ වාර්ෂික මූල්‍ය පාලන බලතල පැවරීම, නියාමනය සහ පාලනය

- ❖ වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ජාතික විගණන කාර්යාලයට යොමු කිරීම

- ❖ දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ අරමුදල් ආයෝජනය

- ❖ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලයන්හි නිල බැංකු ගිණුම් මෙහෙයවීම සහ අධීක්ෂණය

- ❖ ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරනු ලබන විගණන විමසුම් හා විගණකාධිපති වාර්තා සඳහා නිශ්චිත පිළිතුරු යොමු කිරීම, විගණන කළමනාකරණ කමිටු සමායෝජනය, තීරණ ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය ගිණුම් කාරක සභා විමසීම් සඳහා පිළිතුරු සැපයීම

- ❖ දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණය, ආරක්ෂාව, උපයෝජනය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කිරීම සහ ඒවායේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

2.1.7. ජීවනෝපාය සංවර්ධන අංශය

යැපුම් මානසිකත්වයෙන් මිදී, ස්වාධින පුරවැසි සමාජයක් ගොඩනැගීම සඳහා ප්‍රජාව සවිබලගැන්වීම අත්‍යවශ්‍ය කරුණකි. ප්‍රජාව තුළින් ගොඩනැගෙන ශක්තින් පදනම් කර ගනිමින් ප්‍රධාන ක්ෂේත්‍රයන් 05 ක් ඔස්සේ අඩු ආදායම්ලාභී ප්‍රජාව සවිබලගැන්වීමේ වගකීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. මෙමගින් රටේ සෑම පුරවැසියකුම ජාතික ආර්ථිකයේ අභිමානවත් කොටස්කරුවෙක් බවට පත් කිරීම මෙම වැඩසටහනෙහි පරමාර්ථයයි. ඒ වෙනුවෙන් දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය තුළ ආර්ථික, සාමාජීය, මානසික, සංස්කෘතික, නෛතික හා පාරිසරිකමය වශයෙන් සවිබලකරණය සඳහා ස්ථාපිතව ඇති ප්‍රධානතම අංශය වන්නේ ජීවනෝපාය සංවර්ධන අංශයයි.

ජීවනෝපාය සංවර්ධන අංශයේ මූලික වගකීම හා කාර්යභාරය වන්නේ සමෘද්ධි වැඩසටහන වටා ගොනුවී ඇති සමෘද්ධි, අස්වැසුම හා අඩු ආදායම්ලාභී පවුල් වල ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා දැනට ඔවුන් නියැලී සිටින , අලුතින් හඳුනාගත් ව්‍යාපෘති හඳුනාගෙන ඒවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍ය පහසුකම් සැපයීමයි.

ප්‍රජාව සවිබලගැන්වෙන ප්‍රධාන ක්ෂේත්‍රයන්

සවිබලගැන්වීම සඳහා හඳුනාගන්නා සෑම දිළිඳු පවුල් ඒකකයක්ම ප්‍රධාන ක්ෂේත්‍රයන් 05ක් ඔස්සේ නගා සිටුවීමට පියවර ගෙන ඇත.

1. ජීවනෝපාය සංවර්ධනය
2. මූල්‍ය අන්තර්කරණය
3. මනෝ සමාජීය බලගැන්වීම
4. සමාජ ආරක්ෂණය
5. පුහුණුව හා මගපෙන්වීම

දැනටමත් සමාජ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මගින් ලබා ගෙන, අදාළ දිස්ත්‍රික්ක වෙත ලබා දී ඇති ප්‍රාදේශීය කොට්ඨාසයන්හි ග්‍රාම නිලධාරී වසම් වල අස්වැසුමලාභී ප්‍රතිලාභී ලේඛන පදනම් කර ගෙන සමෘද්ධි චක්‍රලේඛ 2025/01 මගින් උපදෙස් ලබා දී ඇත.

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයෙන් ලබා ගත් ප්‍රතිලාභී ලේඛනයේ දුප්පත් හා අන්ත දුප්පත් කාණ්ඩ දෙකට අයත් පවුල් අතුරින් ඉලක්ක කණ්ඩායම තෝරා ගැනීමට අදාළ වසම් හි සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.

එක් පවුල් ඒකකයක් සඳහා හඳුනා ගනු ලබන ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට එක් පවුල් ඒකකයකට රුපියල් 50,000.00 ක සීමාවකට යටත් ව මූල්‍ය ප්‍රදානයක් ලබා දීමට ව්‍යාපෘති සංඛ්‍යාව පදනම් කර ගෙන ප්‍රතිපාදන වෙන් කර ඇත.

එම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් 2025 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් රුපියල් මිලියන 505.56 ක සැලසුම් සකස් කර තිබුණ ද, දිට්වා සුළිකුණාටුව හේතුවෙන් 2025.12.31 වනවිට දෙපාර්තමේන්තුවට සපුරා ගත හැකි වූ ඉලක්කය රුපියල් මිලියන 431.21ක් වූ අතර, එය ප්‍රතිශතයක් ලෙස 85% කි. මේ යටතේ දිවයිනේ සියලුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි සුදුසු ප්‍රතිලාභීන් නිශ්චිතවම හඳුනාගෙන කෘෂි, සත්ත්ව පාලන, ධීවර , කුඩා හා ප්‍රාථමික කර්මාන්ත ව්‍යාපෘති සහ අගය එකතුකළ නිෂ්පාදන යනාදි ක්ෂේත්‍රයන් යටතේ ව්‍යාපෘති හඳුනා ගන්නා ලදී.

එම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් **අරමුණු** කිහිපයක් සාක්ෂාත් කර ගන්නා ලදී.

1. ප්‍රතිලාභී පවුලේ මාසික ආදායම රුපියල් 30, 000/- ක් දක්වා ඉහළ නැංවීම
2. නිෂ්පාදනය සඳහා පවතින වෙළඳපල අවස්ථා පුළුල් කිරීම
3. කෘෂි, සත්ව පාලන හා ධිවර ව්‍යාපෘති දිරිමත් කිරීම තුළින් ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම
4. පරිසර හිතකාමී ජීවන රටාවන් තුළින් සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් බිහිකිරීම

ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් පවුල් ඒකක පදනම් කර ගෙන සිදු කරන පවුල් සංවර්ධන සැලැස්ම තුළින් මතුවන ජීවනෝපාය අවස්ථාවලින් වඩාත් උචිත ව්‍යාපෘතිය හඳුනා ගැනීම සිදුකරන ලද අතර, ඒ අනුව වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපෘති සමෘද්ධි කළමනාකරුගේ මහ පෙන්වීමෙන් ව්‍යාපෘති වාර්තා සකසා අදාළ රේඛීය ආයතන වල සහායද ඇතිව, ඉදිරි කටයුතු සඳහා සුදානම් කරනු ලැබීය.

ඒ අනුව 2025 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්මට අනුගත වෙමින් දිවයින පුරා සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි අස්වැසුම ප්‍රතිලාභී ලේඛන පදනම් කර ගෙන අස්වැසුම ප්‍රතිලාභීන් දුප්පත් හා අන්ත දුප්පත් යන කාණ්ඩ දෙකට අදාළ පවුල් වෙනුවෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මි. 505.56 ක මුදලක් ව්‍යාපෘතීන් සඳහා යොදවන ලද අතර, මෙම වසරේ ඉලක්කගත ප්‍රතිලාභී සංඛ්‍යාව 9,400 කි. ජීවනෝපාය අංශය සඳහා වෙන්ව ඇති එම සීමිත ප්‍රතිපාදන සීමාව තුළ, ඒ ඒ දිස්ත්‍රික්ක තුළ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව පාදක කර ගනිමින් ප්‍රතිපාදන වෙන්කර, වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රතිලාභීන් හඳුනා ගැනීම ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් සිදු කරන ලදී. එහිදි ,

1. අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන දුප්පත් හා අන්ත දුප්පත් යන කාණ්ඩ දෙකට අයත් ප්‍රතිලාභී පවුලක සාමාජිකයෙකු වීම
2. ව්‍යාපෘතිලාභියා ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට හැකි ඉහළ ශක්‍යතාවයක් සහිත පුද්ගලයකු වීම
3. කාන්තා මූලික ව්‍යවසායකයින් කෙරෙහි ප්‍රමුඛත්වයක් ලබා දීම
4. ව්‍යාපෘතිලාභියා හෝ පවුලේ සාමාජිකයකු ප්‍රජාමූල සංවිධානයේ සාමාජිකයකු වීම

ආදි කරුණු සලකා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදී.

ඉහත සඳහන් ව්‍යාපෘතීන් සඳහා රු.50,000/- ක සීමාවකට යටත්ව මූල්‍ය ප්‍රදානයක් සඳහා අරමුදල් ලබාදී ඇති අතර, අදාළ ඉලක්කයන් සපුරා ඇත.

- අස්වැසුමලාභීන් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන - භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් **(2025.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය)**

ව්‍යාපෘති වර්ගය	**නිම කරන ලද සංඛ්‍යාව**	**වියදම (රු.මි.)**	**ව්‍යාපෘතිගැන්වූ අස්වැසුම ප්‍රතිලාභීන් ගණන**
ස්වයංරැකියා (ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන්)	10,475	431.21	10,475
එකතුව	10,475	431.21	10,475

2025 වසර සඳහා ජීවනෝපාය අංශය සඳහා වෙන්කළ මූල්‍ය සීමාව තුළ ඉලක්කගත පිරිසට වඩා වැඩි ප්‍රතිලාභීන් පිරිසක් සඳහා ප්‍රතිලාභ ලබා දීමට හැකිවිය.

- සමෘද්ධිලාභීන් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන (සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලයේ අරමුදල්)

2025 සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී (දැනට අස්වැසුම සමාජ ප්‍රතිලාභ නොලබන පවුල්) ක්ෂුද්‍ර ව්‍යාපාර / ස්වයං රැකියා මගින් සවිබලගැන්වීම සඳහා තෝරා ගැනීම සියලු දිස්ත්‍රික්ක ආවරණය වන ආකාරයට සිදු කරන ලද අතර, මේ සඳහා සමෘද්ධි සංවර්ධන භාරකාර මණ්ඩලයේ අරමුදල් යොදා ගන්නා ලදී.

මෙමගින් දැනට අස්වැසුම සමාජ ප්‍රතිලාභ නොලබන අඩු ආදායම්ලාභී ප්‍රතිලාභීන් 12 දෙනාගෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙතින් ව්‍යාපාරික සැලසුම් සකස් කිරීමෙන් පසු, එමගින් එක් එක් ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාකරණය සිදු කොට එක් ප්‍රතිලාභියකු වෙත ලබා දෙන ලද උපරිම ප්‍රදානය රුපියල් 75,000/ ක් බැගින් ලබා දෙන ලදී.

- සමෘද්ධිලාභීන් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන - (සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලයේ අරමුදල්)

(2025.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය)

ව්‍යාපෘති වර්ගය	ප්‍රා.ලේ.කොා. ගණන	වියදම (රු.මි.)	ව්‍යාපෘති ගැන්වූ සමෘද්ධි ප්‍රතිලාභීන් ගණන
ස්වයංරැකියා (ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන්)	15	136.31	1,979
එකතුව	15	136.31	1,979

සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහන

සවිබලගැන්වීමේ කාර්යය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, 2016 වර්ෂයේ සිට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. මේ සඳහා තෝරා ගැනීමේදී සමෘද්ධි සහනාධාර ලැබූ ප්‍රතිලාභියකු වීම අනිවාර්යයෙන් සැලකූ අතර , දැනට අස්වැසුම ප්‍රතිලාභියෙකු වීම කෙරෙහිද වැඩි අවධානයක් යොමු කරන ලදී.

මෙම ව්‍යාපෘතින් සඳහා තෝරා ගන්නා ලද්දේ

- සමජාතිය නිෂ්පාදනයන් සිදු කරනු ලබන පවුල්
- අපනයන විභවයක් හෝ ආනයන ආදේශකයක් ලෙස සැලකිය හැකි නිෂ්පාදනයක්/ කර්මාන්තයක් / සේවාවක් පවතින ගම්මාන
- වෙළෙඳපල ඉල්ලුමක් සහිත පාරම්පරික නිෂ්පාදන තුළින් ගොඩනැගිය හැකි ගම්මාන

2025 වසර තුළ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලයේ අනුමැතියෙන් සමාජ ආරක්ෂණ අරමුදල් යොදා ගනිමින් දිස්ත්‍රික්ක 13 තුළ මෙම ආදර්ශ ගම්මාන 13 ක් ක්‍රියාත්මක කරන ලදී. මේ වන විට ප්‍රතිලාභීන් 321 ක් සඳහා වියදම් කර ඇති මුදල රු.මි.28.54කි. නිෂ්පාදන ආදර්ශ ගම්මාන ආරම්භ කිරීමෙන් පසුව, ව්‍යාපෘතිලාභීන්ට තම නිෂ්පාදන කටයුතු ස්වාධීනව අඛණ්ඩව කරගෙන යාහැකි ව්‍යාපෘතීන් සඳහා ප්‍රමුඛතාවයක් දී සලකන ලදී.

2025.12.31 ආදර්ශ ගම්මාන ප්‍රගතිය

ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක ගණන	ප්‍රා.ලේ. කොට්ඨාස ගණන	වියදම (රු.මි.)	ප්‍රතිලාභීන් ගණන	ආදර්ශ ගම්මාන ගණන
13	212	28.54	321	13

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතු බදු දේපළ සඳහා බදු රැස්කිරීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතු දේපළ වලින් බදු අයකර ගැනීම හා ගිවිසුම් ආශ්‍රිත කටයුතු ජීවනෝපාය අංශයේ කාර්යභාරයකි. එම ආයතන ලෙස පනිල්කන්ද තේ කර්මාන්ත ශාලාව, ගලගාව වත්ත තේ කර්මාන්ත ශාලාව, ජස්මින් වැලි තේ කර්මාන්ත ශාලාව, ලංකා ඔටෝ ලැන්ඩ් ඔලියගොඩවත්ත පවර් ප්ලාන්ට් යන ආයතන මගින් දෙපාර්තමේන්තුව වෙත 2025 වසර තුළදී වාර්ෂික බදු රු. මි. 3.9 ක් උපයා ගන්නා ලදී.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතු බදු දේපළ සඳහා බදු රැස්කිරීම

අ.අ.	ව්‍යාපෘතිය	විස්තරය	වාර්ෂික අදායම
1	පනිල්කන්ද තේ කර්මාන්ත ශාලාව, කොලොන්න, රත්නපුරය	අක්. 1 ක ඉඩම බදු දී ඇත.	683,437.50
2	ගලගාවවත්ත තේ කර්මාන්ත ශාලාව, මාතර	අක්.2.3 ක ඉඩම බදු දී ඇත.	622,333.06
3	ජස්මින්වැලි තේ කාර්මාන්ත ශාලාව, මාතර	අක්. 2 ක ඉඩම බදු දී ඇත.	817,818.59
4	ලංකා ඔටෝ ලැන්ඩ් පුද්. සමාගම රතලංකවත්ත, කඹුරුපිටිය, මාතර	අක්. 2.5 ක ඉඩම බදු දී ඇත.	237,456.51
5	ඔලිගොඩවත්ත පවර් ප්ලාන්ට් , මාතර	අක්. 50 ක ඉඩම බදු දී ඇත.	1,543,050.00
	එකතුව		**3,904,095.66**

ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ප්‍රතිපාදන යොදා ගනිමින් ක්‍රියාත්මක වන පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන

ආර්ථිකමය වශයෙන් පවුල් සවිබලගැන්වීමේ වගකීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරීමත් සමග ආසියානු සංවර්ධන බැංකුවේ මුල්‍ය හා තාක්ෂණික සහාය මත "ආර්ථික සුරක්ෂිතතාව හා ජීවනෝපාය හදිසි ප්‍රතිසාධන ව්‍යාපෘතිය" නමින් නියමු ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. එම ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා දිස්ත්‍රික්ක 13 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 64 ක් ආවරණය වන පරිදි ග්‍රාමනිලධාරී වසම් 400 ක ප්‍රතිලාභී පවුල් 12,800 ක් ඉලක්ක කර මෙම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

එම ව්‍යාපෘතිය ලෝකයේ රටවල් 80 කට වැඩි ප්‍රමාණයක ක්‍රියාත්මක කර, සාර්ථක අත්දැකීම් ලබාගෙන ඇති උපාධි ප්‍රවේශය (Graduation Approach) ක්‍රමවේදය මත ක්‍රියාත්මක කිරීමට

නියමිතය. එමගින් පවුල් ඒකකවල ආර්ථික , මූල්‍ය , මනෝ සමාජීය හා සමාජ ආරක්ෂණ යන ක්‍රම වේදය ඔස්සේ ප්‍රජා සවිබලගැන්වීම අපේක්ෂා කෙරේ.

මෙම වැඩසටහන 2024 ජුනි මස සිට 2026 ජුනි දක්වා වසර දෙකක කාලයකදී ක්‍රියාත්මක වන අතර, ඒ යටතේ 2025 වර්ෂය තුළ සිදු කළ ක්‍රියාකාරකම් හා ජයගත් ඉලක්කයන් පහත පරිදී වේ.
(2025.12.31 වන විට)

1. සුදුසු ප්‍රතිලාභී පවුල් හඳුනා ගැනීම 60% මට්ටමක පවතී
   (පවුල් 12,800 හඳුනාගෙන අවසන්ව ඇත)
2. ජාතික මට්ටමින් සහාය සේවා ආයතන දැනුවත් කිරීම අවසන් කර ඇත.
3. දිස්ත්‍රික් මට්ටමින් සහාය සේවා ආයතන දැනුවත් කොට අවසන් කර ඇත.
4. ජාතික මට්ටමින් ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම අවසන් කර ඇත.
5. ව්‍යාපෘතිය පිළිබඳව ව්‍යාපෘති කළමනාකරුවන් සහ මූලස්ථාන කළමනාකරුවන් දැනුවත් කිරීම අවසන්ව ඇත.
6. ප්‍රතිලාභීන් ව්‍යාපාර ගැන්වීමට සහ වෘත්තිය පුහුණු අවස්ථා ළඟා කර දීම රු150,000/- ක් බැගින් ප්‍රතිලාභීන් 7,966 ක් සඳහා රු.මිලි.1,179 ක මුදලක් ලබා දී ඇත.

2.1.8. සමෘද්ධි ක්ෂුද්‍රමූල්‍ය අංශය

හැඳින්වීම

1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පනත අනුව සමෘද්ධි ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 1996 දී සමෘද්ධි බැංකු සංගම් ආරම්භ කළ අතර, අඩු ආදායම්ලාභීන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කර, ඒ තුළින් ආයෝජන ශක්තිය වැඩි කිරීමටත් නිෂ්පාදන සහ සේවා වර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය (ණය පහසුකම්) සැපයීමටත්, අවිධිමත් ණය ගනුදෙනු අඩු කිරීමටත්, එමගින් ඔවුන් ණය බරින් මුදවාලමින් ලාභදායී ආයතනික රටාවක් ඇතිකිරීමේ අරමුණින්, ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය / මහා සංගමය, ප්‍රාදේශීය මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 335 ක් හා කලාප මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,097 ක් ක්‍රියාත්මක වේ.

2013 අංක 1 දරණ දිවිනැගුම පනතේ 33 (1), 33 (2), 33 (9) වගන්ති අනුව බැංකු හා බැංකු සමිති අධීක්ෂණය හා නියාමනය සඳහා සාමාජිකයින් 8 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් පිහිටුවා ඇත. එම කළමනාකරණ මණ්ඩලය විසින් බැංකු හා බැංකු සමිති වෙත කලින් කළ විධාන නිකුත් කරනු ලබයි.

අරමුණු

1. බැංකු පද්ධතිය සඳහා නව ණය ක්‍රම හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛ හා මෙහෙයුම් නියෝග නිකුත් කිරීම.
2. අනෙකුත් මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන්නා වූ මඟ පෙන්වීම්, උපදෙස් නිකුත් කිරීම.
3. තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් හා උපදෙස් නිකුත් කිරීම.
4. බැංකු අරමුදල් ආයෝජනය කිරීම හා ප්‍රාදේශීය මට්ටමින් උපදෙස් නිකුත් කිරීම.
5. ක්ෂුද්‍ර මූල්‍ය රක්ෂණ කටයුතු සිදු කිරීම.
6. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අවසාන ගිණුම් සඳහා ලබාදෙන විගණන වාර්තා අනුව අවසන් ගිණුම් සහතික කිරීම හා ලාභ විසර්ජනය සඳහා නියෝග ලබාදීම.
7. බැංකු සඳහා ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සැපයීම හා ණය විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.
8. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා ඉඩම් පවරා ගැනීම/ මිලට ගැනීම් කටයුතු සහ බැංකු ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අරමුදල් සැපයීම හා වත්කම් කළමනාකරණය.
9. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය රැස් කිරීමට සහාය වීම, කළමනාකරණ මණ්ඩලික පත්‍රිකා ඉදිරිපත් කිරීම හා එම නියෝග ක්‍රියාත්මක කිරීම.
10. සියලුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අධීක්ෂණ, ප්‍රගති පාලනය, පසු විපරම් කිරීම.
11. සමෘද්ධි ප්‍රතිලාභීන්, ප්‍රජාමූල බැංකු සමිති හරහා පිළිගත් ආයතන හා සංවිධාන මගින් දියත් කරන ව්‍යාපෘති සමඟ සම්බන්ධීකරණය කිරීම.
12. ජීවනෝපාය හා අලෙවි අංශ ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල නිර්මාණශීලී දායකත්වය ලබාදීමට කටයුතු කිරීම.
13. සමෘද්ධි පනත අනුව (34 වගන්තිය) ස්ථාපිත බැංකු මහා සංගමයේ කටයුතු සඳහා සහාය වීම.

14. සමෘද්ධි බැංකු, සමෘද්ධි බැංකු සමිති, මහා සංගමය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය පරිගණක ජාලගත කිරීමට සහාය වීම.

15. සමෘද්ධි බැංකුවල , සමෘද්ධි බැංකු සමිතිවල නිලධාරීන් හා ප්‍රජා නායකයින් පුහුණු කිරීමට පියවර ගැනීම.

16. දිළිඳු ප්‍රජාව සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා අවශ්‍ය මූල්‍ය සහයෝගය ලබා දීමට වැඩසටහන් හඳුන්වා දීම.

බැංකු සාමාජිකත්වය හා කොටස් ප්‍රාග්ධන ප්‍රගතිය

සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් රු.500/- ක කොටසක් මිලදී ගැනීමෙන්, ඔවුනට සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ සාමාජිකත්වය හිමිවේ. ඒ තුළින් ඔවුන් බැංකුවේ කොටස්කරුවන් බවට පත්වේ.


සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකත්ව ප්‍රගතිය - (2021 - 2025)

වර්ෂය	ගැහැණු	පිරිමි	එකතුව	පසුගිය වසරට සාපේක්ෂ වර්ධනය	වර්ධනය අනුපාතය %
2021	2,791,244	1,300,942	4,092,186	-331	-0.008
2022	2,811,900	1,303,200	4,115,100	22,914	0.56
2023	2,854,351	1,312,790	4,167,141	52,041	1.25
2024	2,790,914	1,254,246	4,045,160	-121,981	-3.01
2025	2,827,355	1,263,288	4,090,643	45,483	1.11

බැංකු තැන්පතු වැඩසටහන

තැන්පතු (සාමාජික, සමාජික නොවන, සමූහ, ළමා සහ දිරිය මාතා, සිසුරක, ධන ශක්ති)
(2021- 2025)

වර්ෂය	ගිණුම් සංඛ්‍යාව	ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය	මුදල (රු.මි)	මුදලේ වර්ධනය (රු.මි)
2021	8,538,191	(177,512)	72,835.00	2,497.00
2022	9,463,470	925,279	93,765.53	20,930.55
2023	7,531,371	1.932,099	75,508.55	-18,256.98
2024	6,751,107	-780,264	67,179.52	-8,329.03
2025	5,119,196	-1,631,911	62,213.85	-4965.67



ප්‍රජාමූල බැංකු ණය වැඩසටහන

- සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් හඳුනාගෙන, ස්වශක්තිය මගින් දුගී බවින් මිදීමට අවශ්‍ය පරිසරය ගොඩනැංවීමට අවශ්‍ය මූල්‍යාකරණ පහසුකම් සපයාදීම ප්‍රජාමූල බැංකු ණය ක්‍රමය යටතේ සිදුවේ.

- සාමාජිකයින්ගේ ප්‍රාග්ධන අරමුදල් හා ක්ෂණික මුල්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා වූ විශේෂ ණය වැඩසටහන් කිහිපයක් හඳුන්වා දී දියත් කර ඇත.

- ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා රු.25,000 සිට රු.2,000,000 දක්වා විවිධ ණය යෝජනා ක්‍රම යටතේ සමෘද්ධි බැංකු මගින් ණය නිකුත් කෙරේ. ඒ අනුව ජීවනෝපාය සංවර්ධන, වගා, වෘත්තිය පුහුණු වැනි ක්ෂේත්‍රයන් සඳහා මෙන්ම ක්ෂණික ණය අවශ්‍යතා වෙනුවෙන් ද ණය නිකුත් කෙරේ.

- නිවාස, පාරිභෝගික, ආපදා වැනි අවශ්‍යතා වෙනුවෙන් බැංකු ණය පහසුකම් ක්‍රියාත්මක වේ. මේ සඳහා රු.25,000 සිට රු. 500,000 දක්වා උපරිම ණය නිකුත් කෙරේ.

- සමෘද්ධි බැංකු ණය වැඩසටහන මගින් සාර්ථක වූ ව්‍යවසායකයින්ගේ ප්‍රාග්ධන මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට රු. 2,000,000 සිට රු.5,000,000 දක්වා ණය සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති මගින් "ඉසුර" සහ නව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය යෝජනා ක්‍රමය යටතේ ණය නිකුත් කෙරේ.


- ක්ෂණික මුල්‍ය අවශ්‍යතාවලදී ගිනි පොලීකරුවන්ගේ ග්‍රහනයෙන් මිදී ඉතා පහසුවෙන් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට පාරිභෝගික, ආපදා, ස්වශක්ති, සමෘද්ධි අරුණළු, සමෘද්ධි මිතුරු ණය යෝජනා ක්‍රම තුළින් සමාජිකයින් සඳහා සහනයක් දී ඇත.

- 2025 වසර තුළ සාමාජිකයින් 12,925,579 ක් සඳහා රු.මී. 593,040.26 ක මුදලක් සමෘද්ධි බැංකු ණය ලෙස ලබා දී ඇත.

- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහනට සමගාමීව සවිබල ණය හා රන්පත ණය හඳුන්වා දී ඇති අතර, 2025 වසර අවසන් වන විට සවිබල ණය 1994 හා රන්පත ණය 1548 වශයෙන් මුලු ණය 3542 නිකුත් කර ඇත. ඒ සඳහා රු.මී.641.54 ක් මුදල් ලබා දී ඇත.

ණය නිකුත් කිරීම (2021 - 2025)

වර්ෂය	සංඛ්‍යාව (සමුච්චිත)	සමුච්චිත මුදාහල ණය මුදල (රු.මි.)	වසර තුළ ණය නිකුත් කිරීම (රු.මි)
2021	11,669,343	394,546.41	37,049.71
2022	11,959,271	424,906.65	30,360.24
2023	12,323,922	465,684.82	40,778.17
2024	12,608,212	519,881.86	54,194.04
2025	12,925,579	593,040.26	73,158.40




ණය වර්ගීකරණය 2025.12.31 දිනට සමුච්චිත මුදාහල ණය

	ණය වර්ගය	මුදල (රු.මි)
1	වගා	24,162.57
2	පාරිභෝගික	25,253.13
3	ස්වශක්ති	15,703.27
4	ආපදා	2,473.79
5	ජීවනෝපාය චක්‍රීය	16,639.79
6	ජීවනෝපාය සංවර්ධන	216,507.82
7	සමෘද්ධි සම්පත	85,486.99
8	හදිසි ව්‍යාපාරික ණය	2,091.70
9	දිවිනැගුම අරුණළු	6,428.72
10	රන් ප්‍රදීප	26.22
11	සේවක පාරිභෝගික ණය	2,356.28
12	සහන පියවර	5,434.85
13	සමෘද්ධි අභිමාන	734.00
14	උත්සව අත්තිකාරම් ණය	684.88
15	නව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය	7,829.65

	ණය වර්ගය	මුදල (රු.මි)
16	සමෘද්ධි මිතුරු ණය	381.41
17	සමෘද්ධි රන්පත ණය	621.16
18	තරුණ ව්‍යවසාය ණය	48,097.00
19	සමෘද්ධි ලක්ජය ණය	12,654.22
20	සමෘද්ධි ලක් වාසනා ණය	7,432.83
21	සමෘද්ධි ලක්සර ණය	6,747.96
22	සමෘද්ධි සවිබල ණය	252.50
එකතුව		**488,000.74**

ප්‍රස්ථාර සටහන - ණය වර්ගීකරණය




ප්‍රජාමූල බැංකු අතිරික්ත අරමුදල් ආයෝජනය (ස්ථීර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්)

බැංකුවල වත්කම්වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් ණය ඉල්ලුම්කරුවන්ට ණය මුදා හැරීමෙන් අනතුරුව අතිරික්ත අරමුදල් ප්‍රජාමූල බැංකු සමිති හරහා භාණ්ඩාගාර චක්‍රලේඛන ප්‍රකාරව රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජනය කිරීමට අවසර ලබාදී ඇත. මේ මගින් ප්‍රජාමූල බැංකු සමිති මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමද අරමුණ වේ.

සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල අතිරික්ත මුදල් ආයෝජනය කිරීම. (2021 - 2025)

වර්ෂය	මුදල(රු.මි)	වර්ධනය(රු.මි)	වර්ධන ප්‍රතිශතය (%)
2021	108,233	18,919	21.18%
2022	149,882	41,649	27.79%
2023	168,260	18,378	10.92%
2024	171,742	3,482	2.03%
2025	185,906	14,164	7.62%



ක්ෂුද්‍ර මූල්‍ය අංශය තුළින් ක්‍රියාත්මක ප්‍රවර්ධන වැඩසටහන්

2000 වසරේ සිට ස්වයං මූල්‍ය ඒකකයක් ලෙස අංශයේ උපයාගත් පොලී ආදායම් තුළින් විවිධ සංවර්ධන වැඩසටහන් සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය ඔස්සේ අඩු ආදායම්ලාභී ප්‍රජාව ඉලක්ක කර ගනිමින් සිදු කිරීම ක්ෂුද්‍රමූල්‍ය අංශයේ ප්‍රධාන අරමුණ වේ. මේ සඳහා අංශය තුළ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් පහත පරිදි වේ.

- **අලුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන**

බැංකු වලට ගොනු වී ඇති ගිණුම් හිමියන් සහ අනෙකුත් ජනතාව සඳහා සෑම වසරකම සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව සමෘද්ධි බැංකු මගින් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් හා අලුත් අවුරුදු උත්සවයක් ජන ක්‍රීඩාවලට මුල් තැන දෙමින් සමෘද්ධි බැංකු 1,097 ක් පුරා එකම දිනයක් තුළ සාර්ථකව ක්‍රියාත්මක කර, සමෘද්ධි බැංකු නාමය හා සේවාවන් පිළිබඳ ජනතාව වෙත පණිවුඩයක් ගෙනයාමට කටයුතු කරන ලදී. එම කාලය තුළ තැන්පත් කරන මුදල් සඳහා ගනුදෙනුකරුවන්ට ප්‍රයෝජනවත් හා වටිනාකමකින් ඉහළ තිලිණ ලබාදීම සිදු කරන ලදී. මේ තුළින් අදාළ කලාප තුළ ජනතාව ඒකරාශී වීමත් ප්‍රජාවගේ සංස්කෘතික හැඟීම් ඔප්නැංවීමටත් මෙය අවස්ථාවක් කර ගැනීමට හැකි විය. තවද, සමෘද්ධි බැංකු කටයුතු හා විශ්වාසය තහවුරු කර, අඩු ආදායම්ලාභීන් ඇතුළු ප්‍රජාව තුළ සමෘද්ධි බැංකුවෙහි නාමය ප්‍රචලිත කර, ඔවුන් ආර්ථික / සාමාජීය සවිබලගැන්වීමක් අපේක්ෂා කෙරේ.

- **“රන් ප්‍රදීප” රන් උකස් ණය සේවාව**

සමෘද්ධි බැංකු සාමාජිකයින් විසින් හදිසි මුදල් අවශ්‍යතාවය වෙනුවෙන් තමා සන්තයේ පවතින රන් භාණ්ඩ උකස් කර මුදල් ලබාගැනීමේදී ඇති වන දුෂ්කරතා මඟ හරවා සහන පොලී මත කඩිනමින් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට පහසුකම් සැලසීම සිදු වේ.

- **සමෘද්ධි ප්‍රජාමූල බැංකු ආශ්‍රිතව "අරුණළු ක්ෂණික ණය" වැඩසටහන**

සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන මගින් අරුණළු ක්ෂණික ණය වැඩසටහන හඳුන්වා දීම. දිවයිනපුරා සියලුම ප්‍රජාමූල සංවිධාන හරහා සාමාජිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක වේ. ප්‍රජා මූල සංවිධාන සාමාජිකයන් විසින් ඔවුන්ගේ හදිසි මුදල් අවශ්‍යතා වෙනුවෙන් අවිධිමත් ක්ෂුද්‍රමූල්‍ය ආයතන/ පුද්ගලයින් මගින් ඉහළ පොළී අනුපාතයක් හා විවිධ බැඳීම් මත ලබාගන්නා ණය සඳහා විකල්පයක් ලෙස, සහනදායී හා කෙටිකාලීන ණය මුදල් ලබා ගැනීමට පහසුකම් සැලසීම මෙමගින් සිදුවේ.

- **පුහුණු කටයුතු**

ප්‍රජාමූල බැංකු ජාලයේ 1,097 ක හා ප්‍රජාමූල බැංකු සමිති 335 හි සේවය කරන කාර්ය මණ්ඩල සඳහා බැංකු කටයුතු හා අනෙකුත් විෂයන්ට අදාළව පුහුණු කිරීම් ප්‍රජාමූල බැංකු අරමුදල් මගින් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය සම්බන්ධීකරණය සිදුකරයි.

ගනුදෙනුකාර ප්‍රජාව වෙත වඩාත් කාර්යක්ෂම ඵලදායී සේවාවක් සැපයීම උදෙසා බැංකු කාර්ය මණ්ඩලය සඳහා දැනුම කුසලතාවය හා යහපත් ආකල්පයන් ප්‍රගුණ කිරීම මෙම ඒකකයේ කාර්ය භාරයයි.

ඒ අනුව බැංකුවේ කටයුතු පිළිබඳ අවබෝධය ලබාදෙන බැංකු කටයුතු හා ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ මූලික පුහුණු පාඨමාලාව සෑම බැංකු නිලධාරියකුටම ලබා දීමට කටයුතු කරයි. මෙයට අමතරව ප්‍රජාමූල බැංකු කටයුතු හා ප්‍රජාමූල බැංකු සමිතියේ ගිණුම් කටයුතු පිළිබඳ නුපුහුණු ප්‍රජාමූල බැංකු/ බැංකු සමිතියේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට කටයුතු කර ඇත.

- **කළමනාකරණ තොරතුරු ඒකකය**

1,097 ක් වූ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල තොරතුරු කළමනාකරණය සිදු කෙරෙන්නේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ කළමනාකරණ තොරතුරු ඒකකය මගිනි. ඒ අනුව සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියක්ම මාසිකව තම බැංකු ප්‍රගතිය, ලබා දී ඇති ආකෘති මගින් තොරතුරු කළමනාකරණ ඒකකය වෙත වාර්තා කළ යුතු අතර, එම දත්ත සකස් කර සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල පවතින තත්ත්වය විශ්ලේෂණය කර තොරතුරු ඉදිරිපත් කිරීමත්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍ය අනුපාත විශ්ලේෂණයන් ගොඩ නැගීම හා ඒ අනුව සමෘද්ධි ප්‍රජාමූල බැංකු ඇගයීම් සිදු කිරීමට සැලසුම් කර ඇත. තවද පරිගණක තාක්ෂණය උපයෝගි කරගෙන සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතියෙහි තොරතුරු ක්ෂුද්‍රමූල්‍ය අංශය වෙත සම්ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු පරිගණකගත කිරීමේ කටයුතු සාර්ථක වීමත් සමග මෙම ඒකකය මගින් තවත් ඵලදායීව හා කාර්යක්ෂම අන්දමින් ප්‍රජාමූල බැංකු පවත්නා තත්ත්වය විශ්ලේෂණය කිරීම හා ඇගයීම් කාර්ය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. සමස්ත බැංකු පද්ධතිය තිරසාර මූල්‍ය ඒකක බවට පත්කිරීමේ අරමුණ ඇතිව මෙන්ම සේවක අභිප්‍රේරණය අපේක්ෂාවෙන් බැංකු ශ්‍රේණිගත කිරීම හා ඇගයීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. එම වැඩසටහන සෑම වර්ෂයක් පාසාම වැඩිදියුණු කරමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

2025 වර්ෂයේ ළඟා කරගත් ප්‍රධාන ප්‍රතිඵලයන්

1. 2025 වර්ෂය තුළ පමණක් රු.මි. 73,158.04 ක ණය මුදල් ලබාදීමට හැකියාව ලැබීම.
2. සමෘද්ධි බැංකුවල ලාභදායී බැංකු ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව බැංකු 1,046 සිට 1,051 දක්වා වැඩිකර ගත හැකි වීම.
3. සමෘද්ධි බැංකුවල ලාභදායිත්වය රු.බිලියන 1.46 ක් දක්වා අඩු වී ඇත. (විගණනයට යටත්ව)
4. ප්‍රජාමූල සංවිධාන හරහා ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින්ට **"අරුණළු"** ක්ෂණික ණය ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.
5. අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා 7% ක පොළී ප්‍රතිශතයක් ලබාදිය හැකිවීම.
6. ප්‍රතිමුල්‍ය ණය වැඩසටහන නැවත හඳුන්වාදිය හැකිවීම.
7. බැංකු අධීක්ෂණ ඒකකය නැවත ස්ථාපිත කළ හැකිවීම.
8. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ලියාපදිංචිය අවසන් කිරීම.
9. සියලුම බැංකු සමිති පරිගණක ජාලගත කිරීම සිදු කිරීමට කටයුතු කිරීම.
10. බැංකු ඇගයීමේ ක්‍රමවේදයන් සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම.
11. සමෘද්ධි පනත අනුව ඉලක්ක ලබා දී ඒ අනුව නිලධාරීන් හා ප්‍රතිලාභීන් ඇගයීමට ලක් කිරීම.
12. රන්පත හා සවිබල නමින් ණය වර්ග දෙකක් හඳුන්වා දීම.
13. ධනශක්ති, ධනයෝජන ගිණුම් හඳුන්වා දීම තුළින් ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම.
14. සමෘද්ධි බැංකුවල සාමාජික සංඛ්‍යාව 45,483 කින් වැඩි වී ඇති අතර, කොටස් මුදල් ප්‍රමාණය රු.මි. 2,339.42 කින් වැඩි වී ඇත.

2023 මැයි සිට සමෘද්ධි සහනාධාර වැඩසටහන ඉවත් කර අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක කිරීමත් සමඟ අනෙකුත් රජයේ බැංකු මගින් සහනාධාර මුදල් ගෙවීම ආරම්භ විය. සමෘද්ධි ප්‍රතිලාභීන් විශාල ප්‍රමාණයක් සහනාධාර වැඩසටහනින් ඉවත් වීමත් සමඟ ගිණුම් හිමියන් තම ගිණුම්වලින් මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කිරීම නිසා තැන්පත් මුදල්වල අඩු වීමක් සිදු වූ අතර, ඔවුන් සමෘද්ධි බැංකුව හා තිබූ සම්බන්ධතාවය සීඝ්‍රයෙන් අඩු විය. මෙම තත්ත්වය තුළ සමෘද්ධි බැංකු ජාලයට ඇති වූ අයහපත් තත්ත්වයෙන් මුදවා ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ක්ෂුද්‍ර මූල්‍ය ජාලය ස්වයං මූල්‍ය තත්ත්වයට ගෙන ඒම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීන්දු මත ඉදිරියේදී සමෘද්ධි බැංකු, තිරසාර මූල්‍ය බැංකු පද්ධතියක් දක්වා වර්ධනය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

2.1.9. ව්‍යවසාය සංවර්ධන අංශය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් අස්වැසුම හා අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් මට්ටමින් පවත්වා ගනිමින් ඔවුන්ගේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියා කරනු ලබයි.

අරමුණ

අස්වැසුම ප්‍රතිලාභී හා අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ආදායම් මට්ටම ඉහළ නංවාලමින් , තිරසාරව එය පවත්වාගනිමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම මූලික අරමුණ වේ. ව්‍යවසායකයින්ගේ දැනුම, කුසලතා වර්ධනය කිරීම, නිෂ්පාදන උසස් ප්‍රමිතියෙන් හා නිමාවකින් යුක්තව සිදු කිරීම, ස්ථාවර වෙළෙඳපොලක් ඇති කර ගැනීම, දීප ව්‍යාප්තව භාණ්ඩ විකිණීම හා ප්‍රචාරණය, තෘප්තිමත් පාරිභෝගික ප්‍රජාවක් ගොඩනැන්වීම, නිෂ්පාදනයට සාධාරණ මිලක් ලබා ගැනීම හා රැකියා අභිමුඛ විවිධ වෘත්තීය හා භාෂා පුහුණු වැඩසටහන් දියත් කිරීම හරහා පරිසර හිතකාමී රැකියා අවස්ථා සුලභ කිරීම මගින් ව්‍යාසායකයා ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වීම තුළින් ජාතික ආර්ථික වර්ධනයට සෘජුව දායක වීම.

2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්.

1. අස්වැසුමලාභී, සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන.
2. රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන.
3. ව්‍යවසායකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන.
4. අස්වැසුමලාභී, සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන් සඳහා රැකියා අවස්ථා ඇති කිරීම අරමුණු කර ගනිමින් සමෘද්ධි සුව බොජුන්හල් ස්ථාපිත කිරීම.

සමස්ථ ප්‍රගතිය පිළිබඳ සාරාංශය

සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සඳහා 2025 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 361 වන අතර 2025.12.31 දින වන විට රු.මි.371.84 මුදලක් වැය කරමින් 88.08% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගෙන ඇත.

මීට අමතරව භාණ්ඩාගාර ප්‍රතිපාදන භාවිතා නොකර වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා ඒකාබද්ධ වී වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ජපන් භාෂා පුහුණු වැඩසටහන

අස්වැසුම, සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා ජපන් භාෂාව පිළිබඳව ප්‍රවීණත්වය ලබා දීමේ වැඩසටහන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි රැකියා නියෝජිත ආයතන හා එක්ව නොමිලේ රිදීමාලියද්ද, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල දරුවන් 300 දෙනෙකු සඳහා පුහුණු පාඨමාලා පැවැත්වේ.

සංචාරක හා හෝටල් පුහුණුව ලබා දීමේ වැඩසටහන

අස්වැසුම හා අඩු ආදායම්ලාභී පවුල් වල තරුණ තරුණියන්ට සංචාරක හා හෝටල් ක්ෂේත්‍රයේ පුහුණුව ලබා දී නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් 65 ක් හා රත්නපුර දිස්ත්‍රික්කයෙන් 90 දෙනෙකු රැකියාගත කර ඇත.

PIZZA HUT අවන්හල් ජාලයේ රැකියා අවස්ථා 200 ක් ලබා දීම සඳහා තරුණ තරුණියන් යොමු කිරීම සඳහා අවබෝධතා ගිවිසුම, ගිවිසුම් ගත කර ඇත.

<u>ව්‍යවසාය සංවර්ධන අංශයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය - 2025</u>

වැඩසටහන	වෙන් කළ මුදල (රු.මී)	වියදම	ව්‍යාපෘතිය/ වැඩසටහන	ලබාගත් ප්‍රගතිය
අස්වැසුම්ලාභී, සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන	20.00	13.98	4000	5565
රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන	228.81	201.07	4576	4762
ව්‍යවසායකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	30.00	25.63	600	544
අස්වැසුම්ලාභී, සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන් සඳහා රැකියා අවස්ථා ඇති කිරීම අරමුණු කර ගනිමින් සමෘද්ධි සුව බොජුන්හල් ස්ථාපිත කිරීම	82.35	77.15	70	33
එකතුව	**361.16**	**317.83**	**-**	**-**

2.1.10. සමාජ සංවර්ධන හා පරිසර අංශය

සමාජ සංවර්ධන හා පරිසර අංශයේ කාර්යභාරය ප්‍රධාන කොටස් 02කට වෙන් කළ හැකිය. ඒ අනුව

01. සමාජ සංවර්ධන වැඩසටහන
02. නිවාස වැඩසටහන


මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සමාජ සංවර්ධන වැඩසටහන, භාණ්ඩාගාර ප්‍රතිපාදන හා සමාජ සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක වන අතර නිවාස වැඩසටහන නිවාස ලොතරැයි අරමුදල මගින් ක්‍රියාත්මක වේ.

සමාජ සංවර්ධන වැඩසටහන

භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක සමාජ සංවර්ධන වැඩසටහන

ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී හඳුනාගත් සවිබල ගැන්වීමට නියමිත පවුල් සහභාගී කර ගනිමින් විවිධ ස්ථර ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.ඒ අනුව සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ එහෙත් අස්වැසුම ප්‍රතිලාභ නොලබන පවුල් හා අස්වැසුම ප්‍රතිලාභ ලබන සවිබලගැන්වීමේ ජාතික අවශ්‍යතාවය සඳහා පෙල ගැසී සිටින පවුල් වෙනුවෙන් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාවට නංවන ලදී.

1. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්
2. උපදේශන වැඩසටහන්
3. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්
4. ආකල්ප සංවර්ධන වැඩසටහන්



මෙම වැඩසටහන් වෙනුවෙන් 2025 වර්ෂය තුළ වැඩසටහන් 1,597ක් පැවැත්වූ අතර ප්‍රතිලාභ ලැබූ පවුල් ගණන 108,784කි. මේ සඳහා රු. මි. 22.74ක් වැය දරා ඇත.

සමාජ සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක සමාජ සංවර්ධන වැඩසටහන

සමාජ සංවර්ධන අරමුදල යටතේ දිස්ත්‍රික් 25ක් අවරණය වන පරිදි ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය උසස්කරලීම සඳහා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලද අතර එහි ප්‍රධාන වැඩසටහන් ලෙස,

- මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණය පිළිබඳ වැඩසටහන්
- කැකුළු ළමා සමාජ වැඩසටහන්
- ජාත්‍යන්තර දිනයන්ට සමගාමී වැඩසටහන්
- ගෘහ කළමනාකරණ හා සතුටු පවුල් වැඩසටහන්
- ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන් හා මානසික සංවර්ධන වැඩසටහන්
- ප්‍රගති සමාලෝචන වැඩමුළු
- වෙනත්

- **මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණය පිළිබඳ වැඩසටහන්**

වර්තමාන සමාජය තුළ ව්‍යසනකාරී උවදුරක් ලෙස ඉතා සීඝ්‍රයෙන් පැතිර යන මත්ද්‍රව්‍ය උවදුර රටෙන් තුරන් කිරීම උදෙසා ප්‍රාදේශීය මට්ටමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව පාසල් දරුවන්, වැඩිහිටියන් හා කාන්තාවන් ඒකරාශී කරමින් එක් එක් අවස්ථාවලදී තම පවුල මෙම උවදුරෙන් බේරා ගැනීමට කළයුතු ප්‍රතිකර්ම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. වර්තමාන තත්ත්වය වන විට පාසල් ළමුන් විවිධ ආකාරයේ මත්ද්‍රව්‍ය භාවිතා කිරීමේ ක්‍රම සමාජය විසින් හඳුන්වා දී ඇත. ඒ අනුව දැයේ දරුවන් මෙම උවදුරින් බේරා ගැනීමට සමාජ සංවර්ධන අංශය හා එක්ව දිස්ත්‍රික් හා ප්‍රා.ලේ. කොට්ඨාස මෙම උවදුරට උරදී මෙයින් දරුවන් බේරා ගැනීමට දේශන, වීදි නාට්‍ය, චිත්‍ර තරඟ ආදිය පවත්වා දරුවන් මුදා ගැනීමට කටයුතු කර ඇත. 2025 වර්ෂය තුළ හඳුනාගත් පවුල් සංඛ්‍යාව 4,008 වන අතර එයින් 1,500ක් මුදවා ගැනීමට කටයුතු කර ඇත. 2025 වර්ෂය තුළ මේ සඳහා රු. මි. 0.975ක් වැය දරා ඇත.

- **සමෘද්ධි කැකුළු ළමා සමාජ වැඩසටහන**

සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල දරුවන් හා සවිබලගැන්වීමට නියමිත වූ පවුල් ඒකරාශී කර ගනිමින් ළමා මනස පෝෂණය කිරීමෙහිලා දැයේ දරුවන්ගේ අභිවෘද්ධියට ක්‍රියාත්මක කරන තවත් එක් වැඩසටහනකි. මෙහිදී දරුවන්ගේ ආධ්‍යාත්මික, සාමාජීය, ආර්ථික හා සංස්කෘතික වශයෙන් දියුණුවක් එක් කිරීම උදෙසා ළමා සමාජ බිහි කිරීම තුළින් ළමයින්ගේ සහජ කුසලතා එළි දැක්වීමට හා සමාජය ඉදිරියට ළමුන් කැඳවාගෙන ඒමට නිර්මාණශීලි වැඩසටහන් මේ තුළින් ක්‍රියාත්මක කර ඇත.ඒ අනුව මෙම දරුවන්ගේ නැටුම්, ගැයුම්, වැයුම් හා නාට්‍ය හා රංග කලාවද ප්‍රදර්ශනය කරමින් මෙම දරුවන් ඇගයීමට ලක්කර ඇත. ජීවිතයේදී තමන් වෙත එන අභියෝග හමුවේ සාර්ථකව මුහුණදීම සඳහා මෙම වැඩසටහන් තුළින් දරුවන්ට නව පන්නරයක් ලැබේ. මේ වෙනුවෙන් 2025 වර්ෂය තුළ රු. මි. 3.884ක් වියදම් කර ඇත.

- **ගෘහ කළමනාකරණ හා සතුටු පවුල් වැඩසටහන**

මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණය මගින් පවුල් සවිබලගන්වා ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය කර අධ්‍යාත්මික හා මානසික වශයෙන් යහපත් පුරවැසියෙක් බිහිකිරීම, ගෘහය තුළ වෙසෙන මවගේ කාන්තාවගේ මානසික තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා මහ පෙන්වීම් මෙන්ම එදිනෙදා එම කාලය තුළ කළ යුතු වැඩ නොපමාව කිරීමට හා පිරිසිදු හා අනලස්ව තම නිවසේ කටයුතු කිරීමට ගෘහණිය දිරිගැන්වීම පුහුණු කිරීම හා දැනුවත් කිරීම මෙන්ම කාලය කළමනාකරණය කර කටයුතු කිරීමටත්, මවගේ සහෝදරියගේ නායකත්වය ලබාදීම තුළින් දරුවන්ට සැමියාට සහෝදරයන්ට සහෝදරියන්ට ආදරය කරුණාව දැක්වීම තුළින් හා බිරිඳ සැමියාටත් සැමියා බිරිඳටත් දරුවන් දෙමාපියන්ටත් දෙමාපියන් දරුවන්ටත් ආදරය කරුණාව ගෞරවය දැක්වීමට අනුබල දීම, පුහුණු කිරීම, දැනුවත් කිරීම මගින් සතුටු පවුල බිහි කිරීම හා විසිරි ඇති පවුල්, දික්කසාද පවුල්, ළමා හා කාන්තා තරුණ අපචාර වළක්වා ගත හැකි අතර වැඩිහිටියන්ට ගෞරවය කරන ඔවුන්ගේ ආරක්ෂාව සඳහා කටයුතු කරන යහපත් සතුටු පවුලක් ඇති කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථය වේ.

- **ජාත්‍යන්තර දින සැමරුම්වලට සමගාමීව ක්‍රියාත්මක කරනු ලබන සමාජ සංවර්ධන වැඩසටහන්**

වර්ෂය තුළ ජාත්‍යන්තර දින සැමරීම සඳහා දිස්ත්‍රික්ක 25 තුළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ඒ වෙනුවෙන් රු. මි. 1.95ක් වැය දරා ඇත.

ජාත්‍යන්තර කාන්තා දිනය (මාර්තු 08)

- ආකල්ප සංවර්ධන වැඩසටහන්
- නීතිය, ආධ්‍යාත්මික ගුණවගාව සම්බන්ධ වැඩසටහන්
- ක්ෂුද්‍රමූල්‍ය ණය උගුල් සම්බන්ධව හා පවුල් උපදේශනය පිළිබඳව දැනුවත් කිරීම්

ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය (මැයි 31)

- මතින් තොර රටක් නිර්මාණය කිරීම උදෙසා දිස්ත්‍රික්ක පුරා විවිධ ආකාරයේ දැනුවත් කිරීම්, විදි නාට්‍ය සංදර්ශන, චිත්‍ර හා පෝස්ටර් තරඟ පැවැත්වීම තුළින් පුද්ගලයාගේ මනසට මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව ආකල්ප වෙනස් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අප දෙපාර්තමේන්තුව මගින් දුම්වැටි විරෝධී කොඩි ව්‍යාපාරය ආරම්භ කරමින් අරමුදලක් ඒකාරාශී කිරීමට කටයුතු කිරීම

පරිසර දිනය (ජූනි 05)

- පාරිසරික වැඩසටහන් තුළින් රුක් රෝපණය ඇති කිරීම,
- ශ්‍රමදාන පැවැත්වීම වැනි වැඩසටහන් සඳහා ප්‍රජාව දිරිමත් කිරීමට පියවර ගැනීම

ජාත්‍යන්තර සාක්ෂරතා දිනය (සැප්තැම්බර් 08)

- පාසල් නොයන දරුවන් සොයාබලා පාසල්ගත කිරීමට මැදිහත්වීම
- සාක්ෂරතාවය අඩු වැඩිහිටියන් සඳහා සුදුසු පරිදි හඳුනාගත් වැඩසටහන් පැවැත්වීම
- පාසල් දරුවන් සඳහා පොත්පත් පාසල් උපකරණ ලබාදීමට අවශ්‍ය සංවිධාන කටයුතු

ජාත්‍යන්තර දිළිඳුකම පිටුදැකීමේ දිනය (සැප්තැම්බර් 17)

- විශේෂයෙන් කාන්තාවන් සඳහා ඉතිරිකිරීමට පෙළඹවීමේ වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආදායම් උත්පාදනයට අදාළ ස්වයං රැකියා ව්‍යාපෘති පිළිබඳ පුහුණු වැඩසටහන් සංවිධානය

ලෝක ළමා දිනය (ඔක්තෝබර් 01)

- දරුවන්ගේ ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳව වැඩිහිටි අවධානය යොමු කරවන වැඩසටහන් සංවිධානය හා දැනුවත් කිරීම
- ආකල්ප දැනුම කුසලතා වැඩිදියුණු කිරීමේ කඳවුරු පැවැත්වීම
- දිස්ත්‍රික් මට්ටමින් දරුවන්ගේ ගායන, වාදන , නර්තන, නාට්‍ය , චිත්‍ර, කථික තරග පවත්වා කැකුළු ළමා සමාජ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- ශිෂ්‍යත්ව දරුවන් සඳහා උපකාරක පන්ති හා සම්මන්ත්‍රණ පැවැත්වීම

වැඩිහිටි දිනය (ඔක්තෝබර් 01)

- වැඩිහිටි ප්‍රජාවගේ ජීවන රටාව සතුටින් ගෙවීමට අවශ්‍ය දැනුවත් කිරීම් හා රස වින්දන වැඩසටහන් පැවැත්වීම
- සෞඛ්‍ය කඳවුරු පැවැත්වීම
- මානසික සුවය සඳහා භාවනා වැඩසටහන් සංවිධානය

- **ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන හා මානසික සංවර්ධන වැඩසටහන්**

පාසල් දරුවන්ගේ කුසලතා වර්ධනය කරමින් 5 වසර ශිෂ්‍යත්ව වැඩසටහන වෙනුවෙන් දරුවන් සඳහා ඔවුන්ගේ මානසික සුවය සංවර්ධනය හා දැනුම් වැඩිදියුණු කිරීම පිණිස, දැනුවත් කිරීම, ප්‍රශ්න පත්‍ර සාකච්ඡා කිරීම, ධනාත්මක සිතුවිලි වර්ධනය කිරීම උදෙසා පාසල් මට්ටමේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. දරුවන්ගේ හා වැඩිහිටියන්ගේ සාක්ෂරතාව වැඩි දියුණු කිරීම මානසික සුවය ඇතිකරලීම සඳහා වැඩසටහන් පෙළගස්වා ඇත. 2025 වර්ෂය තුළ මෙම වැඩසටහන වෙනුවෙන් රු. මි. 4.00ක් වැය දරා ඇත.

- **ප්‍රගති සමාලෝචන වැඩමුළු**

සමාජ සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක වන සියලුම වැඩසටහන් වල ප්‍රගතිය විමසීම වසම් මට්ටම, කලාප මට්ටම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම දිස්ත්‍රික් මට්ටම හා ජාතික මට්ටම පරීක්ෂා කිරීම සිදුවේ. ඒ අනුව වැඩසටහන්වල පසුවිපරම් කිරීම සිදුවන අතර අවශ්‍ය අවස්ථාවලදී මග පෙන්වීම හා උපදෙස් ලබාදීම සිදුවේ. ඒ අනුව 2025 වර්ෂය තුළ මෙම වැඩසටහන වෙනුවෙන් රු. මි. 0.889ක් වැය දරා ඇත.

ජාත්‍යන්තර දුම්වැටි විරෝධී කොඩි වැඩසටහන තුළින් ඒකරාශී කරන ලද අරමුදල් වියදම් කිරීමේ ප්‍රගතිය - 2025 .12.31 දිනට

අනු අංක	වැඩසටහන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වැඩසටහන් සංඛ්‍යාව	වියදම්(රු.මි)
1	මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණ වැඩසටහන්	209,342	5,159	10.85
2	කැකුළු ළමා සමාජ වැඩසටහන්	74,030	5,104	15.89
3	ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	85,040	5,046	23.22
5	ගෘහ කළමනාකරණ හා සතුටු පවුල් වැඩසටහන	66,667	2,088	6.91
6	ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන හා මානසික සංවර්ධන වැඩසටහන	78,616	1,007	6.01
7	ප්‍රගති සමාලෝචන වැඩමුළු පැවැත්වීම	31,322	728	2.8
8	වෙනත්	113,942	3,480	14.3
මුළු එකතුව		**658,959**	**22,612**	**79.98**

ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනයට සමගාමීව සමෘද්ධි කොඩි වැඩසටහන **2025**

අනු. අංකය	දිස්ත්‍රික්කයේ නම	ප්‍රා.ලේ කොට්ඨාස සංඛ්‍යාව	ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව	මුදල (රු.)
1	යාපනය	15	2251	26,224,011.00
2	මන්නාරම	5	549	1,227,584.00
3	කිලිනොච්චිය	4	556	894,317.00
4	මඩකළපුව	14	2020	7,010,848.00
5	මුලතිව්	6	497	702,123.00
6	අම්පාර	20	1698	6,608,906.00
7	වවුනියා	4	406	1,686,051.00
8	ත්‍රිකුණාමලය	11	802	1,931,075.00
9	පොළොන්නරුව	7	476	3,288,557.00
10	බදුල්ල	15	827	3,844,519.50
11	අනුරාධපුරය	22	1327	3,588,120.00
12	මොණරාගල	11	942	1,570,189.00
13	නුවරඑළිය	10	689	5,373,786.00
14	මාතලේ	11	907	6,366,624.50
15	මහනුවර	20	1466	11,987,253.00
16	කුරුණෑගල	30	3077	13,319,954.25
17	කෑගල්ල	11	1249	4,982,397.00
18	පුත්තලම	16	970	6,666,434.00
19	රත්නපුර	18	1956	6,231,768.00
20	හම්බන්තොට	12	839	3,451,718.00
21	මාතර	16	1044	4,699,364.00
22	ගාල්ල	22	1128	8,878,841.00
23	ගම්පහ	13	1741	12,285,510.00
24	කළුතර	14	1065	4,683,353.00
25	කොළඹ	13	768	9,770,779.00
මුළු එකතුව		**340**	**29250**	**157,274,082.25**

01. **සමෘද්ධි විශේෂ නිවාස වැඩසටහන**

2013 අංක 01 දරණ දිවිනැගුම පනතේ 45 වන වගන්තිය මගින් සලසා ඇති ප්‍රතිපාදන මගින් 95 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරී පනත යටතේ ක්‍රියාත්මක කරන ලද නිවාස සංවර්ධන ලොතරැයි

අරමුදල පහත සඳහන් රෙගුලාසි අනුව ක්‍රියාත්මක කොට 2024 වර්ෂයේදී විශේෂ නිවාස වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථීර නිවසක හිමිකම ලබාදීමේ අරමුණින් සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි භාරකාර අරමුදල පවත්වාගෙන යනු ලැබේ.

මෙම අරමුදල ගොඩනංවා ඇත්තේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වලට ලබාදෙනු ලබන සහනාධාර මුදලින් මාසිකව රු. 100/-ක මුදලක් අරමුදලට බැර කිරීමෙනි. සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර අරමුදල රෙගුලාසි මාලාවකට අනුකූලව 2002.03.07 දිනැතිව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් අනුමත කරන ලද භාරකාර මණ්ඩලයක් මගින් පාලනය වේ.

එම නිලධාරී මණ්ඩලය පහත පරිදි වේ.

- විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්
- විෂයභාර අමාත්‍යාංශයේ තවත් එක් නියෝජිතයෙක්
- විෂයභාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
- මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක්
- දෙපාර්තමේන්තුවේ විෂයයභාර අධ්‍යක්ෂවරයා
- සමෘද්ධි කළමනාකරුවන්ගේ සංගමයේ නියෝජිතයෙක්
- සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සංගමයේ නියෝජිතයෙක්

2025 වසරේදී නිවාස වැඩසටහන ක්‍රමවේද කිහිපයක් යටතේ ක්‍රියාත්මක කරන ලදී.

1. රු. 1,000,000/- නිවාස වැඩසටහන - නිවාස 1,020
2. රු. 1,000,000/- අභියාචනා නිවාස වැඩසටහන - නිවාස 10
3. රු. 250,000/- අභියාචනා නිවාස වැඩසටහන - නිවාස 50

2025 වර්ෂයේදී මේ සඳහා සවිබලගැන්වීමට නියමිත ලේඛනය තුළින් නිවාස ලබාදීමට පවුල් තෝරා ගැනීම සිදුවිය. ඒ අනුව අනිවාර්යයෙන්ම සවිබලගැන්වීමේ නාමලේඛනයේ නම තිබිය යුතු අතර මෙම ප්‍රතිලාභීන්ට ස්ථීර ඉඩමක අයිතිය තමන් සතු විය යුතුය. වැන්දඹු හා දරුවන් වැඩි සංඛ්‍යාවක් සිටින පවුල්, ආබාධිත තත්ත්වයේ සිටින පවුල් කෙරෙහි වැඩි අවධානයක් දක්වන ලදී.මෙම වැඩසටහන 2025 වර්ෂයේ අග භාගයේදී ආරම්භ කර ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යනු ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට නිවාස 03 බැගින් ලබාදුන් අතර ඉදිකිරීමට නියමිත මුළු නිවාස ගණන 1,020කි. 2025.11.31 වන විට මුදල් නිදහස් කර ඇත්තේ නිවාස 911 ක් සඳහා පමණි. එක් නිවසකට රු. ලක්ෂ 10 බැගින් රු. මි. 1,020ක් වැය දැරීමට නියමිතය.

2024 වර්ෂයේ ආරම්භ කර 2025 වර්ෂයේ අවසන් කර ඇති නිවාස

නම	එම්.ජී.දේශිකා ජයමිණි මිය
ලිපිනය	64, ජයගත්පාර, පතිරගොඩ, මහරගම
ලබාදුන් මුදල	රු. 750,000.00
නම	එම්. අරුලූබන්
ග්‍රාම නිලධාරී වසම	යාපනය - උඩුවිල්
ලබාදුන් මුදල	රු. 750,000.00

2.1.11 සැලසුම් හා මෙහෙයුම් අංශය

හැඳින්වීම

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අතුරින් ජනතාවගේ දිළිඳුබව තුරන් කිරීමේ අරමුණ වෙනුවෙන් කටයුතු කරන ප්‍රධානතම ආයතනය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවයි.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ක්‍රමෝපාය සැලසුම් සකස් කිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම හා එම සැලසුම් අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පිළිබඳ පසුවිපරම් කිරීම, ආයතනික තීන්දු තීරණ ගැනීම සඳහා ඵලදායී දත්ත ඉදිරිපත් කිරීම හා තොරතුරු වාර්ෂික වියදම් සීමාව තුළ ඊට සරිලන ප්‍රතිඵල ළඟා කරගෙන ඇත් ද යන වග නිරීක්ෂණය කිරීම, ආයතනික ඉදිරි විභවතා පිළිබඳ පර්යේෂණ සිදු කර දිළිඳු බව තුරන් කිරීමේ මෙරට ජාතික මෙහෙවරට උරදෙන ප්‍රමුඛතම ආයතනය බවට පත් කිරීමේ මෙහෙවර සැලසුම් හා මෙහෙයුම් අංශය මගින් සිදු කරයි.

සැලසුම් හා මෙහෙයුම් අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

- ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන යටතේ, අස්වැසුම ප්‍රතිලාභ ලබන අන්ත දුප්පත් හා දුප්පත් සමාජ කාණ්ඩයන්ට අයත් පවුල් ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ පවුල් සවිබලගැන්වීම සඳහා සැලසුම් සකස් කිරීම, උපදෙස් ලබා දීම හා අරමුදල් සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ආංශික රාජ්‍ය ආයතනවල සම්බන්ධීකරණය ඇතුළු කටයුතු සිදු කිරීම.

- මහා භාණ්ඩාගාර අරමුදල් හා දෙපාර්තමේන්තුගත අරමුදල් සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, අනුමැතීන් සඳහා ඉදිරිපත් කිරීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම

ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කරනු ලබන අතර, සෑම මසකට වරක් අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රගති සමාලෝචනය කරනු ලබයි. දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල ප්‍රගතිය මෙන්ම, අනෙකුත් සියලුම පරිපාලන කරුණු පිළිබඳව සාකච්ඡා කරනු ලබන අතර, මේ සඳහා දිස්ත්‍රික් 25 නියෝජනය කරමින් දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන් ඒ සඳහා සහභාගී වේ. මේ යටතේ, 2025 වර්ෂය සඳහා ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 07 ක් පවත්වා ඇති අතර, වියදම් කළ මුදල රු.මි.0.79 කි.

දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

සෑම මාසයකම දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම් මූලස්ථාන / කලාප හා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරේ.

දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 150 ක් පවත්වා ඇති අතර, වියදම් කළ මුදල රු.මි.6.00 කි.

ප්‍රාදේශීය මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ප්‍රගතිය සාකච්ඡා කිරීම මෙහිදී සිදු කෙරෙන අතර, 2025 වර්ෂය තුළ ප්‍රගති සමාලෝචන රැස්වීම් 1,924 ක් පවත්වා ඇති අතර වියදම් කළ මුදල රු.මි.18.50 කි.

වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම.

පෙර වර්ෂයට අදාළව ඒ ඒ අංශ මගින් ක්‍රියාත්මක කරන ලද දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යසාධනය පදනම් කරගෙන වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කරනු ලැබේ. සියලු විස්තර සහිතව පොතක් වශයෙන් සකස් කර සෑම වසරකම අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කෙරේ. ඒ අනුව අවසන් වරට 2024 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව පිටපත් 15 ක් භාෂා ත්‍රිත්වයෙන් සකස් කර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

2.1.12. ප්‍රජාමූල සංවිධාන වැඩසටහන

හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සංවර්ධන කාර්යභාරයන් දියත් කිරීම සඳහා ප්‍රජාව සම්බන්ධ මූලිකම පදනම ප්‍රජාමූල සංවිධානයයි. සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් යනු සමෘද්ධි පනතින් යෝජිත මෙහෙයුම් ක්‍රියාවලියේදී ප්‍රජාව සම්බන්ධ වන ග්‍රාමීය මට්ටමේ සංවිධානයකි. මෙම ඒකකය පදනම් කරගෙන සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන, සමෘද්ධි දිස්ත්‍රික් කමිටු සහ සමෘද්ධි ජාතික සම්මේලනය වශයෙන් සමස්ත සංවිධාන ව්‍යූහය ගොඩනැඟී ඇත.

සමෘද්ධි පනතට අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ඉටුකෙරෙන සංවර්ධන කාර්යයන් හා ප්‍රජාව සම්බන්ධ වන පහළම සංවිධානාත්මක ඒකකය වන ප්‍රජාමූල සංවිධානය මූලික කොට ගෙන ප්‍රජාවගේ පූර්ණ සහභාගිත්වයෙන් ඉටු කරනු ඇත. ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් එයට සමගාමීව ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටුද පිහිටුවා පවත්වා ගෙන යාම සිදු කෙරේ. මෙම වසර සඳහා ප්‍රජාමූල සංවිධාන 29,389 ක් ලියාපදිංචිය අලුත් කර ඇත.

සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල කර්තව්‍ය ප්‍රාදේශීය මට්ටමින් අධීක්ෂණය කිරීම,පරීක්ෂා කිරීම සහ ඇගයීමේ කාර්යය සඳහා සියලුම ප්‍රජාමූල සංවිධානවල සභාපතිවරුන් ඇතුළත්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන 337 ක් පිහිටුවා ඇත.

දිස්ත්‍රික්කයක් ඇතුළත ක්‍රියාත්මක වන සියලු සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සභාපති හා ලේකම් නියෝජනය කරමින් සමෘද්ධි දිස්ත්‍රික් කමිටු පිහිටුවනු ලැබේ. මෙම දිස්ත්‍රික් කමිටු සෑම තුන් මසකට වරක් කැඳවීම සහ අදාළ තීරණයන් ගැනීම සහ එවා ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතුය.

සියලු සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල අනුයෝජිතයන්ගෙන් සමන්විත වන පරිදි සමෘද්ධි ජාතික සම්මේලනය පිහිටුවනු ලැබේ. විෂය භාර අමාත්‍යවරයා සමෘද්ධි ජාතික සම්මේලනයේ මූලසුන දැරිය යුතුය.

ජාතික මට්ටමින් සමෘද්ධි සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය වන යෝජනා සහ මත සමාලෝචනය කිරීම සහ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය සැපයීම සමෘද්ධි ජාතික සම්මේලනයේ පරමාර්ථ වේ.

මෙම සියලු සංවිධාන පිහිටුවා යාවත්කාලීන කිරීම, පවත්වාගෙනයාම, මෙහෙයවීම හා කළමනාකරණය කිරීම මෙන්ම එම සංවිධානවල සියලු කටයුතු අධීක්ෂණය කිරීම ප්‍රජාමූල සංවිධාන අංශය මගින් සිදු කරනු ඇත.

පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව	-	29,389
පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සංඛ්‍යාව	-	337
ත්‍රෛ මාසිකව රැස්වන දිස්ත්‍රික් කමිටු සංඛ්‍යාව	-	25
ප්‍රජාමූල සංවිධානවල මුළු සාමාජික සංඛ්‍යාව (මිලියන)	-	1.82

ප්‍රජාමූල සංවිධාන අංශය මගින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්

- සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානයන්හි වාර්ෂික නිලවරණ පැවැත්වීම, නව නිලධාරීන් පත් කිරීම හා සංවිධාන පිහිටුවීම.
- සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචිය අලුත් කිරීම සහ නව සංවිධාන ලියාපදිංචි කිරීම.
- සමෘද්ධි ජාතික සම්මේලනය පැවැත්වීම, අවශ්‍ය තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
- ජාතික සමාජ සංවර්ධන අරමුදල පවත්වාගෙන යෑම හා නියාමන කටයුතු.
- ප්‍රජා නායකයින් දැනුවත් කිරීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ස්වේච්ඡාවෙන් ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීමේ නියමුවන් වන ප්‍රජා නායකයින් ඇගයීම.
- ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානවල ගිණුම් කටයුතු ක්‍රමානුකූල කිරීම.
- සංවිධාන අරමුදල් වර්ධනය කිරීමට අවශ්‍ය විවිධ වූ ක්‍රියාමාර්ග හඳුන්වා දීම.
- කාලීනව පැන නගින අර්බුදයන්ට විසඳුමක් ලෙස මැදිහත්විය හැකි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පවුල් සවිබලකරණය තුළින් ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන් ඇගයීමට ලක් කිරීම.
- ජාතික සැමරුම් දිනයන්ට සමගාමීව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ගමට බැංකුව ලෙස ක්ෂුද්‍ර මූල්‍ය ගැටළුවට විසඳුමක් වශයෙන් සමෘද්ධි අරුණළු සහන ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ‘‘තාරුණ්‍යයට සොඳුරු ඇමතුමක්’’ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ජාතික හා අන්තර්ජාතික මට්ටමින් ක්‍රීඩා දක්ෂතාවයන් දක්වන දරුවන්ට ක්‍රීඩා සංවර්ධනය සඳහා අවශ්‍ය සහාය ලබාදීම.
- සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සාමාජික පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා සහාය වීම.

ප්‍රජා නායකයින් හා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම

ප්‍රජාමූල සංවිධාන නිලවරණය හරහා පත්වන නව නිලධාරීන් අතරින් නායකත්ව හා තම කාර්යභාරය ප්‍රතිලාභීන් සඳහා ක්‍රියාත්මක වන වැඩසටහන් සහ එහි ප්‍රතිලාභ පිළිබඳ දැනුම හා පුහුණුව අවශ්‍ය නිලධාරීන්ට පුහුණුවක් ලබාදීමේ කාර්යය පුහුණුකරුවන් ලෙස පුහුණු කරන ලද සම්පත් දායකයින්ගේ දායකත්වයෙන් සියලුම දිස්ත්‍රික් ආවරණය වන ලෙස වැඩමුළුව පවත්වන ලදී.

ප්‍රජා නායකයින් දැනුවත් කර එම කණ්ඩායම මගින් දිවයිනම ආවරණය වන පරිදි ග්‍රාමීය මට්ටමේ අවශ්‍යතාවයන් සහිත සියලු ප්‍රජානායකයින් හා නිලධාරීන් පුහුණු කිරීමට හැකියාව ලැබිණි. මෙමගින් ප්‍රජා නායකයින්ගේ අපේක්ෂිත ඉලක්ක සාධනීය ලෙස ළඟාකර ගැනීම ප්‍රධාන අපේක්ෂාව විය.

02. එහි දී පහත සඳහන් මාතෘකා සම්බන්ධව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

- සමෘද්ධි පනත, රෙගුලාසි හා ප්‍රාදේශීය සංවිධාන සතු බලතල පිළිබඳ දැනුවත් කිරීම.
- නායකත්ව ගුණාංග, ප්‍රජා නායකයෙකු සතු වගකීම් හා තීරණ ගැනීම
- ප්‍රජාමූල, ප්‍රාදේශීය සංවිධානවල ප්‍රජා නායකයෙකු සතු වගකීම් හා කාර්ය භාරය.
- ප්‍රජාමූල සංවිධාන නායකයින්ගේ ආකල්ප සංවර්ධනය.

- ක්ෂුද්‍ර මුල්‍ය ගැටළුවට පිළියම් ලෙස හඳුන්වා දුන් අරුණළු ණය වැඩසටහනේ දැනට භාවිතා වන ආකෘති පත්‍රවල අඩුපාඩු සාකච්ජා කර නව ආකෘති පත්‍ර හඳුන්වාදී ගිණුම්කරණය පිළිබඳ අවශ්‍ය දැනුම ලබාදීම.
- ප්‍රජා නායකයින් විගණකයන් ලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් කිරීම

මේ යටතේ දිවයිනම ආවරණය වන පරිදි නිලධාරීන් හා ප්‍රජා නායකයින් 2,558 කගේ සහභාගිත්වයෙන් දිස්ත්‍රික් මට්ටමේ වැඩමුළු 46ක් පැවැත්වීමට ඒ සඳහා ජාතික සමාජ සංවර්ධන අරමුදලෙන් රු.මිලි 2.15 වැය දරන ලදී.

දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම.

සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධානයන්හි වැඩසටහන් අධීක්ෂණය කිරීම, නියාමනය කිරීම, සහ ඇගයීම, දිස්ත්‍රික්කය තුළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළ යෝජනා ඉදිරිපත් කිරීම, වැඩසටහන් සම්බන්ධීකරණය සහ අවශ්‍ය මඟ පෙන්වීම් ලබාදීම.

ස්ථානය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

සහභාගීත්වය - ප්‍රාදේශීය සංවිධානවල සභාපතිවරු, ලේකම්වරු, ප්‍රජාමූල බැංකු සමිති ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්, දිස්ත්‍රික්කය භාරව සිටින දෙපාර්තමේන්තු නිලධාරියා, අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලබන දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු පිළිබඳ ප්‍රවීණයන් .

සෑම වර්ෂයකම තුන් මසකට වරක් රැස්වීම් පවත්වන අතර වර්ෂයකට රැස්වීම් 04 ක් පැවැත්වේ.

දිස්ත්‍රික්කය තුළ ප්‍රජාමූල සංවිධාන සහ ප්‍රාදේශීය සංවිධාන කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සහ අදහස් සලකා බැලීම, නිර්දේශ ඉදිරිපත් කිරීම සහ ඒවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා දිස්ත්‍රික් කමිටු මගින් සිදු කෙරේ.

ජාතික සමාජ සංවර්ධන අරමුදලින් රු.මිලි 1.86 වැය කර දිස්ත්‍රික් කමිටු රැස්වීම් 47 පවත් වන ලදී.

සමෘද්ධි කොඩි වැඩසටහන

2013 අංක 01 දරන සමෘද්ධි පනතේ 10 (ඒ) ඡේදයට අනුව සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආත්ම විශ්වාසය, සමාජය කෙරෙහි සාමූහික වගකීම, යහපත් ගුණාංග හා ගුණ ධර්ම ප්‍රවර්ධනය කිරීම ප්‍රජාමූල සංවිධානවල එක් පරමාර්ථයකි. මෙමගින් සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ මානව පෞරුෂය, සාමූහික ක්‍රියාකාරකම් දැහැමි හා ආධ්‍යාත්මික ගුණාංග වැඩි දියුණු කිරීම.

ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනට සමගාමීව සමෘද්ධි කොඩි වැඩසටහන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන මට්ටමින් ප්‍රජාමූල සංවිධානවල සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු විධායක සභාව මෙන්ම සාමාජිකයන් සමඟ එක්ව සමෘද්ධි ප්‍රතිලාභීන් මගින් කොඩි හා ස්ටිකර් පිළිගැන්වීම දුම් වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකී සිටීමේ වැදගත්කම පිළිබඳ දැනුම ජනතාව වෙත ලබා දෙමින් අරමුදල් රැස් කිරීම සිදු කරන ලදී. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ හා අඩු ආදායම්ලාභීන්ගේ සමාජ සුභ සාධන කටයුතු සඳහා මෙම රැස්කරන අරමුදල් යොදවා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම වැඩසටහන සියලුම ප්‍රජාව සඳහා සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ක්‍රියාත්මක කරනු ලබන අතර දුම්වැටි විරෝධී දිනයට සමගාමීව මත් නිවාරණ වැඩසටහන් පැවැත්වීම හා කොඩි වැඩසටහන

තුළින් එක්රැස් කරන ලද අරමුදල් ප්‍රතිලාභීන්ගේ හා ඔවුන්ගේ පවුල්වල දරුවන්ගේ සුබසාධනය සඳහා යෙදවීම. මත් නිවාරණ වැඩසටහන්, සමෘද්ධි කැකුළු ළමා සමාජ වැඩසටහන , ගෘහ කළමනාකරණය හා සතුටු පවුල , නිවාස ඉදිකිරීම්, නිවාස අලුත්වැඩියා කිරීම්, පාසල් දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම, පාසල් දරුවන් සඳහා පොත් හා උපකරණ ලබාදීම, සනීපාරක්ෂක වැඩසටහන, සෞඛ්‍යය හා පෝෂණ වැඩසටහන්, ආබාධිත සුබසාධනය, කාන්තා හා වැඩිහිටි දින වැඩසටහන් ක්‍රියාත්මක කර ලදී.

“සමෘද්ධියෙන් සවිබලගැන්වූ අපි” පොත එළිදැක්වීම

සමෘද්ධි වැඩසටහන වසර 30කට ආසන්න කාලයක් දිළිඳුකම පිටුදැකීමේ අරමුණ වෙනුවෙන් පවුල් සවිබලගැන්වීම සඳහා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කර ඇත. ඒ අතරින් ස්වයං රැකියා ණය වැඩසටහනෙන් ආරම්භ කර බැංකු ණය හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන හරහා සාර්ථක ව්‍යවසායකයින් බවට පත්වූවන් අතරින් එක් දිස්ත්‍රික්කයකට තිදෙනෙකු බැගින් තෝරාගෙන ඔවුන්ගේ අත්දැකීම් ඇතුළත් කතාව ග්‍රන්ථයක් ලෙස තේ‍ර භාෂාවෙන් මුද්‍රණය කිරීමට කටයුතු කර ඇත. මෙය ව්‍යවසායකයින් බවට පත්වීමට අපේක්ෂාවෙන් සිටින්නන්ට හා සමෘද්ධියෙන් සවිබල ගැන්වූවන් පිළිබඳ සාක්ෂි සපයන අතර මෙම සිද්ධි අධ්‍යනය කරන්නන්ට මාර්ගෝපදේශයක් සපයයි. සිංහල දෙමළ මාධ්‍ය ඒකාබද්ධ පොත් 500ක් හා ඉංග්‍රීසි මාධ්‍ය පොත් 500ක් මුද්‍රණය කරන ලදී. සිද්ධි අධ්‍යයන 67ක් ඇතුළත් මෙම ග්‍රන්ථය ප්‍රජා හරසර උපහාර උළෙලට සමගාමීව පිළිගැන්වීම සිදුකරන ලදී.

“ප්‍රජා හරසර” උපහාර ප්‍රජා නායකයින් ඇගයීමේ වැඩසටහන

2025 වසරේ උපහාර වැඩසටහන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අංශ 4ක් ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලදී. ප්‍රජාමූල , අලෙවි, සමාජ සංවර්ධන හා ක්ෂුද්‍ර මූල්‍ය(බැංකු) අංශ ඒකාබද්ධ වැඩසටහනක් ලෙස 2025.10.28 දින අරලියගහ මන්දිරයේ දී ඉතාමත් සාර්ථකව පවත් වන ලදී.

සමෘද්ධි වැඩසටහන යටතේ ඒ ඒ අංශයන්හි කාර්යභාරය මැනවින් සමාජ ගත කිරීමට උනන්දුවන් හා කැපවීමෙන් කටයුතු කළ ප්‍රජාව, ප්‍රජා නායකයින් හා නිලධාරීන් ජාතික වශයෙන් හා දිස්ත්‍රික් මට්ටමින් ඇගයීමට ලක් කරන ලදී. එහිදී සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනට සමගාමීව කොඩි වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ජාතික මට්ටමින් නිලධාරීන් හා ප්‍රජාව 147ක් ඇගයීමට ලක්විය. දිස්ත්‍රික් මට්ටමින් ප්‍රජාමූල හා ප්‍රාදේශීය සංවිධාන කාර්යයන් සාර්ථකව ක්‍රියාත්මක කළ ප්‍රජා නායකයින් 250 ක් ද , අලෙවි අංශය යටතේ දිස්ත්‍රික් මට්ටමින් හොඳම ව්‍යවසායකයින් - 150ක් හා ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශය යටතේ ජාතික මට්ටමින් බැංකු වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නිලධාරීන් හා ප්‍රජාව 155 ක් ද විශේෂ ඇගයුම් ලාභීන් කිහිප දෙනෙකු ද ඇතුළත්ව ඇගයුම්ලාභීන් 702 ක් ඇගයීමට ලක්කර ඇත.

ක්ෂුද්‍ර මූල්‍ය ගැටළුවට විසඳුමක් ලෙස සමෘද්ධි අරුණළු සහන ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින්ගේ, කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ ක්ෂණික ප්‍රාග්ධන අවශ්‍යතා මෙන්ම පැන නගින හදිසි මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය වන්නා වූ කෙටි කාලීන මූල්‍ය ඕනෑ එපාකම් තම ගම් ප්‍රදේශයේදීම පිරිමසාලීමටත් , අඩු ආදායම්ලාභීන් ග්‍රාමීය ණය උගුලෙන් මුදවා ගැනීමත් මෙම ණය වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. මෙම වැඩසටහන ප්‍රජාමූල සංවිධාන මට්ටමින් ගමතුළ ක්‍රියාත්මක වන සාර්ථක වැඩසටහනකි.

ප්‍රතිලාභීන්ට හිමිවන පහසුකම්

- තම ගම් ප්‍රදේශයේදීම ණය ලබා ගැනීමේ හැකියාව.
- ක්ෂණිකව ණය ලබා ගැනීමට හැකිවීම.

- ණය පියවීමෙන් පසු නැවත නැවත ණය ලබාගැනීමට අවස්ථාව හිමිවීම.
- සහනදායී පොලී අනුපාතයක් යටතේ ණය ලබාදීම.
- සරල පහසු ක්‍රමවේදයක් යටතේ ආපසු ගෙවීමේ හැකියාව.

ණය ලබාදී ඇති ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව	18,144
ණය ලබාදී ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව	591,688
ලබාදී ඇති ණය වටිනාකම (රු. මිලි.)	5,768

ප්‍රජාමූල සංවිධාන සාමාජික තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කුසලතාවය වර්ධනය කිරීම සඳහා ක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම.

සමෘද්ධි ව්‍යාපාරයට වසර 30ක් පිරීම නිමිත්තෙන් සමස්ත සමෘද්ධි වැඩසටහනට ප්‍රචාරණයක් ලබාදීමද අරමුණු කර ගනිමින් ප්‍රජාමූල සංවිධානවල සාමාජිකයින් හා ඔවුන්ගේ දරුවන්ගේ පූර්ණ සහභාගිත්වයෙන් සැහැල්ලු පන්දු ක්‍රිකට් හා වොලිබෝල් තරගාවලියක් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි කලාප, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදී.

මේ යටතේ දිස්ත්‍රික් මට්ටමේ පැවති තරඟ සඳහා එක් තරඟයකට තරඟකරුවන් 45 – 60 පමණ සහභාගිත්වය සහිතව දිස්ත්‍රික්ක 22 සඳහා රු.මිලි 1.84 වැය කරන ලදී. හම්බන්තොට, මුලතිව් හා මන්නාරම යන දිස්ත්‍රික්ක විවිධ හේතූන් මත මෙම වැඩසටහන සඳහා ඉදිරිපත්වූයේ නැත.

ප්‍රජාව සවිබලගැන්වීම ඉලක්ක කර ගත් වෘත්තීය පුහුණු වැඩසටහන්

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ මගින් දිස්ත්‍රික්කවලින් කරන ලද ඉල්ලීම් අනුව ප්‍රජාව සවිබලගැන්වීම ඉලක්ක කරගත් වැඩසටහන් කිහිපයක් තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් අතර ආදායම් උත්පාදන ස්වයං රැකියා ඉලක්ක කරගත් විශේෂ ව්‍යාපෘතියක් වශයෙන් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණු අවස්ථා ඇති කරදීමට හැකිවිය. ඒ අනුව කුරුණෑගල හා රත්නපුර දිස්ත්‍රික්කවල තරුණ තරුණියන් 07 දෙනෙකු වෘත්තීය පුහුණුවට යොමු කර ඇත. මේ සඳහා ජාතික සමාජ සංවර්ධන අරමුදල මගින් වැයවූ මුදල රු.මි. 0.45 කි.

ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය

අනු අංක	වැඩසටහන	වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මී	වියදම (රු.මී.)	සංඛ්‍යාව
01	අරුණළු ගිණුම්කරණය හා සමෘද්ධි ප්‍රජා නායකයින් හා නිලධාරීන් පුහුණු කිරීම.	2.5	2.15	ප්‍රජා නායකයින් හා නිලධාරීන් - 2558
02	දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම	2.4	1.86	කමිටු රැස්වීම් 47
03	දිස්ත්‍රික් මෙහෙයුම් කටයුතු	1.25	0.59	ක්‍රියාකාරකම් 20
04	ක්‍රීඩා තරඟාවලියක් පැවැත්වීම	2.00	1.84	දිස්ත්‍රික් 22ක ක්‍රීඩා තරඟ 314
05	විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	3.0	0.57	විශේෂ ව්‍යාපෘති 4
06	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම	0.6	0.55	රැස්වීම් වාර 04
07	තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණු ලබාදීම	1.00	0.82	පුහුණු පාඨමාලා 7
08	'සමෘද්ධියෙන් බලගැන්වූ අපි' පොත එළි දැක්වීම.	2.5	1.05	පොත් 1000
09	ප්‍රජා නායකයින් ඇගයීම.	7.5	6.92	ඇගයීම්ලාභීන් 702
10	කොඩි දින වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. කොඩි /ස්ටිකර්/ පෝස්ටර්/කැට ලේබල් මුද්‍රණය කිරීම	8.0	4.53	කොඩි - 265,7846 පෝස්ටර් - 2000 ස්ටිකර් - 25,3675 කැට ලේබල් -55,447
11	සමාජ සංවර්ධන අංශය සතුටු පවුල් හා ගෘහ කළමනාකරණ වැඩසටහන, කැකුළු ළමා සමාජ වැඩසටහන, ජාත්‍යන්තර දින වැඩසටහන, ප්‍රගති සමාලෝචන	8.0	7.73	
එකතුව		**38.75**	**28.61**	

2.1.13. අභ්‍යන්තර විගණන අංශය

හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මුදල් රෙගුලාසි 133,134 අනුව පිහිටුවා ඇති අතර, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ උපදෙස් හා පූර්ව මගපෙන්වීම මත ක්‍රියාත්මක වනු ලැබේ.

අරමුණ හා කාර්යභාරය

අභ්‍යන්තර විගණන අංශය ප්‍රධාන වශයෙන් දෙපාර්තමේන්තුවේ විගණන කාර්යයට අමතරව දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,097ක් හා බැංකු සමිති 335ක්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 335ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක් හා ප්‍රජාමූල සංවිධාන විගණනයට ලක් කරනු ලැබේ. දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධ ආයතන විසින් ඉටු කරනු ලබන වැඩසටහන්වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණෙන් අදාළ පරිදි මූල්‍ය විගණනය, කාර්ය සාධන විගණනය, කළමනාකරණ විගණනය, පාරිසරික විගණනය, පද්ධති පාලන විගණනය හා අවදානම් සහිත ක්ෂේත්‍ර පදනම් කරගත් විගණනය සිදු කරනු ලබයි.

මේ අනුව 2025 වාර්ෂික විගණන සැලැස්ම අනුව වර්ෂය තුළ පහත අරමුණු ඉටු කර ගැනීමට සමත්ව ඇත.

i. ආයතනයේ පවතින අභ්‍යන්තර පාලන ක්‍රමය ඇගයීමක් සිදු කර, පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට නිර්දේශ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීම

ii. විගණන සැලැස්මේ 70% ක ප්‍රගතියක් ළඟා කර ගැනීමට හැකිවීම

iii. වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීම

2.1.14. තොරතුරු තාක්ෂණ අංශය

හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවාවන් තොරතුරු තාක්ෂණය සමඟ ඒකාබද්ධ කර වඩාත් කාර්යක්ෂම කිරීම තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධාන අරමුණයි.

මේ සඳහා තොරතුරු තාක්ෂණ ඒකකය, දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය, අභ්‍යන්තර ජාල පද්ධතිය, ප්‍රතිලාභී කළමනාකරණ මොඩියුලය, මානව සම්පත් කළමනාකරණ පද්ධතිය, බැංකු ලිපි ද්‍රව්‍ය ගබඩාව සඳහා මෘදුකාංග පවත්වාගෙන යාමට, සහ සමෘද්ධි ඊ-බැංකු පද්ධතිය සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දෙයි.

මීට අමතරව, නිලධාරීන් වෙනුවෙන් තාක්ෂණික පුහුණු කිරීම් සිදු කිරීම, පරිගණක සහ උපාංග නඩත්තුව, ලංකා රාජ්‍ය ජාලය (LGN) කළමනාකරණය, සහ සියලු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) ප්‍රසම්පාදන කටයුතු සඳහා ද දායක වේ. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය පිළිබඳ වගකීම දරන මෙම ඒකකය, විවිධ ප්‍රතිසංස්කරණාත්මක ICT ව්‍යාපෘති සඳහා ද දායක වේ.

ක්‍රියාකාරකම්

1. සමෘද්ධි ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති පරිගණකගත කිරීම (පද්ධති පරිපාලනය: සමෘද්ධි ඊ-බැංකු පද්ධතිය පවත්වාගෙන යාම සහ කළමනාකරණය**,** තාක්ෂණික සහය: බැංකු සමිති පරිගණකගත කිරීම සහ පැනනගින තාක්ෂණික ගැටලු නිරාකරණය කිරීම**,** ධාරිතා සංවර්ධනය: නිලධාරීන් සඳහා උපදෙස් සහ ප්‍රායෝගික පුහුණුව ලබා දීම)
2. ප්‍රජා සවිබලගැන්වීමේ කළමනාකරණය සඳහා වන පරිගණක මෘදුකාංගය/ **empower IS (CRM)** පද්ධතිය සංවර්ධනය කර නඩත්තු කරමින් පවත්වාගෙන යාම සහ අවශ්‍ය **Hosting** පහසුකම සැපයීම.
3. ප්‍රජා සවිබලගැන්වීමේ කළමනාකරණය සඳහා වන පරිගණක මෘදුකාංගය සම්බන්ධයෙන් පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
4. සවිබලගැන්වීම සඳහා තෝරාගත් ප්‍රතිලාභීන්ගේ දත්ත **CRM** පද්ධතියට යාවත්කාලීන කිරීම සහ විශ්ලේෂණය කිරීම
5. දෙපාර්තමේන්තුවේ නව නිල වෙබ් අඩවිය සංවර්ධනය, නඩත්තු හා යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම. **https://dsd.samurdhi.gov.lk/**
6. පුහුණු මධ්‍යස්ථාන වෙන්කරවා ගැනීම සඳහා පද්ධතියක් සංවර්ධනය කිරීම **https://dsd.samurdhi.gov.lk/booking/**
7. නිලධාරීන්ගේ දත්ත කළමනාකරණය සඳහා මානව සම්පත් කළමනාකරණ මොඩියුලය **(HRM)** පවත්වාගෙන යාම. **https://hrm.esamurdhi.gov.lk/**
8. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ජාල පහසුකම් හා විද්‍යුත් තැපෑල පහසුකම් ලබාදීම.
9. විද්‍යුත් තැපෑල හා අන්තර්ජාලය ඔස්සේ දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ බෙදාහැරීම.
10. දෙපාර්තමේන්තුවේ අංශ සඳහා අවශ්‍ය දත්ත පද්ධති හා මෘදුකාංග සංවර්ධනය.
11. දෙපාර්තමේන්තුවේ දෘඪාංග හා ජාල පද්ධතිය **(Local Area Network)** නඩත්තුව.
12. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හීදී පුහුණුව ලබාදීම.

13. ප්‍රධාන කාර්යාලයේ පරිගණක සහ උපාංග දෝෂ නිරාකරණය
14. බැංකු ලිපි ද්‍රව්‍ය ගබඩාවේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා නව මෘදුකාංගයක් හඳුන්වා දීම.
15. ප්‍රජා හරසර වැඩසටහනට සහය වීම
16. ජාතික සවිබලගැන්වීමේ වැඩසටහන සම්බන්ධයෙන් දත්ත කළමනාකරණය සඳහා දිස්ත්‍රික්ක 25ක් සඳහා ගූගල් පෝරම සකස් කිරීම.
17. ආසියානු සංවර්ධන බැංකුවේ, ලෝක බැංකුවේ නියමු ව්‍යාපෘතිවල දත්ත කළමනාකරණයට සහාය වීම.
18. 2022 අගෝස්තු - දෙසැම්බර් **ADB** ණය යටතේ ගෙවීම් සම්බන්ධ වියදම් වාර්තා සකස් කිරීම. (සමෘද්ධි, වැඩිහිටි, වකුගඩු, ආබාධිත, ගර්භනී කාන්තාවන් සඳහා)
19. ප්‍රධාන කාර්යාලය සහ එහි අංශ සඳහා අවශ්‍ය මෘදුකාංග හා දෘඪාංග ප්‍රසම්පාදන ක්‍රියාවලියට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.
20. ප්‍රධාන කාර්යාලයේ අංශ මගින් සිදු කරන මාර්ගගත රැස්වීම් ආදිය **Zoom** මගින් පැවැත්වීමට අවශ්‍ය **(**Meeting scheduling**)** කළමනාකරණ, සම්බන්ධීකරණ හා තාක්ෂණික කාර්යයන් සිදු කර දීම.

සමෘද්ධි ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති පරිගණකගත කිරීම

- දිවයින පුරා පැතිරී ඇති සමෘද්ධි බැංකු 1097 හා සමිති 335 පරිගණකගත කිරීම සඳහා මෘදුකාංග සමාගම් දෙකක් දැනට තෝරාගෙන පළාත් 06 ක් සඳහා එක් මෘදුකාංගයකුත් පළාත් 03 ක් සඳහා අනෙක් මෘදුකාංගය වශයෙන් සියලු බැංකු පරිගණක ගත කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය සැපයීමට කටයුතු කිරීම**.**
- දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් සවිබලගැන්වීමේ ණය නිකුත් කිරීම සඳහා මෘදුකාංග **(Softwatch/ SLTS)** සංවර්ධනය කිරීම.
- බැංකු සංගම් විසින් නිකුත් කරන ලද නිලදරු ණය සඳහා සංශෝධිත පොලී අනුපාත භාවිතා කිරීම සඳහා බැංකු මෘදුකාංග **(Softwatch/ SLTS)** යාවත්කාලීන කිරීම.
- **Softwatch** බැංකු මෘදුකාංගයේ නව අනුවාදයක් **(new version)** නිකුත් කිරීම සම්බන්ධ කටයුතු සිදු කිරීම.
- **SLTS** බැංකු මෘදුකාංගය තුළ නව ණය මොඩියුලයක් සංවර්ධනය කරන ලද අතර ණය මොඩියුලය පිළිබඳව නිලධාරීන් සඳහා පුහුණු සැසි පවත්වන ලදී.
- සමාජ ආරක්ෂණ අංශයේ අවශ්‍යතාවය අනුව ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් කළ දැනුම් දීමට අනුව **'**සිප්දොර**'** ශිෂ්‍යත්ව අරමුදල් බැර කිරීම සහ වාර්තා පවත්වාගෙන යාම සඳහා මෘදුකාංග සංවර්ධනය කිරීම.
- රන් භාණ්ඩ උකස්ණය සමෘද්ධි බැංකුවල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංග සංවර්ධන කටයුතු සිදුකිරීම

මෙමගින් ලබා ගත් ආර්ථික ප්‍රතිඵල

- සියලුම සමෘද්ධි බැංකුවල කාර්යක්ෂමතාව ඉහළ මට්ටමකට පත් වීම.
- වාර්තාකරණය කාර්යක්ෂම වීම නිසා ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ කටයුතු කාර්යක්ෂම වීම හා පහසු වීම.
- සමෘද්ධි බැංකුවල ගනුදෙනුකරුවන්ට ප්‍රමාදයකින් තොරව බැංකු ගනුදෙනු සිදු කර ගැනීමට හැකි වීම සහ වසම හෝ නිවසේ සිටම බැංකු ගනුදෙනු සිදු කර ගැනීමට හැකි වීම නිසා පාරිභෝගිකයන්ට විශාල පිරිවැයක් සහ කාලය ඉතිරි කර ගැනීමට හැකි වීම.

- සමෘද්ධි බැංකු ගනුදෙනුකරුවන්ට විවිධාංගිකරණයකින් යුතුව නව බැංකු සේවාවන් හා සම්බන්ධ වීමට හැකි වීම.

ප්‍රජා සවිබලගැන්වීමේ කළමනාකරණය සඳහා වන පරිගණක මෘදුකාංගය/ Empower IS (CRM) **පද්ධතිය සංවර්ධනය හා පවත්වාගෙන යාම.**

- ප්‍රජා සවිබලගැන්වීමේ කළමනාකරණය සඳහා වන පරිගණක මෘදුකාංගය/ **Empower IS (CRM)** සංවර්ධනය කිරීම, නඩත්තු කරමින් පවත්වාගෙන යාම සහ අවශ්‍ය **Hosting** පහසුකම සැපයීම.
  https://crm.esamurdhi.gov.lk/signin

- ප්‍රජා සවිබලගැන්වීමේ කළමනාකරණය සඳහා වන පරිගණක මෘදුකාංගය/ **Empower IS (CRM)** සංවර්ධනය කිරීම, නඩත්තු කරමින් පවත්වාගෙන යාම සහ අවශ්‍ය **Hosting** පහසුකම සැපයීම.

- අදියර **I** හි සංවර්ධන කටයුතු නිම කිරීම
  - අස්වැසුම ප්‍රතිලාභී දත්ත **Empower IS (CRM)** පද්ධතියට ඒකාබද්ධ කිරීම සඳහා API සංවර්ධනය කිරීම.
  - කාණ්ඩය, දරිද්‍රතා දර්ශකය, වසම් මට්ටම ආදිය මත පදනම්ව දත්ත පෙරහන් සංවර්ධනය කිරීම.
  - පවුල් දත්ත එකතු කිරීමේ පෝරමයක් නිර්මාණය කිරීම.
  - පවුල් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම.
  - අවම වශයෙන් වාර්තා 10 ක් ජනනය කිරීමට හැකි ලෙස අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම.

- අදියර **II** - ප්‍රජා බලගැන්වීමේ වැඩසටහන සඳහා **Empower IS (CRM)** පද්ධති යාවත්කාලීන කිරීම

  - ව්‍යාපෘති ප්‍රගති ඇගයීමේ පෝරමය
  - මාසික අධීක්ෂණ පෝරමය
  - ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති තේරීම සඳහා තොරතුරු එකතු කිරීමේ පත්‍රිකාව ඉල්ලීම් අනුව සිදු කරන ලද පද්ධති වැඩිදියුණු කිරීම්
    - බලගැන්වීමේ මානය
    - ජීවනෝපාය "වෙනත්" විකල්පය
    - ජීවනෝපාය කාණ්ඩ යාවත්කාලීන කිරීම
    - රැකියා පහසුකම් සැපයීම - වෘත්තීය පුහුණුව

ප්‍රජා සවිබලගැන්වීමේ කළමනාකරණය සඳහා වන පරිගණක මෘදුකාංගය සම්බන්ධයෙන් පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- ප්‍රතිලාභී දත්ත සැකසීම සහ **Empower IS (CRM)**පද්ධතිය පිළිබඳව දිස්ත්‍රික් මට්ටමේ තොරතුරු තාක්ෂණ නිලධාරීන් (**A+** නිලධාරීන්) පුහුණුකරුවන් (**TOT**) ලෙස පුහුණු කිරීම.

2025.09.23, 24 දිනයන්හිදී සමනල වැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේදී නිලධාරීන් 110 ක් වෙත පහත දැක්වෙන ලෙස පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී.

- සවිබලගැන්වීම සඳහා අස්වැසුම් ප්‍රතිලාභීන් හඳුනා ගැනීම.
- හඳුනාගත් ප්‍රතිලාභීන්ගේ යාවත්කාලීන තොරතුරු, පද්ධතියේ පවත්වාගෙන යාම.
- ලෝක බැංකු(**WB),** ආසියානු සංවර්ධන බැංකු(**ADB)** හා ජාතික වැඩසටහන(**NP)** ලෙස වෙන වෙනම වැඩසටහන් තොරතුරු ලබා ගැනීම
- සමෘද්ධි ප්‍රතිලාභීන් හා අස්වැසුම ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම් සම්බන්ධයෙන් අවශ්‍ය වාර්තා ලබා ගැනීම.
- පරිගණක උපාංග මිළ දී ගැනීමේ දී අදාළ පිරිවිතර සැකසීම හා ඇගයීම් වාර්තා සකස් කිරීම.
- පුද්ගලික දත්ත ආරක්ෂණය සම්බන්ධව දැනුවත් කිරීම.

- ප්‍රතිලාභී දත්ත සැකසීම සහ **Empower IS (CRM)** පද්ධතිය පිළිබඳව වසම් නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කිරීම.

  - ප්‍රජා සවිබලගැන්වීම කළමනාකරණය සඳහා වන පරිගණක මෘදුකාංගය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ඇස්තමේන්තු කැඳවීම.
  - ඒ අනුව නිලධාරීන් 12,303 ක පිරිසක් සහභාගි කරවමින් දිස්ත්‍රික්ක 25 හි පුහුණු වැඩසටහන් 136 ක් පැවැත්වීමට ඇස්තමේන්තු ලැබුණි.
  - අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
  - දිස්ත්‍රික්ක 18 ක තොරතුරු තාක්ෂණ (**A+**) නිලධාරීන් සඳහා ප්‍රජා සවිබලගැන්වීමේ කළමනාකරණ වැඩසටහන සඳහා පරිගණක මෘදුකාංග වෙත ප්‍රවේශ වීම සඳහා පරිශීලක පිවිසුම් නිර්මාණය කිරීම.

තෝරාගත් ප්‍රතිලාභීන්ගේ දත්ත Empower IS (CRM) **පද්ධතියට යාවත්කාලීන කිරීම සහ විශ්ලේෂණය කිරීම**

පද්ධතියට දත්ත ඇතුළත් කිරීමේ කාර්යය නොවැම්බර් මස අග සිට ආරම්භ කර ඇත. ඒ අනුව 2025 වර්ෂය තුළ ප්‍රතිලාභී දත්ත 4,218 ක ප්‍රමාණයක් පද්ධතියට ඇතුළත් කර ඇත.

දෙපාර්තමේන්තුවේ නව නිල වෙබ් අඩවිය සංවර්ධනය සහ යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම.

දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (https://dsd.samurdhi.gov.lk/) සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, යාවත්කාලීන කිරීම සහ කළමනාකරණය කිරීම මෙහිදී සිදු කෙරේ. තවද, දෙපාර්තමේන්තු කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා නිකුත් කරනු ලබන චක්‍රලේඛ, නිවේදන සහ ලිපි ලේඛන කඩිනමින් නිලධාරීන් අතර බෙදාහැරීමේ මධ්‍යගත පද්ධතිය ලෙසද මෙය ක්‍රියා කරයි.

පුහුණු මධ්‍යස්ථාන වෙන්කරවා ගැනීම සඳහා පද්ධතිය සංවර්ධනය කිරීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් පුහුණු මධ්‍යස්ථානවල නවාතැන් ගැනීමට අදාළ වෙන්කිරීම් පද්ධතියක් හරහා on-line (https://dsd.samurdhi.gov.lk/booking/) ආකාරයට සිදු කරගැනීමේ පහසුකම ලබා දීම සඳහා නව පද්ධතියක් සංවර්ධනය කිරීම.

HRM **මොඩියුලය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම**

මානව සම්පත් කළමනාකරණ මොඩියුලය පහත සඳහන් කාර්යන් සිදු කිරීමට හැකි වන ලෙස සංවර්ධනය කර ඇත.

- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 25,000කට ආසන්න සේවකයන් පෞද්ගලික හා රාජකාරි තොරතුරු ඇතුළත් කිරීම.
- පද්ධතිය තුළින් එම සේවකයන් සඳහා රාජකාරි හැඳුනුම්පතක් නිකුත් කිරීමට අවශ්‍ය තොරතුරු රැස් කිරීම.
- දෙපාර්තමේන්තුගත නිලධාරීන් පෞද්ගලික ලිපිගොනුවේ ලේඛන scan කර පද්ධතියට upload කිරීම.
- එම upload කරන ලේඛන තුළින් දෙපාර්තමේන්තුගත නිලධාරීන් සඳහා විශ්‍රාම ලිපි ගොනුවක් පද්ධතිය තුළින් සකස් කිරීම සහ ඒ ඒ වර්ෂයේ අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම යන නිලධාරින්ගේ තොරතුරු ඇතුළත් වාර්තාවක් පද්ධතියේ ඇතුළත් කිරීම.
- මෙය ප්‍රධාන කාර්යාලයේ, සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අංශවලින් හා මූලස්ථාන කාර්යාල වලින් ක්‍රියාත්මක කරනු ලැබේ.

වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින්,

- ප්‍රමාදයකින් තොරව සේවක ගැටළු විසඳීමට හැකි වීම
- කාර්යාල කටයුතුවල කාර්යක්ෂමතාවය ඉහළ යාම.
- නිලධාරින් විශ්‍රාම යාමේදී විශ්‍රාම ගොනුවට අවශ්‍ය ලේඛන සහිත නිවැරදි ගොනුවක් සකස් කිරීම.
- නිවැරදි සහ යාවත්කාලීන දත්ත පහසුවෙන් ලබා ගත හැකි වීම බලාපොරොත්තු වේ.

ප්‍රජා හරසර වැඩසටහනට සහය වීම

- උත්සවය සඳහා ආරාධනා පත්‍රය නිර්මාණය කිරීම (දෘඪ)
- විද්‍යුත් ආරාධනා පත්‍රය නිර්මාණය කිරීම (සජීවිකරණ)
- සහතිකය නිර්මාණය
- උත්සවය සඳහා තේමාව සහ කලා කෘති නිර්මාණය කිරීම සඳහා සහය වීම
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නව නිල වෙබ් අඩවිය දියත් කිරීම, ව්‍යවසායක තොරතුරු ඇතුළත් **e -** ග්‍රන්ථය එළි දැක්වීම

2.1.15. මාධ්‍ය අංශය

හැඳින්වීම

2030 වසර වන විට දුගී බවෙන් තොර, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර, ඊට අදාළව දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ජනතාව අතරට ගෙනයාම මාධ්‍ය අංශයේ මූලික අරමුණ වේ.

1. සමෘද්ධි උදානය රූපවාහිනී වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
2. සමෘද්ධි **e** පුවත්පත සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ඉදිරිපත් කිරීම.
3. සමෘද්ධි අන්තර්ජාල රේඩියෝව ක්‍රියාත්මක කිරීම.
4. ප්‍රාදේශීය සමෘද්ධි සන්නිවේදක වැඩමුළු පැවැත්වීම.
5. ඡායාරූප මුද්‍රණය සහ මාධ්‍ය සංචාර සිදු කිරීම.

“සමෘද්ධි fm” අන්තර්ජාල ගුවන් විදුලිය **වැය වූ මුදල - රු.537,600.00**

සමෘද්ධි fm අන්තර්ජාල රේඩියෝව samurdhifm.lk අන්තර්ජාල යෙදුමෙන් හා samurdhi fm app එක මගින් ශ්‍රවණය කළ හැක. 2025 වර්ෂයේ දෙසැම්බර් මස මෙය නැවත ආරම්භ කිරීමට කටයුතු කළ අතර මේ දක්වා එය පර්යේෂණ විකාශන මට්ටමේ ඇත. 2026 වර්ෂයේ නව වැඩසටහන් ආරම්භ කිරීමට නියමිතය.

“ ප්‍රජා හරසර ” වැඩසටහනේ මාධ්‍ය ආවරණ කටයුතු **වැය වූ මුදල - රු.593,465.00**

ක්ෂුද්‍ර මූල්‍ය අංශය හා ප්‍රජාමූල, ක්‍රීඩා අංශය මගින් 2025 වර්ෂයේ මුළු දිවයිනම ආවරණය වන පරිදි නිලධාරීන් හා ප්‍රජා නායකයින් ඇගයීමේ උත්සවයේ පහත සඳහන් මාධ්‍ය ආවරණ කටයුතු සඳහා වැය දරා ඇත.

- පුවත්පත් දැන්වීම් පළ කිරීම රු.568,465.00
- නිවේදන කටයුතු <u>රු. 25,0000.00</u>

<u>රු.593,465.00</u>

සමෘද්ධි සන්නිවේදකයින් පුහුණු කිරීම **වැය වූ මුදල - රු.559,000.00**

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම එක් නිලධාරියෙක් වශයෙන් දිවයින පුරා තෝරාගත් නිලධාරීන් 314 දෙනෙකු පුහුණු වැඩසටහන් සඳහා සහභාගි විය. මෙම පුහුණු වැඩසටහන් අප දෙපාර්තමේන්තුවට අයත් නිල්ලඹ, නිලාවේලි හා සමනල වැව යන පුහුණු මධ්‍යස්ථානයන්හිදී පවත්වන ලදී.

“ ව්‍යවසායක ශක්ති ” රූපවාහිනී වැඩසටහන **වැය වූ මුදල - රු.27,440.00**

සමෘද්ධි බැංකු මගින් ණය ලබාගත් සාර්ථක ව්‍යවසායකයින් තෝරා ඔවුන් එය සාර්ථක කරගත් ආකාරය දැක්වෙන විනාඩි 30 වීඩියෝ පටයක් PEO TV අංක 125 I TV නාලිකාව මගින් විකාශය කිරීම. මෙහි විකාශනය මුදල් අය කිරීමකින් තොරව සිදු වූ අතර රූගත කිරීම් සිදු කරන අවස්ථාවන්හිදී නවාතැන් ගාස්තු වෙනුවෙන් වැය දරණ ලදී. මෙහි සම්බන්ධීකරණ කටයුතු අප අංශය මගින් සිදු කරන ලදී.

2.1.16. මානව සම්පත් සංවර්ධන අංශය

හැඳින්වීම

රාජ්‍ය ආයතන තුළ පවතින සම්පත් අතර ඉතා වටිනාම සම්පත "මානව සම්පත" වේ. නිසි ලෙස කළමනාකරණය කරමින් අනෙකුත් සම්පත්වලින් උපරිම ඵලදායිතාවක් ලැබෙන ලෙස මෙහෙය වීමේ වගකීම පැවැරී ඇත්තේ මානව සම්පත වෙතටයි. රාජ්‍ය නිලධාරීන් වන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, තම සේවාදායකයින්ට වඩාත් සමීප ලෙස කටයුතු කිරීමටත්, සංවර්ධන වැඩසටහන් සාර්ථකව ඉටු කිරීම සඳහාත් දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීමටත්, විෂයානුබද්ධ පුහුණුව ලබාදීම පෙරදැරි කරගෙන සියලුම කාර්ය මණ්ඩලය නියෝජනය වන පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මානව සම්පත් සංවර්ධන අංශයේ කාර්යභාරය වේ.

දිළිඳුකම පිටුදැකීමේ මූලික අරමුණ පදනම් කරගෙන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීමට උරදෙන දෙපාර්තමේන්තුවේ මානව සම්පත වන කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා සංවර්ධනය මෙන්ම ඒවා යාවත්කාලීන කිරීමට 2025 වර්ෂය තුළ විවිධ විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම පුහුණුව තුළින් සේවකයන් අභිප්‍රේරණය කිරීමත්, සමෘද්ධි දෙපාර්තමේන්තුවේ ආයතනික හා සාමාජීය අරමුණු ළඟා කර ගැනීමත් බලාපොරොත්තු වේ.

මානව සම්පත් සංවර්ධන අංශයේ දැක්ම සහ මෙහෙවර

දැක්ම

"වසර 2030 දී දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීම සඳහා සවිමත් මානව ප්‍රාග්ධනයක් බිහි කිරීම"

මෙහෙවර

"දිළිඳු ජනතාව සවිබල ගන්වා ඔවුන් ජාතික ආර්ථිකයට දායක කර ගැනීම සඳහා සමෘද්ධි නිලධාරීන්ට අවශ්‍යය දැනුම, කුසලතා සහ ධනාත්මක ආකල්පවලින් ශක්තිමත් මානව සම්පතක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ බිහි කිරීම"

අරමුණු:

- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ළඟාකර ගත හැකි වන පරිදි දක්ෂතා සහිත කාර්යය මණ්ඩලයක් බිහි කිරීම.
- නිවැරදි කළමනාකරණය තුළින් ධනාත්මක ආකල්පවලින් පරිපූර්ණ මානව සම්පතක් බිහි කිරීම.
- ඵලදායී හා කාර්යක්ෂම ගති ලක්ෂණවලින් යුත් කාර්යය මණ්ඩලයක් බවට පත් කිරීම.
- සියලුම කාර්යය මණ්ඩලය සුවිශේෂී දක්ෂතා ඇති මානව සම්පතක් බවට පත් කිරීම.
- සාර්ථක මැදිහත්කරුවන් ලෙස කටයුතු කරන පරිපූර්ණ සම්පත්දායක පිරිසක් බිහිකිරීම
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමස්ත ඉලක්ක සපුරාලීමට සහයවීම.

2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ලබා දීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මානව සම්පත සතු විෂයානුබද්ධ නිපුනතාවයන් එහි ආයතනික සංවර්ධනය කෙරෙහි තීරණාත්මක වන බැවින් ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල කාර්ය මණ්ඩලයේ කාර්යය සාධනය ඉහළ නංවමින් එදිනෙදා කටයුතු බාධාවකින් තොරව කාර්යක්ෂමව සහ ඵලදායීව කරගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය ධාරිතා සංවර්ධන පුහුණු අවස්ථාවන් ලබා දීමට 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන ලදී.

ඒ අනුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් නිලධාරීන්ට ලබා දීමට 2025 වර්ෂයේ වියදම් කර ඇති මුදල රුපියල් 3,713,509.00 කි.

සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා අවශ්‍යය මූලික පුහුණු කිරීම් සිදු කිරීම

අඩු ආදායම්ලාභීන් සවිබලගැන්වීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරය වේ. ඒ අනුව 2025 වර්ෂයේ සවිබලගැන්වීමේ ඉලක්ක ගත ප්‍රතිලාභීන්, නිශ්චිත කාලයක් තුළ සවිබලගැන්වීම සඳහා අවශ්‍යය තාක්ෂණික දැනුම එම කාර්යයේ නියැලී සිටින නිලධාරීන් වෙත ලබා දීම මානව සම්පත් සංවර්ධන අංශයේ පුහුණු වැඩසටහන්වල මූලික අරමුණ විය. ඒ අනුව 2025 වර්ෂය තුළ අස්වැසුම ප්‍රතිලාභී පවුල් 300,000 ක් හා අඩු ආදායම්ලාභී පවුල් 100,000 ක් ලෙස පවුල් 400,000 ක් සවිබලගැන්වීම සඳහා වාර්ෂික ඉලක්කයක් සම්පූර්ණ කිරීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන් බලගැන්වීම මානව සම්පත් සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. එමෙන්ම සවිබලගැන්වීමට මූලාශ්‍රයන් 3ක් යටතේ, එනම් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන, ආසියානු සංවර්ධන බැංකු (ADB) හදිසි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සහ ලෝක බැංකු (WB) සමාජ ආරක්ෂණ වැඩසටහන යන මූලාශ්‍ර මගින් මූල්‍ය ප්‍රතිපාදන සැපයූ අතර ඒ අනුව අදාළ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් පුහුණු කිරීම ක්ෂේත්‍ර කිහිපයක් යටතේ සිදු කරන ලදී.

1. අඩු ආදායම්ලාභී ප්‍රජාව **"**සවිබලගැන්වීමේ 2025 වැඩසටහන**"** පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම
2. පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳ ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම සහ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම
3. මනෝ සමාජීය ලෙස සවිබලගැන්වීම සඳහා ප්‍රධාන පුහුණුකරුවන් මගින් ප්‍රාදේශීය උපදේශන නිලධාරීන් පුහුණු කිරීම සහ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම
4. ව්‍යාපාර සැලසුම් සකස් කිරීම පිළිබඳ ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම සහ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම.

සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන සඳහා නිලධාරීන් පුහුණු කිරීමට භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 41.40 මුදලක් වෙන් වූ අතර ප්‍රධාන පුහුණුකරුවන් තෝරා ගැනීම, පුහුණු කිරීම් හා දැනුවත් කිරීම සඳහා යොදවන ලදී. ප්‍රධාන පුහුණුකරුවන් සඳහා ඉහත සඳහන් මාතෘකා යටතේ අවස්ථා 4 ක දී පුහුණුව ලබා දෙන ලදී. ඒ අනුව ප්‍රධාන පුහුණුකරුවන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක් අයෙකු වන සේ 334 දෙනෙකු සඳහා මූලික පුහුණුවක් ලබා දෙන ලදී. එමෙන්ම

දිස්ත්‍රික් මට්ටමේ දිස්ත්‍රික් නිලධාරීන් සහ ප්‍රාදේශීය මට්ටමේ කළමනාකරුවන්, සහ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම අවස්ථා 4 කදී සිදු කරන ලදී. පුහුණු කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් සංඛ්‍යාව 10,502 කි.

ආසියානු සංවර්ධන බැංකු (ADB) හදිසි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ අස්වැසුම් වැඩසටහනට අයත් ප්‍රතිලාභීන් සවිබලගැන්වීමට අදාළ මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

අස්වැසුම් වැඩසටහනට අයත් ප්‍රතිලාභීන් අතරින් සවිබලගැන්වීම සඳහා තෝරාගන්නා ප්‍රතිලාභීන්ගේ විභව ශක්තීන් හඳුනාගෙන ඔවුන්ට ජීවනෝපාය මාර්ග සකස් කරදී, ඔවුන් ආර්ථික වශයෙන් මෙන්ම මානසික, සමාජීය, සංස්කෘතික, දේශපාලනමය සහ නීතිමය ආදී වශයෙන් විවිධ අංශ යටතේ සවිබලගැන්වීම ආසියානු සංවර්ධන බැංකු (ADB) හදිසි ජීවනෝපාය සංවර්ධන වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. අසියානු සංවර්ධන බැංකු (ADB) හදිසි ජීවනෝපාය සංවර්ධන වැඩසටහනේ මූල්‍ය හා තාක්ෂණික අනුග්‍රහය යටතේ 2025 වර්ෂය තුළ පවුල් 12,800 ක් සවිබලගැන්වීමට ඉලක්ක කරන ලදී. මේ සඳහා තොරාගත් දිස්ත්‍රික්ක 13 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 64 ක සවිබලගැන්වීමේ වැඩ සටහන් ක්‍රියාත්මක වූ අතර මේ සඳහා සෘජු ලෙස සම්බන්ධ වන නිලධාරීන් පුහුණු මාදිලියන් අනුව පහත සඳහන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කළ සංඛ්‍යාව	වියදම් වූ මුදල (රු.)
01	මනෝ සමාජීය ලෙස සවිබලගැන්වීම සඳහා ප්‍රාදේශීය උපදේශන නිලධාරීන් පුහුණු කිරීම	43	270648.00
02	තිරසාර ජීවනෝපාය සංවර්ධනය පිළිබඳ පුහුණුව (Sustainable Livelihood Development	53	446717.00
03	ව්‍යාපාර සැලසුම් සකස් කිරීම පිළිබඳ පුහුණුව	52	435221.00
04	“ජීවනෝපාය ගැලැපීම්” පිළිබඳ පුහුණුව (Livelihood Machine)	61	399458.00
05	“නායකත්ව සංවර්ධනය සහ මූල්‍ය සාක්ෂරතාවය” (Leadership Development and Financial Literacy)	79	773476.00

ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකු හදිසි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක වන ඉහත පුහුණුකරුවන් මගින් ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීමට කටයුතු කරන ලදී. ඉහත විෂයන්වලට අදාළව දිළිඳුකම පිටුදැකීමේ නව ප්‍රවේශයන්, ව්‍යාපෘති සහ වැඩසටහන් අධීක්ෂණය, ඉලක්ක සහ තෝරාගත් ප්‍රතිලාභීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා නව තාක්ෂණය යොදා ගැනීම පිළිබඳවත් පුහුණු කරන ලදී. එමෙන්ම දිස්ත්‍රික්ක 13 ක ව්‍යාපෘති කළමනාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී.

සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම සහ පවත්වාගෙනයාම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් මානව සම්පත් සංවර්ධන අංශය මගින් පාලනය වන පුහුණු මාතර, සමනළ වැව සහ නිල්ලඹ පිහිටි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන ප්‍රධාන වශයෙන්

දෙපාර්තමේන්තුවේ 25,000 ක් වන කාර්යය මණ්ඩල පුහුණු කිරීම සඳහා යොදාගනු ලබන අතර වෙනත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු හා වැඩමුළු සඳහා යොදාගනු ලැබේ. මෙම මධ්‍යස්ථානවල අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදු කිරීම මෙන්ම තාක්ෂණික උපකරණ සහ නේවාසිකාගාර පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී. 2025 වර්ෂය තුළ ආසියානු සංවර්ධන බැංකු අරමුදලේ ප්‍රතිපාදන මත රුපියල් මිලියන 32.52 ක මුදලක් වියදම් කර ඇත.

අනු. අංකය	පුහුණු මධ්‍යස්ථානය	ඉදිකිරීම් හා ලබාගත් උපකරණ	වියදම් කළ මුදල (රු.)
01	මාතර	නාන කාමර ඉදි කිරීම	1,696,598.78
02	නිල්ලඹ	පිවිසුම් මග අලුත්වැඩියා කිරීම	3,523,712.05
		ප්‍රධාන ශාලාව අලුත්වැඩියා කිරීම	1,294,960.78
		නාන කාමර ඉදිකිරීම	188,229.40
		කෑම කාමර සිවිලිම හා නාන කාමර ඉදිකිරීම	1,153,052.30
03	සමනල වැව	පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල තීන්ත ආලේප කිරීම	1,904,762.00
		පුහුණු මධ්‍යස්ථානය අලුත්වැඩියාව	1,084,457.39
		වැසිකිලි හා නාන කාමර වැඩිදියුණු කිරීම	3,394,813.03
		වැසිකිලි හා නාන කාමර ඉදිකිරීම	2,658,971.77

උසස් අධ්‍යයනය සහ වෘත්තීය පාඨමාලා හදාරන නිලධාරීන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සහ පාඨමාලා ගාස්තු ගෙවීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ වෘත්තීය කුසලතා වර්ධනය කිරීම සඳහා උසස් අධ්‍යාපන පාඨමාලා සහ වෘත්තීය පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා උනන්දු කරවීමේ අරමුණින් නිලධාරීන් විසින් පෞද්ගලිකව තෝරාගෙන හදාරනු ලබන පාඨමාලා සඳහා පාඨමාලා ගාස්තු ගෙවන ලදී.

ඒ අනුව දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරීන් විසින්, සමෘද්ධි වැඩසටහනේ මූලික අරමුණට සහ අදාළ තනතුරේ කාර්යභාරයන් වඩාත් ඵලදායීව ඉටුකිරීමට සෘජුව දායක වන, රජයේ විශ්වවිද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගනු ලබන ආයතනවල පාඨමාලා තෝරාගනු ලැබ ඇති අවස්ථාවල එම දේශීය හා විදේශීය පාඨමාලා සඳහා, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා දෙපාර්තමේන්තු වල රාජ්‍ය නිලධාරීන්ට අදාළ වන්නා වූ අනෙකුත් විධිවිධාන වලට සහ සමෘද්ධි ජාතික සභාව විසින් අනුමත කරන ලද නිර්නායක වලට අනුකූල වන පාඨමාලා සඳහා මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2025 වර්ෂය තුළ මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 23 දෙනෙකු විසින් කරන ලද ඉල්ලීම් අනුව දේශීය පාඨමාලා සඳහා වියදම් කරන ලද මුදල රුපියල් 1,664,750 කි.

සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සමාජ වැඩ පිළිබඳ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ජාතික සමාජ සංවර්ධන ආයතනය(NISD) හා ඒකාබද්ධව පවත්වනු ලැබූ

සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවේ කටයුතු 2025 වසරේ අවසන් කරන ලද අතර සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවය 2026.01.07 දින ජාතික සමාජ සංවර්ධන ආයතනයේ දී පවත්වන ලදී.

ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අරමුදල්

ගිණුම්කරණය සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ හා ව්‍යාපාර අධ්‍යයනය ආයතනය (CMA) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මෙම සහතික පත්‍ර පාඨමාලාව පවත්වන අතර රාජ්‍ය හා පෞද්ගලික බැංකු වල අනුගමනය කරනු ලබන කළමනාකරණය, ගිණුම්කරණය, බැංකුකරණය ඇතුළු අනෙකුත් සම්මත ගිණුම් ක්‍රම පිළිබඳ දැනුම සහ පුහුණුව ලබා මෙම වැඩසටහනේ අරමුණ වේ. ඒ තුළින් සමෘද්ධි බැංකු පද්ධතිය වඩාත් කාර්යක්ෂම හා සඵලදායී තත්ත්වයට පත් කිරීමේ අරමුණින් දේශීය හා ජාත්‍යන්තරව පිළිගත් විෂය නිර්දේශයන් යටතේ ඉහත පුහුණු වැඩසටහන දින 06 ක් පුරා නේවාසිකව පවත්වනු ලැබේ. ඒ අනුව 2025 වසර තුළ ගිණුම්කරණය සහ ව්‍යාපාර අධ්‍යයන සහතික පත්‍ර පාඨමාලා 3ක් පැවැත්වූ අතර නිලධාරීන් 177 දෙනෙකු පුහුණු කරන ලදී.

දිස්ත්‍රික්කවල සේවය කරන අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු කිරීම පිළිබඳ විස්තර

අනු. අංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන	මුදල (රු.)	පුහුණුලාභීන් සංඛ්‍යාව
01	කෑගල්ල	නායකත්ව හා ආකල්ප සංවර්ධනය	67,125.00	83
02	කළුතර	විශ්‍රාම ගැන්වීමට අදාළ දැනුම	70,000.00	52
03	කුරුණෑගල	විනය කළමනාකරණ පුහුණුව, විශ්‍රාම වැටුප් ලිපිගොනු සැකසීම, විනය කළමනාකරණ පුහුණුව	301,940.00	317
04	රත්නපුර	ආකල්ප සංවර්ධනය, ලිපිගොනු කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, කාර්යාල හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මානසික සවිබලගැන්වීම	86,180.00	124
05	අනුරාධපුරය	කාර්යාල කළමනාකරණය හා කාර්යාල ක්‍රම, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර සැලසුම් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	254,020.00	195
06	වව්නියා	ධනාත්මක සංවර්ධන ආකල්ප, විශ්‍රාම වැටුප් සම්බන්ධ පුහුණුව	227,000.00	202
07	මුලතිව්	ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණුව	149,810.00	160
08	යාපනය	විශ්‍රාම වැටුප් කළමනාකරණය හා කාල කළමනාකරණය	186,000.00	120
09	මඩකළපුව	ආයතන සංග්‍රහය (නිවාඩු, පෞද්ගලික ලිපිගොනු, විශ්‍රාම සහ විනය පරිපාටි)	58,096.00	48
10	බදුල්ල	ආකල්ප කුසලතා සංවර්ධන වැඩසටහන, ප්‍රජාමූල සංවිධානවල ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව	117,200	80
11	ගම්පහ	නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, කාර්යාල කළමනාකරණය හා ලිපිගොනුකරණය, ගිණුම් ක්‍රියාවලිය හා ගබඩාකරණය, විනය කාර්ය පිළිබඳ මූල්‍ය ප්‍රකාශ සැකසීම පිළිබඳ පුහුණුව	150,000.00	210
12	මහනුවර	වැටුප් පරිවර්තන සැකසීම / විශ්‍රාම ගොනු සැකසීම/අග්‍රහාර අයදුම්පත් නිවැරදිව යැවීම.	114,335.00	198
13	නුවරඑළිය	සවිබලගැන්වීමේ වැඩසටහනට සම්බන්ධ ප්‍රතිලාභීන්ට බැංකු ණය ලබාදීමට අදාළ ව්‍යාපෘති වාර්තා සකස් කිරීම සහ ධනාත්මක චින්තනය පිළිබඳ පුහුණුව / ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පුහුණුව	200,000.00	160
14	කිලිනොච්චි	ආයතන සංග්‍රහය / ව්‍යාපෘති ක්‍රියාකාරකම්/පරිගණක පුහුණුව/ධාරිතා සංවර්ධනය	183,210.00	104
15	ගාල්ල	ආයතන කටයුතු හා මුදල් රෙගුලාසි වැටුප් සැකසීම, වැටුප් සාරාංශ සැකසීම, විශ්‍රාම ගොණු සැකසීම.	121,392.00	174
16	කොළඹ	විනය කාර්ය පටිපාටිය හා රාජ්‍ය සේවයේ ආචාර ධර්ම MS Office Training	120,750.00	53
17	පොලොන්නරුව	කාර්යාල ක්‍රමවේදය පිළිබඳ පුහුණුව / ආකල්ප සංවර්ධනය	185,487.00	187
18	හම්බන්තොට	ආයතනික ගිණුම් පුහුණුව/ITMIS පුහුණුව/කාර්යාල කළමනාකරණය හා ආයතන ක්‍රම පිළිබඳ පුහුණුව	82,740.00	43
19	මාතලේ	ජීවනෝපාය ව්‍යාපෘතිකරණය / විශ්‍රාම ගොනු සැකසීම	77,095.00	90

අනු. අංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන		මුදල (රු.)	පුහුණුලාභීන් සංඛ්‍යාව
20	ත්‍රිකුණාමලය	බැංකු මාර්ගගත හා ගිණුම් ක්‍රියාවලි පුහුණුව/ආයතන කටයුතු පුහුණුව		84,006.00	100
21	මාතර	ආකල්ප සංවර්ධන/ ඵලදායිතා සංවර්ධනය		170,020.00	225
22	මන්නාරම	Online බැංකු ගිණුම් පුහුණුව/ කාර්යක්ෂමතා කඩඉම් හා මුදල් රෙගුලාසි		154,800.00	120
23	පුත්තලම	කාර්යාල ක්‍රම/ව්‍යාපෘති වාර්තා සකස් කිරීම/ ධාරිතා සංවර්ධනය		253,680.00	112
24	කළුතර, කොළඹ, ගම්පහ, කෑගල්ල, පුත්තලම		දිස්ත්‍රික් අභ්‍යන්තර විගණන නිලධාරීන් පුහුණු කිරීම	71,325.00	82
25	මාතර, ගාල්ල, හම්බන්තොට		දිස්ත්‍රික් අභ්‍යන්තර විගණන නිලධාරීන් පුහුණු කිරීම	53,877.50	56
26	අනුරාධපුර, පොලොන්නරුව		දිස්ත්‍රික් අභ්‍යන්තර විගණන නිලධාරීන් පුහුණු කිරීම	42,920.00	33
27	යාපනය, මන්නාරම, කිලිනොච්චි, මුලතිව්		දිස්ත්‍රික් අභ්‍යන්තර විගණන නිලධාරීන් පුහුණු කිරීම	57,900.00	40
28	ත්‍රිකුණාමලය, මඩකළපුව, අම්පාර (දමිළ)		දිස්ත්‍රික් අභ්‍යන්තර විගණන නිලධාරීන් පුහුණු කිරීම	72,600.00	44
				3,713,508.50	3412

ප්‍රධාන කාර්යාලයේ සේවය කරන අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු කිරීම පිළිබඳ විස්තර

අනු. අංකය	අංශය	වැඩසටහන	මුදල (රු.)	පුහුණුලාභීන් සංඛ්‍යාව
01	විමර්ශන	මූලික විමර්ශන නිලධාරියාගේ කාර්යභාරය, ඇතිවන ගැටළු, මූලික විමර්ශන වාර්තාවල දක්නට ලැබෙන අඩුපාඩු, චෝදනා පත්‍ර කෙටුම්පත් කිරීම පිළිබඳ පුහුණුව	483,653.00	87
02	ආයතන/පාලන	පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම, වැටුප් පරිවර්තනය	250,085.00	55
03	මාධ්‍ය (වැඩසටහන්- 02)	ප්‍රාදේශීය සමෘද්ධි සන්නිවේදකයින් සඳහා, රූපවාහිනී මාධ්‍ය, සමාජ මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය පිළිබඳව විධිමත් පුහුණුවක් ලබාදීම.	931,410.00	200
04	විශ්‍රාම වැටුප්	විශ්‍රාම වැටුප් ලිපිගොනුවක් ආරම්භ කිරීම, විශ්‍රාම වැටුප් ලිපිගොනුවක තිබිය යුතු මූලික ලේඛන	64,622.00	78
එකතුව			1,729,770.00	420

ආසියානු සංවර්ධන බැංකු (ADB) හදිසි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ පැවැත් වූ පුහුණු වැඩසටහන් වාර්තාව – 2025

අනු. අංකය	පුහුණු වැඩසටහනේ නම	දිනය	පැමිණීම් සංඛ්‍යාව	වියදම
1	"ජීවනෝපාය ව්‍යාපෘති ගැලපීම" පිළිබඳ ප්‍රධාන පුහුණුකරුවන් (TOT) සඳහා සිංහල මාධ්‍ය පුහුණුව නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය	2025.04.03/04	37	399,458.00
2	"ජීවනෝපාය ව්‍යාපෘති ගැලපීම" දෙමළ මාධ්‍යය පිළිබඳ ප්‍රධාන පුහුණුකරුවන් (TOT) පුහුණු කිරීම නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය	2025.04.03/04	24	
3	ව්‍යාපාර ධාරිතා සංවර්ධනය පිළිබඳ ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය	2025.06.18-19	35	279,586.50
4	ව්‍යාපාර ධාරිතා සංවර්ධනය පිළිබඳ මාස්ටර් පුහුණුකරුවන් පුහුණු කිරීම - දෙමළ මාධ්‍ය නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය	2025.06.26/27	20	154,700.00
5	නිරසාර ජීවනෝපාය සංවර්ධනය පිළිබඳ ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය	2025 08.06/07	35	272,362.00
6	“නිරසාර ජීවනෝපාය සංවර්ධනය (දෙමළ) පිළිබඳ ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය	2025.08.18/19	14	174,355.55
7	නායකත්ව සංවර්ධනය සහ මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ පුහුණුව නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය	2025.10.13/14 /15/16/17	52	511,919.50
8	නායකත්ව සංවර්ධනය සහ මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ පුහුණුව - දෙමළ මාධ්‍ය නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය	2025.10.30 to 2025.11.1/2	27	261,557.50
	එකතුව			2,053,939.05

2.1.17. සමාජ ආරක්ෂණ හා සුබසාධන අංශය

හැඳින්වීම (Introduction)

තිරසර හා උසස් ජීවන මට්ටමක් අත්කරදීම සඳහා අඩු ආදායම්ලාභී පවුල් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ දී ආර්ථික, සාමාජීය හා මානසික වශයෙන් සවිබලගැන්වීම පරමාර්ථය කරගනිමින්, සමෘද්ධි සහනාධාරලාභීන්ව සිටි අඩු ආදායම්ලාභී පවුල් වල ජීවන මට්ටම උසස් කිරීම සඳහා සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලය විසින් දෙනු ලබන උපදෙස් හා අනුමැතින් ප්‍රකාරව සමෘද්ධි සමාජ භාරකාර අරමුදල ක්‍රියාත්මක කිරීම හා සමස්ථ ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහනට සමගාමීව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත අංශයකි.

දැක්ම (Vision)

"තිරසාර ප්‍රජා සවිබලගැන්වීමේ සහ සමාජ ආරක්ෂණ ක්‍රමවේද ඔස්සේ, රජයේ ප්‍රතිලාභ ලබන ප්‍රජාව උසස් ජීවන මට්ටමක් සහිත ස්වයංපෝෂිත ප්‍රජාවක් බවට පත් කිරීම."

මෙහෙවර (Mission)

"සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලයේ මහපෙන්වීම යටතේ, සමාජ භාරකාර අරමුදල මගින් අඩු ආදායම්ලාභී පවුල් නිශ්චිත කාලයක් තුළ සවිබල ගන්වීමේ දෙපාර්තමේන්තු කාර්යභාරයට සහාය වීමෙන්, ඔවුන් ජාතික සංවර්ධනයේ ක්‍රියාකාරී හවුල්කරුවන් බවට පත් කිරීම."

කාර්ය මණ්ඩලය

අංශ ප්‍රධානී - අධ්‍යක්ෂ - එච්. කේ. රණවීර මයා
ගණකාධිකාරී - 01 (කොන්ත්‍රාත් පදනම මත)
සමෘද්ධි කළමනාකරු- 01
ප්‍රධාන ලිපිකරු - 01
කළමනාකරණ සහකාර (තාක්ෂණ) - 01
කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) - 01
සමෘද්ධි සංවර්ධන නිලධාරී - 05
කාර්යාල කාර්ය සහායක - 01

සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල
ඉලක්ක හා අරමුණු

- ස්වකීය ජීවන තත්ත්වය කිසියම් හෝ ආකාරයකින් අවගමනය වීමට ඉතා ආසන්න සුදුසු පවුල්වලට එකී අවගමනයට එරෙහිව ආරක්ෂණ පියවරක් ලෙස මූල්‍යාධාර සැපයීම.
- රටේ සමස්ථ සංවර්ධන ක්‍රියාවලියේ කොටස්කරුවන් ලෙස සංවිධානගත කිරීමට දිළිඳු ජනතාවගේ සිතුම් පැතුම් ප්‍රගතිශීලිව වෙනස් කරමින් ඔවුන්ගේ ආකල්ප යලි සකස් කිරීම.
- රට තුළ ශක්තිමත් සමාජ ආරක්ෂණ පරිසරයක් සකස් කිරීමට සංවිධානගත සමූහ දායකත්වය ප්‍රවර්ධනය කිරීම.
- දිළිඳු ජනතාවගේ සමස්ථ සමාජ ආර්ථික තත්ත්වය නංවමින් ඔවුන්ගේ සෞඛ්‍ය පෝෂණ දර්ශක ඉහළ නැංවීම.

පාලනය, පරිපාලනය හා කළමනාකරණය

මෙම අරමුදල සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන අතර නිල බලයෙන් හා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් විසින් පාලනය, පරිපාලනය හා කළමනාකරණය සිදු කරනු ලබයි.

භාරකාර මණ්ඩල සංයුතිය හා වර්තමාන භාරකාර මණ්ඩලය
අනුශාසක - විෂය භාර අමාත්‍යවරයා
නිල සාමාජිකයන්

- සභාපති - අරමුදල අයත් දෙපාර්තමේන්තු ප්‍රධානියා
- අරමුදල අයත් අමාත්‍යාංශ ලේකම්ගේ අනුයෝජිත
- මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුයෝජිත
- ප්‍රතිපත්ති සම්පාදක, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුයෝජිත
- සමාජ ආරක්ෂණ අංශයේ අධ්‍යක්ෂවරයා.

නිල බලයෙන් පත්කළ සාමාජිකයින් (06)

අනු. අංකය	භාරකාර මණ්ඩලයේ දරන තනතුර	නම හා තනතුර	රාජකාරි ලිපිනය
01	සභාපති	සී.ඩී.කළුආරච්චි මහතා අධ්‍යක්ෂ ජනරාල්	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, 4 වන මහල, සෙත්සිරිපාය.
02	සාමාජික	එච්.ටී.ආර්. නාලිකා පියසේන මිය අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන)	ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය
03	සාමාජික	එච්.එම්.එම්.යූ.බී. හේරත් මහතා අතිරේක ලේකම් (ග්‍රාම සංවර්ධන)	ග්‍රාම සංවර්ධන කාර්යාංශය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය.
04	සාමාජික	එච්.කේ.රණවීර මහතා අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ හා සුබසාධන)	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, 4 වන මහල, සෙත්සිරිපාය.
05	සාමාජික	කේ.ඩි.අයි.එස්.කේ. සිරිවර්ධන මිය අධ්‍යක්ෂ	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය.
06	සාමාජික	බී.කේ.සී ජයසිංහ මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය.

විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කළ සාමාජිකයින් (05)

අනු. අංකය	නම
01	මහාචාර්ය කිංස්ලි කරුණාරත්න මහතා
02	ආචාර්ය ඩබ්.අයි.සී.එස්. ගුණසිංහ මහතා
03	ටී.පී.එස්.එල්.එස්. ඉන්දික පෙරේරා මහතා
04	ජී. කුසල් ද සිල්වා මහතා
05	පී.ඒ. විජේරත්න මහතා

අරමුදල මගින් ක්‍රියාත්මක වැඩසටහන්

- අරමුදලේ අතිරික්ත මුදල් රජයේ අනුමත වාණිජ බැංකුවල ආයෝජනය
- සමෘද්ධි සහනාධාර ලබමින් සිට අස්වැසුම ප්‍රතිලාභ සඳහා තේරී පත් නොවූ පවුල්වල උසස් පෙළ හදාරන දරුවන් වෙනුවෙන් සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- සමෘද්ධි සහනාධාර ලබමින් සිටි අස්වැසුම ප්‍රතිලාභ හිමි හෝ අහිමි තෝරා ගත් පවුල්වල ජීවනෝපය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ප්‍රජාව සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ බහුමාන දරිද්‍රතාවය ඉහළ අගයක් ගන්නා ගම්මාන සංවර්ධන වැඩසටහන අනුව සමෘද්ධි ප්‍රතිලාභීන්ව සිටි පවුල්වල සනීපාරක්ෂක පහසුකම් ලබාදීම
- අස්වැසුම නොලබන අඩු ආදායම්ලාභීන් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ තෝරාගත් පවුල්වල වයස අවුරුදු. 18-24 තරුණ තරුණියන් සඳහා දෙස් විදෙස් රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණුව ලබාදීම වෙනුවෙන් මූල්‍ය දායකත්වය ලබාදීම
- සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල වල සමාජ ආරක්ෂණ අංශයට අදාළ කටයුතු පරිපාලනය හා කළමනාකරණය
- නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය පාලනය හා පවත්වාගෙන යාම.

අරමුදල වෙත මුදල් ලැබීම්
අරමුදලට දායක මුදල් ලැබීම

2023.07.01 දින සිට අස්වැසුම ප්‍රතිලාභ ක්‍රමවේද ක්‍රියාත්මක වීම හේතුවෙන් එතෙක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි සහනාධාර නතර වන ලදී. ඒ අනුව සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල වෙත ප්‍රතිලාභීන් ගේ මාසික දායක මුදල් ද අහිමි විය.

- **අතිරික්ත මුදල් ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම**
- **නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේ ආදායම්**


අරමුදලේ අතිරික්ත මුදල් ආයෝජනය

රජයේ අනුමැතිය ලද වාණිජ්‍ය බැංකු මගින් කැඳවන ලද මුල ගණන් අනුව ආයෝජන අනු කමිටුවේ අනුමැතිය මත ආයෝජනය කරනු ලැබේ. ඇස්තමේන්තුගත මාසික පිරිවැය අනුව සකස් කරන ලද


සැලැස්මකට අනුව කල් පිරෙන ආයෝජන නැවත ප්‍රති ආයෝජනය කරනු ලැබේ. ඒ අනුව 2025.12.31 දිනට සිදු කර ඇති ආයෝජන පිළිබඳ සාරාංශ වාර්තාව පහත පරිදි වේ.

අනු. අංකය	මුදල් අයෝජනය කර ඇති බැංකුව	ආයෝජිත මුදල (රු.මි.)
1	ලංකා බැංකුව	6,542
2	ලංකා බැංකුව - භාණ්ඩාගාර බිල්පත්	5,998
3	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	1,483
4	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	750
5	නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව	500
	මුළු ආයෝජන ප්‍රමාණය	15,273.00

2025.12.31 දිනට සිදු කර ඇති ආයෝජන



2025.12.31 දිනට එක් එක් වාණිජ්‍ය බැංකුවල සිදු කර ඇති ආයෝජන ප්‍රතිශතය



- **ආයෝජන අනු කමිටුව**

අරමුදලේ ආයෝජන සිදුකිරීම විධිමත් අධික්ෂණයකින් හා අනුමැතියකින් සිදුකිරීම සඳහා සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩල සාමාජික, විෂයභාර අමාත්‍යාංශයේ අනුයෝජිත, විෂයභාර අංශයේ අධ්‍යක්ෂ හා අරමුදලේ ගණකාධිකාරි ගෙන් සැදුම්ලත් අනුකමිටුවක් සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලය විසින් පත් කර ඇත.


- **ආයෝජන පොලී ආදායම**

අංක 08 දරන භාරකාර ඔප්පුවේ 5 වන වගන්තියේ 2 උපවගන්තිය යටතේ අරමුදලට මුදල් ලැබීම් පිළිබඳව සඳහන් කර ඇත. එම උප වගන්තියේ (ඇ) අනුව අරමුදලේ ලැබීමක් ලෙස පොලී ආදායම සඳහන් කර ඇත. එමෙන් එහි (අ) අනුව මේ වන විට සමෘද්ධි ප්‍රතිලාභීන් ගේ දායක මුදල් නොලැබීම මත අරමුදලේ ප්‍රධාන ආදායම් ආයෝජන පොලී ආදායම බවට පත්ව ඇත.


2025.12.31 දිනට අරමුදලේ ආයෝජන පොලී ආදායම පහත පරිදි වේ.

අනු. අංකය	මුදල් අයෝජනය කර ඇති බැංකුව	ආයෝජිත මුදල රු.මි.	මුළු පොලී ආදායම රු.මි.
1	ලංකා බැංකුව	6,542	727.12
3	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	5,998	600.19
2	BOC - Repo	1,483	63.52
4	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	750	62.96
5	නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව	500	13.59
6	මහජන බැංකුව	-	4.60
මුළු ආයෝජන ප්‍රමාණය		**15,273.00**	**1,471.99**

2025.12.31 දිනට මුළු පොලී ආදායම



2025.12.31 දිනට මුළු ආයෝජන පොලී ආදායම ප්‍රතිශතයක් ලෙස



සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන

2025 වර්ෂයට අදාළව සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන අධ්‍යයන වර්ෂ 3 ක අධ්‍යයන හදාරන අස්වැසුම ප්‍රතිලාභ සඳහා හිමිකම් නොලබන සමෘද්ධි ප්‍රතිලාභීන් ව සිටි පවුල් වල උසස් පෙළ හදාරන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලදී.

2025 වර්ෂය සඳහා සිප්දොර ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ගෙවීම් වෙනුවෙන් රු.මි. 773.32 ක මුදලක් වෙන් කරන ලදී. ඒ අනුව,

අධ්‍යයන වර්ෂය	සිසුන් සංඛ්‍යාව	**2025 වර්ෂයේ ක්‍රියාත්මක කාලය**
2023/2025	14,153	ජනවාරි සිට දෙසැම්බර්
2024/2026	17,131	ජනවාරි - දෙසැම්බර්
2025/2027	13,337	අගෝස්තු - දෙසැම්බර්

2025.12.31 දිනට සිප්දොර ශිෂ්‍යත්ව වෙනුවෙන් අරමුදලින් දරා ඇති වියදම

ශිෂ්‍ය සංඛ්‍යාව	වාරික ප්‍රමාණය	මුදල රු.
44,621	**515,544**	**773,316,000**

මීට අමතරව භාරකාර මණ්ඩල අනුමැතිය මත විශේෂ අවස්ථාවක් ලෙස සලකා ගම්පහ දිස්ත්‍රික්කයේ සය නිවුන් දරු උපතක් වෙනුවෙන් වසරක කාලයක් සඳහා රු. 10,000 බැගින් ගෙවීම් කර ඇත. අරමුදලින් දරන ලද මුළු වියදම රු.120,000/- කි.

ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති

සමෘද්ධි සහනාධාරලාභීව සිටි අස්වැසුම ප්‍රතිලාභ සඳහා හිමිකම් ලද හෝ නොලද පවුල් වල ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා දෙපාර්තමේන්තු ජීවනෝපාය සංවර්ධන හා අලෙවි අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් අරමුදලින් මූල්‍ය දායකත්ව ලබා දීම සිදු කරනු ලබයි.

ඒ අනුව,

- ආදර්ශ ගම්මාන වැඩසටහන
  එක් ප්‍රතිලාභී පවුලක් වෙනුවෙන් භාරකාර අරමුදලින් රු.100,000/- ක් ලබා දීම.
- ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ තනි පුද්ගල ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති
  එක් ප්‍රතිලාභියෙක් වෙනුවෙන් භාරකාර අරමුදලින් රු.75,000/- ක් ලබා ලබා දීම.
- ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ වෘත්තීය පුහුණු ලබා දීම.
  එක් ප්‍රතිලාභියෙක් වෙනුවෙන් රු. 50,000/- ක් ලබා දීම.

2025 වර්ෂයේ උක්ත ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් සමාජ සංවර්ධන භාරකාර අරමුදලින් වෙන් කරන ලද මුදල රු.මි. 235.24කි.

2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා දරන ලද වැය පහත පරිදි වේ

ව්‍යාපෘතිය	වැය කළ මුදල රු.
➢ ආදර්ශ ගම්මාන වැඩසටහන	54,674,692.68
➢ ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ තනි පුද්ගල ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති	136,312,386.70
➢ ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ වෘත්තීය පුහුණු ලබා දීම	11,739,334.40
	202,726,413.78

ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ බහුමාන දරිද්‍රතාවය ඉහළ අගයක් ගන්නා ගම්මාන සංවර්ධන වැඩසටහන අනුව සමෘද්ධි ප්‍රතිලාභීන්ව සිටි පවුල්වල සනීපාරක්ෂක පහසුකම් ලබාදීම.

මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරළෙයිපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි මුරුත්තානෙ ග්‍රාම නිලධාරි වසමේ සමෘද්ධි ප්‍රතිලාභීන් ව සිටි පවුල් වල සනීපාරක්ෂණ වැසිකිලි ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණ කිරීම සිදුකිරීම වෙනුවෙන් මූල්‍ය දායකත්වය ලබා දී ඇත.

ඒ අනුව,

ප්‍රතිලාභීන් පවුල් 61 ක් සඳහා නව සනීපරක්ෂක වැසිකිලි ඉදිකර ඇති අතර, පවුල් 52 කගේ සනීපාරක්ෂක වැසිකිලි ප්‍රතිසංස්කරණය සිදු කර ඇත.
මුළු ප්‍රතිලාභී පවුල් 113 ක් වෙනුවෙන් අරමුදලින් දරන ලද වියදම් රු.11,739,344.40

නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය

සේවා ලංකා පදනමට අයත්ව තිබූ මෙම පුහුණු මධ්‍යස්ථානය 2016.07.07 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සමාජ සංවර්ධන භාරකාර අරමුදලින් රුපියල් මිලියන 121 ක් වැය දරා 2016.09.23 දින මිල දී ගෙන ඇත.

මෙම පුහුණු මධ්‍යස්ථානය අක්කර 07 පර්චර් 37 ක ප්‍රමාණයේ ඉඩමක පිහිටා ඇති අතර, ගොඩනැගිලි සංකීරණ 2 කින් හා තනි ගොඩනැගිලි 2 කින් යුක්ත වේ. එකවර පුද්ගලයින් 150 කට පමණ නේවාසික පහසුකම් සපයා දීමේ හැකියාව ඇත. වායුසමනය කරන ලද යාබද නාන කාමර සහිත කාමර 5 ක් දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා නවාතැන් පහසුකම් ලබා දීමට හැකිවන පරිදි නවීකරණය කර ඇත.

එකවරකට පුද්ගලයින් 100 ක් හා පුද්ගලයින් 50ක් අසුන්ගත හැකි දේශනශාලා දෙකකින් යුක්ත වේ.

2025.09.02 දිනැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තු තක්සේරුවට අනුව මෙම පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිලිවල හා ඉඩමේ වර්තමාන වටිනාකම පහත පරිදි වේ.

ගොඩනැගිලි	රු. 192,878,400
ඉඩම	රු. 34,710,000

නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේ කාමර පහසුකම් ලබා දීම.

Room Type	No. of Rooms	No. of Bed	Facilities	Price
Family Room No. -1	04	One each	Air-conditioned attached bathrooms	Rs. 5,000 each
Family Room No. -2	01	Two beds	Air-conditioned attached bathrooms	Rs. 7,500

The Hostel	No. of Rooms	No. of Bed	Facilities	Price
Room No.-01-08	8	04 beds	common bathrooms	Rs. 2,200.00
Room No.-09	1	07 beds	common bathrooms	Rs.3,500.00
Room No.-10	1	08 beds	common bathrooms	Rs.4,000.00
Room No.-11-12	2	09 beds	common bathrooms	Rs. 4,400.00
Room No.-13	1	11 beds	common bathrooms	Rs. 5,200.00
Room No.-14-15	2	Bunk beds 20	common bathrooms	Rs. 7,500.00
Room No.-16-17	2	beds 14	common bathrooms	
The charge for one bed is Rs. 550/-				

Facility	Charges
Lecture Hall (Seat 150, Per 8 hours)	Rs. 7,500/- (Rs. 1,000 is charged for each additional hour)
Lecture Hall (Seat 60, Per 8 hours)	Rs. 4,000/- (Rs. 1,000 is charged for each additional hour)
Multi-Media (Per hour)	Rs. 600/-
Loudspeakers (Per hour)	Rs. 300/-
Oil lamp	Rs. 750/-
Laptop (Per hour)	Rs. 300/-

2025 වර්ෂයට අදාළව නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයේ ආදායම හා වියදම පහත පරිදි වේ.

පුහුණු මධ්‍යස්ථානයේ ආදායම	රු.	5,955,810.88
පුහුණු මධ්‍යස්ථානයේ වියදම සටහන - නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයේ වියදම් තුළ පහත වියදම් ද ඇතුළත් වේ.	රු.	6,948,358.09
අධි පීඩන වතුර පොම්පය	රු.	47,998.86
CCTV කැමරා පද්ධතිය	රු.	411,000.00
ජංගම දුරකථනය	රු.	50,497.86
වේයන් මර්ධන ප්‍රතිකර්ම සඳහා	රු.	2,777,072.88
විදුලි කණුව	රු.	23,000.00
රඳවාගත් ඇප මුදල් නිදහස් කිරීම	රු.	488,058.82

දරිද්‍රතාවය පිටු දැකීම වෙනුවෙන් වූ **BIMSTEC** විශේෂඥ කණ්ඩායමේ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් අදාළ කටයුතු සිදුකිරීම හා 4 වන සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීමට අදාළ කටයුතු සංවිධානය කර පැවැත්වීම.

(මෙම සමුළුව 2025.10.09 සහ 10 දෙදින කොළඹ දී පවත්වන ලදී. ඒ සඳහා වැය කරන ලද මුදල රු.මි. 2.39 ක් වන අතර, එය භාණ්ඩාගාර වෙන් කළ ප්‍රතිපාදන වලින් වැය කරන ලදී.)

- ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියට ආදලව දුක්ගැනවිලි කළමනාකරණ යාන්ත්‍රන ක්‍රියාත්මක කිරීම හා සමාජ හා පරිසර කළමනාකරණයට අදාළ කටයුතු සිදු කිරීම.
- ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහනේ මොණරාගල, බදුල්ල දිස්ත්‍රික් අධීක්ෂණය හා සම්බන්ධීකරණය

2.1.18. විශේෂ ව්‍යාපෘති අංශය

දැක්ම

අඩු ආදායම් සහිත පවුල්වලට ස්ථාවර ජීවනෝපාය අවස්ථා ලබාදීම සහ ඔවුන් ආර්ථික වශයෙන් ස්වාධීන හා සවිබලගැන්වූ පුරවැසියන් බවට පත් කිරීම.

මෙහෙවර

සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය මගින් තෝරාගත් සහභාගීවන්නන්ට පහත සහායන් ලබා දේ

- ජීවනෝපාය සංවර්ධනය සඳහා මූල්‍ය ආධාර (ව්‍යාපාර ප්‍රදාන)
- ව්‍යාපාරික හා තාක්ෂණික පුහුණු
- ව්‍යාපාර සංවර්ධන උපදේශන සහ මාර්ගෝපදේශන
- අඛණ්ඩ අධීක්ෂණය සහ උපදේශන

මෙම සහාය මගින් සහභාගිවන්නන්ට තමන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ දියුණු කිරීමට සහ දිගුකාලීන ආදායම් මාර්ග සකස් කිරීමට හැකි වේ.

හැඳින්වීම :- ලෝක බැංකු ණය යටතේ ක්‍රියාත්මක වන සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය (social protection Project) සංරචක දෙකකි.

සමාජ ප්‍රතිලාභ මණ්ඩලය (WBB) යටතේ ක්‍රියාත්මක වන අස්වැසුම ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

සමාජ සවිබලකරණ ව්‍යාපෘතිය (community empowerment project) දිස්ත්‍රික්ක 12 ක් යටතේ දුප්පත් හා අන්ත දුගී ඛාණ්ඩයට අයත් අස්වැසුම ප්‍රතිලාභී 10975 ක් තිරසාර ජීවනෝපායට යොමු කරවීම

දෙවන සංරචකට අදාළ තොරතුරු පහත දැක්වේ

ගිවිසුම අත්සන් කරන ලද දිනය	-	21.09.2023
ණය ඵලදායි දිනය	-	14.12.2023
ව්‍යාපෘතිය අවසන් දිනය	-	27.09.2027

අරමුණු


දිළිඳු හා අන්ත දිළිඳු ප්‍රතිලාභ කාණ්ඩයට වඩා හොඳ ඉලක්කගත ආදායම් සහ ජීවනෝපාය අවස්ථා ලබාදීම සහ සමාජ ආරක්ෂණ පද්ධතියේ ප්‍රතිචාරාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම.

සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියේ මූල්‍ය කළමනාකරණය

අනු. අංකය	ක්‍රියාකාරිත්වය	මූල්‍ය කළමනාකරණය (ඩොලර් මිලියන)	ක්‍රියාත්මක නියෝජිත ආයතනය
01	මුදල් හුවමාරුව (අස්වැසුම ප්‍රතිලාභ ගෙවීම)	185	සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
02	සමාජ සවිබලකරණ ව්‍යාපෘතිය	07	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
03	ව්‍යාපෘති කළමනාකරණය	07	ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂක ප්‍රජාසවිබල ගැන්වීම් අමාත්‍යාංශය
04	ව්‍යාපෘති කළමනාකරණය	01	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

ව්‍යාපෘතිය ක්‍රියාත්මක ක්‍රමවේදය

මෙම ව්‍යාපෘතිය ඉලක්කගත සහභාගිවන්නන් වෙනුවෙන් ප්‍රමාණවත් ආදායම් සහ ජීවනෝපාය අවස්ථා ලබා දීම සහ සමාජ ආරක්ෂණ පද්ධතියේ ප්‍රතිචාරාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා කරුණු 05 ක් යටතේ ක්‍රියාත්මක වේ.



- සමාජ ආරක්ෂණය (Social Protection)
- පුහුණුව හා උපදේශනය (Coaching & Mentorship)
- ජීවනෝපාය සංවර්ධනය (Livelihood Promotion)
- සමාජ සවිබලකරණය (Social Empowerment)
- මූල්‍ය ඇතුළත් කිරීම (Financial Inclusion)


ආවරණය වන දිස්ත්‍රික්ක

මෙම ව්‍යාපෘතිය පහත සඳහන් දිස්ත්‍රික්ක 12 ආවරණය කරන අතර, අදියර 02 ක් යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 79 ක් සහ ඒ යටතේ තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් 264 ක වැඩසටහන ක්‍රියාත්මක වේ.

පළමු අදියර

- කොළඹ
- බදුල්ල
- රත්නපුර
- මොණරාගල
- අම්පාර
- වව්නියාව
- මන්නාරම


1. Galle
2. Matara
3. Hambanthota
4. Gampaha
5. Puttalam
6. Colombo
7. Monaragala
8. Mannar
9. Badulla
10. Ampara
11. Ratnapura
12. Vavuniya



දෙවන අදියර (බලපෑම් විශ්ලේෂණයට යටත්ව වැඩසටහන ක්‍රියාත්මක කරයි)

- ගම්පහ
- ගාල්ල
- මාතර
- හම්බන්තොට
- පුත්තලම

වැඩසටහනේ අධීක්ෂණ රාමුව



2025.12.31 දිනට ප්‍රගතිය

මූල්‍ය ප්‍රගතිය

අරමුදල් මූලාශ්‍රය	**2024** වර්ෂය (වියදම රු.මී)	**2025** වර්ෂය (වියදම රු.මී)	මුළු වියදම
රජයේ අරමුදල් (GOSL)		4.79	4.79
ලෝක බැංකු (WB)	4.30	21.66	25.96
සහභාගිවන්නන් සඳහා මූල්‍ය ප්‍රධාන		167.10 (අත්තිකාරම් ලෙස)	167.10
එකතුව	**4.30**	**193.55**	**197.85**

භෞතික ප්‍රගතිය

	විෂය	සංඛ්‍යාව
පළමු අදියර	පවුල් සංවර්ධන සැලසුම් (FDP)	4,553
	ව්‍යාපාර සැලසුම් (BP)	1,675
	අත්තිකාරම් නිදහස් කරන ලද සහභාගිවන්නන් (Participant)	726
දෙවන අදියර	වැඩසටහනට කැමැත්ත ප්‍රකාශ කළ සහභාගිවන්නන්	6,366

සහභාගිවන්නන් සඳහා මූල්‍ය ප්‍රදාන නිදහස් කිරීමේ අවස්ථාව දක්වා වන ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ දී නිලධාරීන් සහ සහභාගිවන්නන් වෙනුවෙන් විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. (සමස්ථ ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත් කිරීම, පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම, ව්‍යාපාර සැලසුම් සකස් කිරීම, උපදේශනය, තාක්ෂණික පුහුණු යනාදී වශයෙනි)

ඉදිරි සැලසුම්

2026 වර්ෂය වෙනුවෙන් තවදුරටත් ඉලක්කගත සහභාගිවන්නන් වෙනුවෙන් ජීවනෝපාය සංවර්ධනය සඳහා මූල්‍ය ප්‍රතිලාභ ලබාදීමට නියමිතය. එසේම එම පවුල් පූර්ණ තිරසාර සවිබලකරණයන් සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශයන් ඇතුළත් පුහුණු වැඩසටහන් හා සහය සේවා ලහාකර දීමට සැලසුම් කර ඇත. විශේෂයෙන් ගෘහ කළමණාකරන ඇතුළු ඵලදායිතා සංවර්ධනයනය හා මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් ලබාදීමට නියමිතය.

තවද දෙවන අදියරේදී බලපෑම් විශ්ලේෂණයට (Impact Evaluation) යටත්ව අදාළ දිස්ත්‍රික්කයන් තුළ ප්‍රජා සවිබලකරණ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

2.1.19. වත්කම් කළමනාකරණ අංශය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහනය වූ ආයතන සතු වත්කම් 2013 අංක 01 දරණ සමෘද්ධි පනත ප්‍රකාරව නිරවුල් කර එම වත්කම් ඵලදායී ආකාරයෙන් යෙදවීමත්, දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා අවශ්‍ය මූලික සාධකය වන ඉඩම්, ගොඩනැගිලි හඳුනාගැනීම, පැවරීම, මිලදී ගැනීම, බදු ගැනීම, අත්පත් කර ගැනීම, ඉඩම් ගැටළු නිරවුල් කිරීම සහ මෙම විෂයට අදාළ සියලු ආයතන සමඟ සම්බන්ධීකරණය තුළින් පවරා ගන්නා සියලු වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීමත්, නිරවුල් වන වත්කම් තක්සේරු කරවා ගැනීමත් මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

දෙපාර්තමේන්තුව යටතේ පවතින ඉඩම් වර්ග

ඉඩම් වර්ගය	සංඛ්‍යාව	නිරවුල් සංඛ්‍යාව	තක්සේරුවට යොමුකළ සංඛ්‍යාව	තක්සේරු වාර්තා ලද සංඛ්‍යාව
රජයේ	726			
මහවැලි	41			
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු	86			
පළාත් පාලන/ ප්‍රාදේශීය සභා	69			
පුද්ගලික	70			
වෙනත්	74			
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතු	372			
එකතුව	**1,432**	**372**	**206**	**178**

මෙයට අමතරව සුව බොජුන්හල් 31ට අදාළ ඉඩම්වලින් 03 පවරා ගැනීම ද සිදු කර ඇත. අනෙකුත් සියලු පවරා ගැනීම්වලට අදාළ කටයුතු විවිධ මට්ටම්වල ක්‍රියාත්මක වෙමින් පවතී. වත්කම් 206 ක් තක්සේරු කරවා ගැනීමට යොමුකර ඇති අතර 178 ක් තක්සේරු වාර්තා ලබාගෙන ඇත. මෙයට අමතරව අන්තර්ග්‍රහණය වූ අධිකාරීන් සතුව පැවති මහා පරිමාණ තේ කම්හල් 03 ක්, මෙගා වොට් 20.5ක විදුලි බලාගාරයක්, ටයර් නැවත පිරවීමට අවශ්‍ය උපාංග නිෂ්පාදන කම්හලක් පවත්වාගෙන යනු ලබන අතර එකි ඉඩම්වලින් බදු අයකර ගැනීම හා එම වත්කම් පැවරීමට අදාළ සියලු කටයුතු මෙම වසර තුළ ආරම්භ කර ක්‍රියාත්මක කර ඇත.

පනිල්කන්ද තේ කම්හල	රු.	683,437.50
ගලගාව තේ කම්හල	රු.	622,333.86
ජස්මින්වැලි තේ කම්හල	රු.	817,819.59
ඔටෝලැන්ඩ් (රටලංකාවත්ත)	රු.	237,456.51
ඔලියගොවත්ත විදුලි බලාගාරය	රු.	1,543,050.00

- අන්තර්ග්‍රහණය වූ ආයතනවලින් ලත් වත්කම් 27 කින් 11 ක් නිරවුල් කර ඇත.
- පුද්ගලික අංශයේ ඉඩම් මිලදී ගැනීමට අදාළ ප්‍රතිපත්ති තීරණ ගැනීමට අවශ්‍ය කටයුතු 95% ක් නිමකර ඇත.

2.1.20. නීති අංශය

දෙපාර්තමේන්තු කාර්යයන් පහසුවෙන් ඉටුකිරීම සඳහා අවශ්‍යවනු ලබන මූලික ප්‍රඥප්තියෙහි ප්‍රතිපාදනයන් පිළිබඳ අධ්‍යයනය කිරීම හා එකී ප්‍රඥප්තිය ප්‍රකාර කළ යුතු නියෝග හා රීති පිළියෙල කිරීමත්, සමෘද්ධි බැංකු සහ සමෘද්ධි බැංකු සමිති රජයේ විගණනයට යටත් කිරීම සඳහා 2013 අංක 1 දරන සමෘද්ධි පනත සංශෝධනය කිරීමට කටයුතු සිදුකිරීමත්, දෙපාර්තමේන්තුවට එරෙහිව මානව හිමිකම් කොමිෂන් සභා පැමිණිලි සඳහා ඒවාට වගකීම් දරන අංශ හා නිලධාරීන් මගින් නිසි පිළිතුරු පිළියෙල කරවා කොමිෂන් සභාව වෙත යැවීම හා පරීක්ෂණ සඳහා සම්බන්ධ වීමත්, දෙපාර්තමේන්තුව විසින් හා ඊට එරෙහිව පැවරෙන නීති කෘත්‍යයන් සඳහා ඒවාට වගකීම් දරන අංශ හා නිලධාරීන් ගේ සහයෝගය ඇතිව නිරීක්ෂණ සපයමින් නීතිපති දෙපාර්තමේන්තුව හා මනා සම්බන්ධීකරණයක් පවත්වමින් එකී නඩුකටයුතු සඳහා සම්බන්ධ වීමත්, දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන වත්කම් හා සේවාවන් මිලදීගැනීම් හා බැහැර කිරීම් වලට අදාළ නෛතික ලේඛණ පිළියෙල කිරීම සඳහා අවශ්‍ය නීති උපදෙස් සැපයීම හා සම්බන්ධීකරණය කිරීමත්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති නිලධාරීන් සඳහා නීතිමය දැනුවත්කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම අස්වැසුමලාභීන් හා අඩු ආදායම් ලාභීන්ගේ නෛතික ගැටළු විසඳීම සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ සහයෝගය ඇතිව නීතිමය දැනුවත් කිරීමේ වැඩසටහන් හා නීති සායන පැවැත්වීමත් සිදුකරන ලදී.

2025 වර්ෂයේ නීති අංශය මගින් ගම්පහ, කොළඹ, ගාල්ල, නුවරඑළිය, රත්නපුරය, කෑගල්ල, මාතර, මොණරාගල, අම්පාර, පුත්තලම, අනුරාධපුරය සහ මාතලේ යන දිස්ත්‍රික්කවල අඩු ආදායම්ලාභී පුද්ගලයින් 1,350ක් පමණ සඳහා නීතිමය සවිබලගැන්වීමේ වැඩසටහන් හා නීති සායන පවත්වන ලද අතර මේ සඳහා රු.මි. 1.4ක පමණ මුදලක් වියදම්කර ඇත.

2.1.21. ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකය

ශ්‍රී ලංකාවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය රජයේ ආයතන, දෙපාර්තමේන්තු, සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා ලබා ගැනීමේ ආචාරධර්ම, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සහිත නිල ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව (National Procurement Commission) විසින් නිකුත් කර ඇති අතර 2025 ජනවාරි 1 සිට ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයක් (Gazette) මගින් ප්‍රකාශයට පත්කර ඇත.

ඒ අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ද ඊට අනුගත වෙමින් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා 2025 වර්ෂයේ අවසාන කාර්තුවේදී ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබයි.

මෙහි ප්‍රධාන අරමුණු

- මහජන මුදල් කාර්යක්ෂමව භාවිතා කිරීම **(Value for Money)**
- විනිවිදභාවය හා සාධාරණත්වය තහවුරු කිරීම
  (සියලුම සැපයුම්කරුවන්ට සාධාරණ අවස්ථා ලබාදීම)
- සැපයුම්කරුවන් අතර විවෘත හා සාධාරණ තරගකාරීත්වයක් ඇති කිරීම
- කාර්යක්ෂමව සහ ගුණාත්මකව භාණ්ඩ, වැඩ සහ සේවා ලබා ගැනීම
- අවදානම් කළමනාකරණය
- දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම හා නීතිමය රාමුවක් ස්ථාපිත කිරීම

ප්‍රසම්පාදන කළමණාකරන ඒකකයේ (Procurement Management Unit – PMU) කාර්යභාරය

ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකය ආයතනයට අවශ්‍ය භාණ්ඩ, සේවා හා වැඩ කාර්යක්ෂමව, විනිවිදභාවයෙන් සහ නීතිමය ක්‍රමවේද අනුව ලබා ගැනීම සඳහා වගකීම දරන ප්‍රධාන ඒකකයකි.
එහි මූලික කාර්යභාර පහත පරිදි වේ:

- **ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම**
  වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීම.
- **ලංසු කැඳවීම හා ක්‍රියාදාම කළමනාකරණය**
  ටෙන්ඩර් ලේඛන සකස් කිරීම, දැන්වීම් පළ කිරීම, ලංසු විවෘත කිරීම හා තාක්ෂණික/මූල්‍ය ඇගයීම් සඳහා පහසුකම් සැලසීම.
- **මාර්ගෝපදේශ හා චක්‍රලේඛ අනුගමනය**
  රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ක්‍රියා කිරීම සහ ඒවා පිළිපැදීම නිරීක්ෂණය කිරීම.
- **කොන්ත්‍රාත් කළමනාකරණය**
  ගිවිසුම් සකස් කිරීම, අත්සන් කිරීම, ක්‍රියාත්මක කිරීම හා කාර්යසාධනය නිරීක්ෂණය කිරීම.
- **විනිවිදභාවය හා සාධාරණත්වය තහවුරු කිරීම**
  සියලු සැපයුම්කරුවන්ට සමාන අවස්ථා ලබා දීම සහ විගණන අවශ්‍යතා සපුරාලීම.
- **වාර්තා හා ලේඛන පවත්වා ගැනීම**
  සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ වාර්තා, ගොනු හා දත්ත පද්ධතිමය ලෙස පවත්වා ගැනීම.
- **අවදානම් කළමනාකරණය**
  ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඇති විය හැකි අවදානම් හඳුනාගෙන අවම කිරීම.

ඒ අනුව ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකය යනු රාජ්‍ය ආයතනයකට අවශ්‍ය භාණ්ඩ, සේවා සහ වැඩ කටයුතු නියමිත නීති, නියෝග සහ මාර්ගෝපදේශ අනුව සැලසුම් කර, මිලදී ගැනීම, කොන්ත්‍රාත් කිරීම සහ නියාමනය කිරීම සඳහා ස්ථාපිත කරන ලද විශේෂ ඒකකයකි.

තවද, ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා අදාළ නීතිවලට අනුකූලව ක්‍රියා කරමින් වංචා, අක්‍රමිකතා සහ අධික වියදම් අවම කිරීම සඳහා වැදගත් භූමිකාවක් ඉටු කරනු ලබයි.

එබැවින්, දෙපාර්තමේන්තුවේ සාර්ථකත්වයට සහ මනා පාලනයකට ප්‍රසම්පාදන කළමණාකරන ඒකකය අත්‍යවශ්‍ය අංගයකි.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකය
(Procurement Management Unit of the Department of Samurdhi Development)

ඉහත සඳහන් කරුණු අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකය 2025 වර්ෂයේ අවසන් කාර්තුවේ පිහිටුවන ලදී.

ඒ අනුව සිදු කරන ලද 2025 ප්‍රසම්පාදනයන්ගේ සාරාංශය පහත පරිදි වේ.

ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය - 2025.12.31 දිනට

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

අ.අ.	අයිතම	වෙන්කළ මුදල රු .මී.			වැඩ අවසන් කළ දිනය	ප්‍රසම්පාදන ක්‍රමවේදය	2025.12.31 දිනට සත්‍ය වියදම රු .මී.			මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය
1		ප්‍රධාන කාර්යාලය	දිස්ත්‍රික්	Total			ප්‍රධාන කාර්යාලය	දිස්ත්‍රික්	Total		
1.1	ගොඩනැගිලි අළුත්වැඩියා (2001)	2.00	25.00	27.00	2025.12.31	NCB/LNCB	0.74	7.49	8.23	30.48%	30.48%
1.2	යන්ත්‍රෝපකරණ සහ උපකරණ අලුත් වැඩියා (2002)	3.00	25.00	28.00	2025.12.31	NCB/LNCB	0.74	10.62	11.36	40.57%	40.57%
1.3	වාහන (2003)	3.00	6.00	9.00	2025.12.31	NCB/LNCB	2.63	4.87	7.50	83.33%	83.33%
1.4	ගෘහ භාණ්ඩ උපකරණ (2102)	2.00	20.00	22.00	2025.12.31	NCB/LNCB	1.20	19.96	21.16	96.18%	96.18%
1.5	යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම (2103)	2.00	20.00	22.00	2025.12.31	NCB/LNCB	1.52	19.13	20.65	93.86%	93.86%
* 2103 වැය විෂය යටතේ (යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම) වායු සම්කරණ යන්ත්‍ර 03 ක් මිලදී ගෙන ඇත . (වටිනාකම රු. 1,522,996)											
* 2102 වැය විෂය යටතේ (ගෘහ භාණ්ඩ හා උපකරණ) පහත සඳහන් දෑ මිලදී ගෙන ඇත .											
විධායක මේස - 05 , විධායක පුටු - 05, අමුත්තන් සඳහා පුටු - 02											
විදුලි කේතල - 03											
වානේ කබඩ් - 04 , Library කබඩ් - 01											

2.1.22. අභ්‍යන්තර කටයුතු ඒකකය

2025 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන යටතේ මෙම දෙපාර්තමේන්තුව අභ්‍යන්තර කටයුතු ඒකකය පිහිටුවා ඇති අතර දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරකම් කාලය 2025 – 2029 අනුව ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඇත.

රාජ්‍ය ආයතන තුළ දූෂණ තුරන් කිරීම, සුපිලිපන් සංස්කෘතියක් ඇති කරලීම උදෙසා අභ්‍යන්තර කටයුතු ඒකකය පිහිටුවා ඇති අතර, මේ වන විට එම ඒකකය සඳහා පැමිණිලි හතරක් (04) ලැබී ඇත. එම පැමිණිලි වලින් (03) තුනක් පරීක්ෂා කර අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභාවට යොමු කර ඇති අතර ඉතිරි පැමිණිල්ල විමර්ශන ඒකකය මගින් පරීක්ෂණයට යොමු කර ඇත.

දෙපාර්තමේන්තු අංශ නියෝජනය කරමින් නිලධාරින් 17 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් පැමිණිලි පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. එහි ප්‍රධානී ලෙස අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) සහ සුපිලිපන් නිලධාරි ලෙස අධ්‍යක්ෂ (නීති) කටයුතු කරනු ලැබේ.

2026 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ඉලක්ක

1. අඩු ආදායම්ලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ 2025 - 2029 කාල පරිච්ඡේදය තුළ අස්වැසුම ප්‍රතිලාභී පවුල් ලක්ෂ 12 ක් සවිබලගැන්වීමට සැලසුම් කර ඇත. ඒ යටතේ 2026 වර්ෂයේ අස්වැසුම ප්‍රතිලාභී පවුල් 200,000ක් සවිබලගැන්වීමට අපේක්ෂිතය.

2. අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහනට අදාළව ලෝක බැංකු මූල්‍යාධාර යටතේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. මේ යටතේ 2026 වර්ෂයට පවුල් 6,600ක් සවිබලගැන්වීමට අපේක්ෂිතය.

3. ක්ෂුද්‍රමූල්‍ය ණය වැඩසටහන් යටතේ, දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් 50,000කට සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය හරහා "සවිබල ණය" නමින් විශේෂ ණය වැඩසටහනක් හඳුන්වා දීම.

4. "සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ උසස් පෙළ හදාරන සමෘද්ධිලාභී පවුල්වල දරුවන් 49,000 ක් සඳහා ශිෂ්‍යත්ව ආධාර ලබා දීම.

5. දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස 1,020ක් ඉදිකිරීම සඳහා රු. 1,000,000 බැගින් නිවාස ආධාර ලබා දීම.

6. අස්වැසුම හා අඩු ආදායම්ලාභී පවුල් වල තරුණ තරුණියන් 20,000කට වෘත්තීය පුහුණුව ලබාදීම.

7. 2025 සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ තෝරාගත් සමෘද්ධි ප්‍රතිලාභී පවුල් (අස්වැසුම නොලබන) 1,558කගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ආධාර කිරීම.

8. වාර්ෂික ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ 2026 වර්ෂය සඳහා අඩු ආදායම්ලාභී පවුල් 274,000කට ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාදීම.

9. ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල් 20,000කට මනෝ සමාජීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

10. අඩු ආදායම්ලාභී ප්‍රජාව දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වලක්වා ගැනීම සඳහා ප්‍රාදේශීය සංවිධාන හා ප්‍රජා මූල සංවිධාන හරහා පවුල් 1,000කට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

11. ප්‍රජාමූල සංවිධාන හරහා දරුවන් 3,000 ක් වෙනුවෙන් සංස්කෘතික හා සාක්ෂරතාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

12. නිෂ්පාදන ගම්මාන 89 ක් සංවර්ධනය කිරීමට කටයුතු කිරීම.

13. අඩු ආදායම්ලාභී ව්‍යවසායක කාන්තාවන් සඳහා "ලිය සවිය" ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

14. 2024 වර්ෂයේ ආරම්භ කරන ලද රාජ්‍ය සේවකයන් සඳහා සමෘද්ධි බැංකු හරහා ලබා දෙන ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

15. සමෘද්ධි බැංකු පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය අවසන් කර, සියලු බැංකු ගනුදෙනු නවීන තාක්ෂණය අනුව පරිගණක පද්ධතිය හරහා සිදු කිරීමට කටයුතු කිරීම.

16. සවිබලගැන්වීමේ වැඩසටහන අධීක්ෂණය සඳහා **EIS** නමින් නව පරිගණක පද්ධතියක් හඳුන්වාදීම

17. දෙපාර්තමේන්තුවේ සියලුම සේවකයින්ගේ තොරතුරු **HRM** පරිගණක තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීමේ කටයුතු යාවත්කාලීන කිරීම හා එම පද්ධතිය සේවක කළමනාකරණ කටයුතු සඳහා භාවිතා කිරීම.

18. දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ නොවිසඳුනු වෘත්තීය ගැටළු විසඳා ගැනීමට වැටුප් කොමිසම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ ආයතන සමඟ සාකච්ඡා කර, එම ගැටළු විසඳීමට පියවර ගැනීම.

19. සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයට සමගාමීව සෑම සමෘද්ධි බැංකුවක්ම මූලික කරගෙන ඉතුරුම් වැඩසටහන් හා අලුත් අවුරුදු උත්සව පැවැත්වීම.

20. අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම් හිමියන්ට තම අනිවාර්ය ඉතුරුම් තැන්පතු මුදල ඇපයට තබා ආදායම් උත්පාදන/ දරුවන්ගේ උසස් අධ්‍යාපන/ පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන් පැන නගින මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් ණය වැඩසටහනක් හඳුන්වා දීම.

ධම්මික මුතුගල
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය - 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

එසිජ-එල්

සංශෝධිත අයවැය ප්‍රතිසාදන 2025 රු.		සටහන	තත්‍ය 2025 රු.	තත්‍ය 2024 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිජ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		21,279,321,000	77,447,946,000	එසිජ-3
	කැන්පතු		1,931,572,788	3,202,986,631	එසිජ-4
	අත්තිකාරම් ගිණුම්		226,649,869	232,805,057	එසිජ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**23,437,543,657**	**80,883,737,688**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**23,437,543,657**	**80,883,737,688**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**2,404,000**	**28,767,979,000**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**23,435,139,657**	**52,115,758,688**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-		
21,157,900,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	21,138,877,456	20,506,681,166	
578,486,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	521,323,488	468,995,788	එසිජ-2(ii)
169,009,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	121,173,130	29,082,679,274	
-	පොළී ගෙවීම්	8	-	-	
700,000.00	වෙනත් පුනරාවර්තන වියදම්	9	127,500	282,000	
21,906,095,000	**මුළු පුනරාවර්තන වියදම් (ඒ)**		**21,781,501,575**	**50,058,638,228**	
	මූලධන වියදම්				
64,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	27,072,861	11,043,046	
44,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	41,922,458	4,676,735	
	ප්‍රාග්ධන මාරුකිරීම්	12		-	එසිජ-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
10,000,000	හැකියා වර්ධනය	14	6,861,285	3,280,792	
1,000,000,000	වෙනත් මූලධන වියදම්	15	847,531,834	43,399,680	
1,118,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**923,388,438**	**62,400,253**	
	කැන්පතු ගෙවීම්		1,930,380,717	3,268,525,020	එසිජ-4
	අත්තිකාරම් ගෙවීම්		228,028,888	245,397,814	එසිජ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
2,158,409,605	**ප්‍රධාන ලෙජර් වියදම් (එ)**		**2,158,409,605**	**3,513,922,834**	
	මුළු වියදම් ඒ = (ඒ+උ+එ)		**24,863,299,618**	53,634,961,315	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-ඒ)**		**(1,428,159,960)**	**(1,519,202,627)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(1,428,171,962)	**(1,519,202,628)**	එසිජ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		12,000	973,845	එසිජ-3
			-	-	

3.2. 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ඒසිඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	2,407,853,772	2,221,004,395
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	136,898,914	135,519,896
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**2,544,752,686**	**2,356,524,291**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(2,250,954,566)	(2,253,392,789)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,407,853,772	2,221,004,395
කුලී හා වෑඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	2,387,853,480	2,388,912,685
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**2,544,752,686**	**2,356,524,291**

පිටු අංක 01සිට 32 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 33 සිට 57දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් චාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : සම්පත් මන්ත්‍රිනායක
තනතුර :ලේකම්
දිනය :2026.02.

සම්පත් මන්ත්‍රිනායක
ලේකම්
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
01 වන මහල, අදියර II, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

ගණන්දීමේ නිලධාරී
නම :ධම්මික මුතුගල
තනතුර :අධ්‍යක්ෂ ජනරාල්
දිනය :2026.02. 25

ධම්මික මුතුගල
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
1 වන අදියර, 4 වන මහල
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

ප්‍රධාන මූල්‍ය නිලධාරී
නම :ඒ.ඒ.ප්‍රියන්ත
දිනය :2026.02. 19

ඒ.ඒ. ප්‍රියන්ත
ප්‍රධාන මූල්‍ය නිලධාරී
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
"සෙත්සිරිපාය",
04 වන මහල, බත්තරමුල්ල.

3.3. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ජසිර-සි

	කණ්ඩායම	
	2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,388,899,135	1,637,832,325
අග්‍රිම ලැබීම්	21,279,321,000	77,447,946,000
අත්තිකාරම් අයකර ගැනීම්	229,403,472	234,860,286
තැන්පතු ලැබීම්	1,929,616,303	3,020,350,695
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	24,827,239,910	82,340,989,306
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් ව්‍යයම්	21,608,470,790	20,910,479,824
සහනාධාර සහ මාරුකිරීම්	121,300,630	29,082,961,274
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන ව්‍යයම්	923,388,438	62,400,253
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද ව්‍යයම්	15,790,466	2,021,432
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	2,404,000	28,767,979,000
අත්තිකාරම් ගෙවීම්	225,492,870	245,648,657
තැන්පතු ගෙවීම්	1,930,380,717	3,268,525,020
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	24,827,227,911	82,340,015,460
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	12,000	973,846
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	-	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	12,000	973,846
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ)= (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	12,000	973,846

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන

ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	අදාළ නොවේ				

වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.මී.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.මී.)	අවසාන ප්‍රතිපාදනය (රු.මී.)		
පුනරාවර්තන	21,603	21,906.09	21,781.50	99
ප්‍රාග්ධන	1,118	1,118	923.38	82.59

මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.මී.)	උපයෝගී කර ගන්නාලද ප්‍රතිපාදන ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.මී.)	අවසාන ප්‍රතිපාදන (රු.මී.)		
01	මැතිවරණ කොමිෂන් සභාව		8.0	8.0	8.0	100
02	ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය		118	118	5.57	4.7
03	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව		2.01	2.01	2.01	100
04	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	ශේෂ නිරවුල් කිරීම	0.200	0.200	0.200	100

මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	2025.12.31 දිනට භාණ්ඩ මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	475,866,150	475,866,150	-	100
9152	යන්ත්‍රෝපකරණ	910,690,672	910,690,672	-	100
9153	ඉඩම්	1,021,296,950	1,021,296,950	-	100
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. LSW/A/SDD/2025/FS
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2026 මැයි 27 දින

ගණන්දීමේ නිලධාරී
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 331-සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන දක්වා නොතිබුණද මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට

වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වෙනනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව පිළියෙල කර ඇති බව මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් 1 හි පිළියෙල කිරීමේ පදනම් යටතේ දැක්විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

1.6.2 ආදායම් නොවන ලැබීම්

මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ පවතින තැන්පතු ලැබීම් රු.1,929,616,303 ක් ලෙස සටහන් වුවත් දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම් අනුව තැන්පත් ලැබීම් රු.1,929,321,512 ක් වුයෙන් රු.294,791ක වෙනසක් පැවතුණි.

1.6.3 අත්තිකාරම් ගෙවීම්

2025 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමෙහි සේවකයින් 15 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු.645,760 ක් වසර 1 සිට 20 කට අධික කාලයක් තිහ හිට පැවතුණි.මෙම ණය ශේෂය තුළ වසර 3 ත් 5 ත් අතර තිහ හිටි ශේෂය රු.109,260 ක් ද වසර 5 ත් 10 ත් අතර තිහ හිටි ශේෂය රු. 220,947 ක් ද වසර 10-20 ත් අතර තිහ හිටි ශේෂය රු.3,000 ක් ද වසර 20 ට වැඩි තිහ හිටි ශේෂය රු.89,286 ක් ද වශයෙන් පැවතුණි.

1.6.4 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

(අ) වෙනත් ආයතන විසින් වාර්තාකරණ ආයතන වෙතුවෙන් දරන ලද වියදම් රු.52,024,946 ක් ලෙස අග්‍රිම ගැලපුම් ප්‍රකාශයේ සටහන් වුවත් භාණ්ඩාගාර ගිණුම්කරණ ප්‍රකාශනය අනුව එය රු.51,730,155 ක් වුයෙන් රු.294,791 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) අනෙකුත් ශීර්ෂ වසින් අත්තිකාරම් බිඳ ගිණුම්ට කරන ලද බැර කිරීම් අග්‍රිම ගැලපුම් ප්‍රකාශයේ රු.9,517,875 ක් ලෙස සටහන් වුවත් භාණ්ඩාගාර ගිණුම්කරණ ප්‍රකාශනය අනුව එය රු.7,266,601 ක් වූයෙන් රු. 2,251,274 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.5 මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය නොවන වත්කම්වල 2025 වර්ෂයේ ආරම්භක ශේෂය රු.2,221,004,395 ක් සහ 2024 වර්ෂයේ අවසාන ශේෂය රු.2,225,916,401 ක් වූ අතර ඒ අනුව අවසාන ශේෂය සහ ආරම්භක ශේෂය අතර රු.4,912,006 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2013 වර්ෂයේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන අවස්ථාවේදී ඒකාබද්ධ වූ ආයතන සතුව පැවති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරන ඉඩම් සහ ගොඩනැගිලි 16 ක් සම්බන්ධයෙන් වර්ෂය අවසාන වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමේ ක්‍රියාවලියේ පැවති අතර එම තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.6.6 තැන්පතු ගිණුම් ශේෂ

2025 වර්ෂයට අදාලව පොදු තැනපත් ගිණුමේ කාල විශ්ලේෂණ වාර්තා අනුව ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල වල තැන්පත් වර්ග 04 ක් පවත්වාගෙන යන අතර එයට අදාල නිරවුල් නොකළ තැන්පත් ශේෂය රු. 2,391,254,773 කි. ඉන් අවුරුදු 1-2 අතර ශේෂය රු. 161,459 ක් අවු 2-5 අතර ශේෂය රු. 23,205 ක් අවුරුදු 5 ට වැඩි ශේෂය රු. 2,374,500,000 ක් නිරීක්ෂණය විය.

1.6.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ වර්ෂය තුල අලාභ අයකර ගැනීම/කපා හැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ රු.317,025 ක් ද පොත් වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනයේ රු.668,325 ක් ද නහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) මානව සම්පත් කළමණාකරන මොඩියුලය තුලින් දෙපාර්තමේන්තු සේවකයන් සඳහා ඉකුත් වර්ෂයේදී රාජකාරි හැදුනුම්පත් නිකුත් කිරීම මුළු සේවක සංඛ්‍යාව වූ 22,944 න් 10,377 ක් සඳහා පමණක් නිකුත් කර තිබුණි. සම්බන්ධීත වර්ෂයේදී රාජකාරි හැදුනුම්පත් නිකුත් කිරීම පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.6.8 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩ පාඩු ලේඛනය, වාහන ලොග් පොත සහ වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය යනාදිය මුදල් රෙගුලාසි 110, 1645 (අ) හා1647 (ඉ) පරිදි පිළිසඳහන් හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
3.5 (අ) (ii)	ක්‍රියාත්මක නොවන අරමුදල් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 (4) වගන්තිය ප්‍රකාරව හා 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/1 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 15 (2) (ඇ) ඡේදය ප්‍රකාරව කටයුතු අවසන් කෙරෙන අරමුදල් වලින් ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසුව ඉතිරි වන මුදල් ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට හා භාහිර අයතනයවල සිදුකරන ලද ආයෝජන කල් පිරිණු වහාම ඒකාබද්ධ අරමුදලට මාරුකිරීමට හෝ ක්‍රියාත්මක වන අරමුදල් ව්‍යවස්ථාපිත කොට විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් කිරීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 10 ක් ගතවී තිබුණද නොහැකිවී තිබුණි. ඒ අනුව මෙමඟින් රාජ්‍ය මුදල් අවභාවිතාවී ද යන්න පරීක්ෂා කල නොහැකි අතර මෙම මුදල් රාජ්‍ය මූල්‍ය පාලනයෙන් ද බැහැරවී ඇත.	3.4 (අ) (iv)
3.5(අ) (iii)	2017 මාර්තු 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 6 (ඉ) ප්‍රකාරව ප්‍රතිරක්ෂකයකු ලෙස ක්‍රියා කිරීමට බලතල ඇතත් මහාසංගමයෙන් නිර්දේශ ලබානොගෙන කළමනාකරණ මණ්ඩලය විසින් විවිධ අවස්ථාවල රක්ෂණ ක්‍රම අනුමත කර තිබුණි. රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ වලට අනුගත නොවී විනිවිධභාවයකින් තොරව හා රක්ෂණ මූලධර්ම වලට පටහැනිව එම රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කර වන්දි ගෙවීමද සිදුකර තිබුණි.	3.4 (අ) (vii)
3.5 (අ)(iv)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 15 (3) ඡේදය පරිදි ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. කෙසේ වුවද, ව්‍යාවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් පැවති අරමුදලේ පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. තවද, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 (4) වගන්තිය අනුව පනත ක්‍රියාත්මක දින සිට යම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක ඒවායේ ක්‍රියාකාරීත්වය අවසන් කළ යුතු අතර, මේ පනත ක්‍රියාත්මක කිරීමේ දින සිට එක්	3.4 (අ)(viii)

	වර්ෂයක් ඇතුළත එම අරමුදල් විසුරුවා හරිනු ලැබිය යුතුය. එහෙත් දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ගෙන යන රක්ෂණ අරමුදල පිළිබඳව වක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.	
3.5 (අ) (vi)	සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව යටතේ පවතින මහා සංගමය 2017 මාර්තු 07 වන දිනැති අංක 2009/8 දරන ගැසට් පත්‍රයේ 5 වන පරිච්ඡේදයේ (ඇ) ප්‍රකාරව මහ සංගමය පිහටුවා නොතිබුණු අතර ඊට වෙන්වූ අරමුදලක් පවත්වා තිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට ඒම අරමුදල සතු ආයෝජනය රු මිලියන 9 කි.	3.4(අ)(v)
3.5 (ආ) (ii)	දෙපාර්තමේන්තුවේ මූදල් අංශය යටතේ පවතින සේවක ණය වක්‍රීය අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂ රු.47,190,243 ක් වන අතර 2020 වර්ෂයේ සිට මෙම වක්‍රීය ණය යෝජනා ක්‍රමය අත්හිටුවා ඇත. සේවකයින්ගෙන් රැස්කර ගන්නා මූදලින් රු. මිලියන 186 ක මූදලක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. සමෘද්ධි අධිකාරිය පැවති කාලයේ සිය පැවත එන මෙම අරමුදලේ 2014 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශ සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	3.4 (ආ) (ii)
3.5 (ආ)(i)	දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රජාමූල බැංකු, දිස්ත්‍රික් කාර්යාල හා බැංකු මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයට පටහැනිව සේවක පරිභෝගික ණය, සේවක නිවාස ණය, විශේෂ සේවක ණය හා විශේෂ ආපදා ආදි වශයෙන් සේවක ණය යෝජනා ක්‍රම මඟින් ණය ලබා දී 2024 දෙසැම්බර් 31 දිනට රු බිලියන 12.9 ක මූදලක් (පිටඟිටි ශේෂය) අයවීමට තිබුණි. මෙම සේවක ණය වලින් රු මිලියන 45.72 ක මූදලක් 2025 පෙබරවාරි 28 දින වන විට ගෙවීම් පැහැරහැරීම් හේතුවෙන් එම මූදල් අයකර ගැනීමට කටයුතු නොකර බොල්ණය ලෙස වෙන් කිරීම් කර තිබුණි.	3.4(ආ)(i)
6 (අ)	රාජ්‍ය සේවා කෙමිෂන් සභාවේ කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ අනුව 97 වන වගන්තිය ප්‍රකාරව, පත්වීමට අදාල සහතික වල නිර්ව්‍යාජ භාවය පත්වීම් බලධාරියා විසින් වසරක් ඇතුළත සනාථ කරගත යුතු අතර, 59 වන වගන්තිය අනුව රාජ්‍ය සේවයේ කිසියම් තනතුරකට යම් තැනැත්තෙකු විසින් පත්කිරීම් බලධරයා වෙත සාවද්‍ය තොරතුරු හෝ (ව්‍යාජ(කූටලේඛන ඉදිරිපත් කර ඇති බව අනාවරණය වූ විටෙක එම පත්වීම් වහාම අවලංගු කර එය ශූන්‍ය හා බලරහිත කර, ඒ වන විටත් වැටුප් හා දීමනා වශයෙන් රජය විසින් ගෙවා ඇති සියළු මූදල් එම නිලධාරීන්ගෙන් අයකර ගැනීමට	7 (ආ)

ක්‍රියාකල යුතුවේ. නමුත් නිළධාරීන් 363 දෙනෙකු විසින් සිය පත්වීම් ලබා ගැනීමට පෞද්ගලික ලිපිගොනුවට ඉදිරිපත් කර තිබුණු අධ්‍යාපන සහතික ව්‍යාජ සහතික බවට සනාථ වී තිබුණි. ඉන් 77 දෙනෙකු සේවයෙන් පහකර තිබුණු අතර 20 දෙනෙකු පනත ප්‍රකාරව වන්දි ලබාගැනීමේ එකඟතාවයෙන් සේවයෙන් ඉවත් වී තිබුණි.නියැදි විගණනයට භාජනය වූ පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් අතුරින් 13 දෙනෙකු හා විශ්‍රාම ගිය නිලධාරීන් 02 දෙනෙකු ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කර තම පත්වීම් ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය. ව්‍යාජ ප්‍රතිඵල සටහන් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදක් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවන කණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ සඳහන් පළමු වන උපලේඛනය අනුව රජයේ නිලධාරීන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධයෙන් වන වරදක් සිදුකර ඇති බව හඳුනාගෙන තිබූ නමුත් ඊට එරෙහිව අදාළ නිලධාරීන් කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ද මෙම නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) වියදම් සඳහා නිසි පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් එක් පුනරාවර්ථන වැය විෂයයක රු. 2,198,139 ක ප්‍රතිපාදනය නිසි පරිදි උපයෝජනය නොකිරීමෙන් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) අපේක්ෂිත වැය නොදැරීම, ප්‍රතිපාදන උපයෝජනය කර නොගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයන් 10 ක එකතු වූ රු.25,050,000 ක මුළු ප්‍රතිපාදනයෙන් රු.20,141,285 ක්ද මූලධන වැය විෂයන් 05 ක එකතු වූ රු.60,000,000 ක මුළු ප්‍රතිපාදනයෙන් රු 38,062,311 ක්ද ඉතිරි වී තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 51 සිට සියයට 97 දක්වා වූ පරාසයක පැවතුණි .

(ඇ) මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර මුදල් රෙගුලාසි 66 යටතේ සියයට 50 සිට සියයට 95 දක්වා වැය විෂයන් 03 කට අදාලව රු. 39,000,000 ක මූලික ඇස්තමේන්තුව ඉක්මවා රු.30,895,000 ක මාරු කිරීම් කර තිබුණි.ඒ අනුව වර්ෂය ආරම්භයේ නිසි පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇති වී තිබුණි.

3.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 6.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මූදල් රෙගුලාසි) 1647(අ)	වාර්ෂිකව වන්කම් සමීක්ෂණය කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.
	(ii) මූදල් රෙගුලාසි 104(1), 104(3) සහ 104(4)	ලියාපදිංචි වාහන 4 ට අදාලව වාහන අනතුරු සිදු වී වසර 3 සිට වසර 7 දක්වා කාලයක් ගත වී තිබුණත් 2025 දෙසැම්බර් 31 දක්වා ප්‍රාරම්භක වාර්තාව සහ අලාභයන් පිළිබඳ අවසන් වාර්තාව මූදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි.
(ආ)	2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/01 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වෙනි පරිච්ඡේදය	ප්‍රසම්පාදන සැලසුම් 05 ක් වෙන් වෙන් වශයෙන් අත්පොතේ සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කළ යුතු වුවත් ඊට අනුගත නොවී දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදනය භාර නිලධාරීන් විසින් 4.1.2 ප්‍රකාරව වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම පමණක් පිළියෙල කර තිබුණි.
(ඇ)	2017 නොවැම්බර් 07 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 (XXXIII)	කෑගල්ල දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී විසින් මාස 09 ක කාලයක් චක්‍රලේඛ විධිවිධාන වලින් බැහැරව තම නිවසට යාමට හා ඒමට දෙපාර්තමේන්තුව සතු වාහන දෙකක් යොදා ගැනීම තුළින් කි.මී. 1300 ක් සඳහා ඉන්ධන ලීටර් 152.22 ක් අවභාවිතා කර තිබුණු අතර, එම කාලසීමාව තුළ එම ගමන් සඳහා රියදුරුට අතිකාල ද ගෙවා තිබුණි.
(ඇ)	2009 අප්‍රේල් 16 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 හි 03 ඡේදය ප්‍රකාරව	නිලධාරීන්ගේ පැමිණීම, පිටවීම සටහන් කිරීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු වල හා සමිති වල ඇඟිලි සලකුණු යන්ත්‍රයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

3.4 අවධිමත් ගනුදෙනු

(අ) දෙපාර්තමේන්තුව සතු අනුමත නොවූ අරමුදල්

(i) 2013 අංක 01 දරන දිවිනැඟුම පනතේ 44 (ආ) වගන්තිය ප්‍රකාරව ඉවත් කරන ලද පනත් යටතේ පිහිටුවන ලද සමෘද්ධි සංවර්ධන අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරි වලට අයත්වන්නා වූ සියළු නිශ්චල හා චංචල දේපල රජයට පවරා දිය යුතු බව සඳහන් කර ඇත. ඒ අනුව ආයතනවල ස්ථාවර වත්කම් සමෘද්ධි දෙපාර්තමේන්තුවට පවරාගෙන තිබූ අතර ආයතනවල අරමුදල් වල ශේෂයන් ද දෙපාර්තමේන්තුවට පවරාගෙන ස්ථාවර තැන්පත් වශයෙන් මේ දක්වා දෙපාර්තමේන්තුවේ අංශයක් වන සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය අංශය යටතේ රඳවාගෙන තිබුණි. මෙම ආයෝජන පිළිබඳව දෙපාර්තමේන්තු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලද ඇතුළත් නොවන අතර දෙපාර්තමේන්තුව යටතේම දැරිය හැකි වියදම් දැරීම මෙම සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය අංශය යටතේ ස්වාධීනව අරමුදල් මඟින් සිදු කරන අතර මෙම කිසිදු අරමුදලක් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුව පිහිටුවන අවස්ථාවේ වත්කම් පැවරීම සම්බන්ධයෙන් පනත ප්‍රකාරව කටයුතු නොකිරීම හා 2017 මාර්තු 17 දිනැති අංක 2009/08 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ (ඇ) උපලේඛනය ප්‍රකාරව මහ සංගමය විසින් එහි සඳහන් නියෝග හා බලතල ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානය තෙක් කටයුතු නොකිරීමෙන් දෙපාර්තමේන්තුවේ අංශයක් වන සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය අංශය එම කටයුතු සිදු කරමින් මූල්‍ය පාලනය සිදු කිරීමට මූල්‍ය විනය කඩ කිරීමක් සිදුකර තිබුණි.

(iii) 2025 දෙසැම්බර් 31 දිනට SLTS හා Softwatch පද්ධති වලින් ලබාගත් තොරතුරු පදනම්ව දෙපාර්තමේන්තුවේ සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් 2025 දෙසැම්බර් 31 දිනට අනිවාර්ය ඉතිරි කිරීම් රු.මිලියන 42,496.74 ක් ආයෝජන කර පොලී වශයෙන් රු.මිලියන 3,343.21 ක් බැංකුව වෙත ලබා දී තිබූ අතර අනිවාර්ය ඉතුරුම් සඳහා පොලී වශයෙන් රු.මිලියන 4,570.18 ක් බැංකු විසින් ප්‍රතිලාභීන්ට ගෙවා තිබුණි.ඒ අනුව රු.මිලියන 1,226.98 ක් ණය වශයෙන් ලබා දී පොලී උපයා ගැනීමට බැංකු වලට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(iv) ක්‍රියාත්මක නොවන අරමුදල් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරන පනතේ 39 (4) වගන්තිය ප්‍රකාරව හා 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/1 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 15 (2) (ඇ) ඡේදය ප්‍රකාරව කටයුතු අවසන් කෙරෙන අරමුදල් වලින් ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසුව ඉතිරිවන මුදල් ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට හා බාහිර ආයතනවල සිදු කරන ලද ආයෝජන කල් පිරුණු වහාම ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට සහ ප්‍රමාණවත් තොරතුරු පවත්වා ගෙන යාමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 13ක් ගත වී තිබුණද නොහැකි වී තිබුණි. ඒ අනුව මෙමගින් රාජ්‍ය මුදල් අවභාවිතා වීද යන්න පරීක්ෂා කල නොහැකි අතර මෙම මුදල් රාජ්‍ය මූල්‍ය පාලනයෙන්ද බැහැර වී තිබුණි.

(v) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව යටතේ පවතින මහා සංගමය 2017 මාර්තු 07 වන දිනැති අංක 2009/8 දරන ගැසට් පත්‍රයේ 5 වන පරිච්ඡේදයේ (ඇ) ප්‍රකාරව මහ සංගමය පිහිටුවා නොතිබුණු අතර ඊට වෙන්වූ අරමුදලක් පවත්වා තිබූ අතර 2025 දෙසැම්බර් 31 දිනට එම අරමුදල සතු ආයෝජනය රු.මිලියන 25.04 ක් විය.

(vi) 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ මූදල් රෙගුලාසි 877 (1) (ඇ) හා (ඇ) ඡේද ප්‍රකාරව කිසියම් අරමුදලක වාර්ෂික අයවැය ලේඛනය සකස් කොට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු

අතරම් එසේ අනුමත කරන ලද අයවැයකින් තොරව අරමුදල් යටතේ කිසිදු වියදමක් දැරිය නොහැකි වුවත් දෙපාර්තමේන්තුව යටතේ වන බැංකු මූල්‍ය අංශය සතු අරමුදල් වලින් කිසිදු අනුමැතියකින් තොරව වැය ඇස්තමේන්තු සකස් කොට වාර්ෂිකව වියදම් දරනු ලබයි. ඒ අනුව 2025 වර්ෂය සඳහා රු.මිලියන 2,564 ක වැය ඇස්තමේන්තුවක් පමණක් සකස් කර තිබුණ නමුත් එම වියදම් දැරීම සඳහා ආදායම් මූලාශ්‍රය හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව නිසි අනුමැතියකින් තොරව දරනු ලබන සියළු වියදම් නීත්‍යානුකූල නොවීය.

(vii) 2017 මාර්තු 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 6 (ඉ) ප්‍රකාරව ප්‍රතිරක්ෂකයකු ලෙස ක්‍රියා කිරීමට බලතල ඇතත් මහාසංගමයෙන් නිර්දේශ ලබානොගෙන කළමනාකරණ මණ්ඩලය විසින් විවිධ අවස්ථාවල රක්ෂණ ක්‍රම අනුමත කර තිබුණි. රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ වලට අනුගත නොවී විනිවිධභාවයකින් තොරව හා රක්ෂණ මූලධර්ම වලට පටහැනිව එම රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කර වන්දි ගෙවීම්ද සිදුකර තිබුණි.

(viii) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 15 (3) ඡේදය පරිදි ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. කෙසේ වුවද, ව්‍යාවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් පැවති අරමුදලේ පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. තවද, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 (4) වගන්තිය අනුව පනත ක්‍රියාත්මක දින සිට යම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක ඒවායේ ක්‍රියාකාරීත්වය අවසන් කළ යුතු අතර, මේ පනත ක්‍රියාත්මක කිරීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත එම අරමුදල් විසුරුවා හරිනු ලැබිය යුතුය. එහෙත් දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ගෙන යන රක්ෂණ අරමුදල පිළිබඳව චක්‍රලේඛය ප්‍රකාරව 2025 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය අංශය සතු අරමුදල් වලින් සේවකයින්ට ණය ලබාදීම

(i) දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රජාමූල බැංකු , දිස්ත්‍රික් කාර්යාල හා බැංකු මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයට පටහැනිව සේවක පරිභෝගික ණය, සේවක නිවාස ණය, විශේෂ සේවක ණය හා විශේෂ ආපදා ආදි වශයෙන් සේවක ණය යෝජනා ක්‍රම මඟින් ණය ලබා දී 2025 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10,236.62ක මුදලක් (පිටකිටී ශේෂය) අයවීමට තිබුණි. මෙම සේවක ණය වලින් රු.මිලියන 63.96 ක මුදලක් ගෙවීම් පැහැරහැරීම් හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු නොකර බොල්ණය ලෙස වෙන් කර තිබුණි.

(ii) දෙපාර්තමේන්තුවේ මුදල් අංශය යටතේ පවතින සේවක ණය වක්‍රිය අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂ රු.14,896,245 ක් වන අතර 2020 වර්ෂයේ සිට මෙම වක්‍රිය ණය යෝජනා ක්‍රමය අත්හිටුවා ඇත. සේවකයින්ගෙන් රැස්කර ගන්නා මුදලින් රු. මිලියන 296 ක මුදලක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. සමෘද්ධි අධිකාරිය පැවති කාලයේ සිට පැවත එන මෙම අරමුදලේ 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශ සකස් කර විගණනයට ඉදිරිපත් කර තිබුණද ඉන්පසු මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ඒ සම්බන්දයෙන් ගෙන නොතිබුණි.

(ඇ) නිරවුල් නොකළ ශේෂ

සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් ගිණුම්වල පවතින මුදල් හා විවිධ අරමුණු සඳහා පිහිටුවා ඇති දෙපාර්තමේන්තුවේ පවතින අරමුදල් ගිණුම්වලින් රු.බිලියන 2.7 ක් 2025 දෙසැම්බර්

31 දිනට භාණ්ඩාගාරයෙන් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. ඒ අනුව ප්‍රතිලාභීන් නැවත මුදල් ඉල්ලුම් කිරීමේදී ඒවා ලබා දීමේ දුෂ්කරතාවයන් පැවතුණි.

(ඇ) අරමුදල් වලින් පුද්ගලික සමාගමක කොටස් මිලදී ගැනීම

මහ සංගමයේ අරමුදල්, අධ්‍යක්ෂ ජනරාල් අනුමත කරන බැංකුවක තැන්පත් කලහැකි වුවත් බැංකු මූල්‍ය අංශය විසින් 2004 වර්ෂයේද ෆෑන් ඒෂියා බැංකුවෙහි රු. 10 හි කොටස් 5,557,188ක් රු.14.50 බැගින් මිලදී ගැනීමට රු.80,579,226 ක් වැය කර තිබුණි.සමාලෝචිත වර්ෂය වන විට වර්ෂ 25 ක් ගත වී ඇතත් මෙම කොටස් සඳහා රු. 55,571,188 ක ප්‍රසාද කොටස් පමණක් උපයා තිබුණි.

(ඉ) සීමාව ඉක්මවා ප්‍රතිලාභ ලබා දීම

2025 ජුනි 26 දිනැති අංක 2025/07 දරන සමෘද්ධි චක්‍රලේඛයේ අරමුදල් සම්පාදනය යටතේ පවුල් ඒකක සඳහා හඳුනාගනු ලබන ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට එක් පවුල් ඒකකයකට රු. 50,000 ක සීමාවකට යටත්ව මූල්‍ය ප්‍රදානයක් ලබාදීමට ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ඊට අනුකූල නොවී පිටබැද්දර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 05ක ප්‍රතිලාභීන් 42කට රු.50,000 ක සීමාවන් ඉක්මවා රු 1,700 බැගින් එකතුව රු.71,400ක් ප්‍රතිලාභ ලබා දී තිබුණි. ඒ අනුව චක්‍රලේඛ ප්‍රකාරව අනුමත සීමාවන් ඉක්මවා මූල්‍ය ප්‍රදානයන් සිදුකර තිබුණි.

3.5 බැංකු ගිණුම් මෙහෙයවීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය අංශය යටතේ ජංගම ගිණුම් 11 ක් හා ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වාගෙන ගොස් තිබුණි. මෙම ගිණුම් වල 2025 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.4,571,676 ක් පැවතුණි. මුදල් රෙගුලාසි 381 ප්‍රකාරව මෙම ජංගම ගිණුම් සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

දෙපාර්තමේන්තුවේ දැක්ම "වසර 2030 වන විට දුගී බවෙන් තොර,සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම"වන අතර එම දැක්ම ඉටු කර ගැනීමට තවත් වසර 05 ක් පමණක් ඉතිරිව තිබුණත් ඒ සඳහා ස්ථාපිත කර ඇති පරමාර්ථ 08 ක් අතුරින් පහත පරමාර්ථ 04 ඉටුකර නොතිබුණි.විස්තර පහත පරිදි වේ.

(i) එක් එක් පුද්ගලයා සහ පවුල වෙනුවෙන් ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම.

(ii) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි භෞතික සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(iii) ජනතාවගේ ආර්ථික සහ සමාජ සංවර්ධනය අවශ්‍ය විය හැකි අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සිදු කිරීම.

(iv) ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටු වීම සඳහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සහ සමාජ ආරක්ෂණයක් අවශ්‍ය පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණ ජාලයක් නිර්මාණය කිරීම.

4.1.2 සැලැසුම් කිරීම

සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ අංශ 22 ක් පැවතියද ක්‍රියාකාරී සැලැස්ම සියලුම අංශ ආවරණය වන පරිදි පිළියෙල කර නොතිබුණි.එමෙන්ම දෙපාර්තමේන්තුව විසින් විමර්ශනය පැවැත්විය යුතු මූල්‍ය හා මූල්‍ය නොවන අක්‍රමිකතා විශාල ප්‍රමාණයක් ඉකුත් වර්ෂය අවසාන වන විට පැවතියත් 2025 වර්ෂය සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය විසින් වාර්ෂිකව විමර්ෂණයට ලක් කල යුතු මූල්‍ය හා මූල්‍ය නොවන වංචා පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් සැලසුම් පිළියෙල කර නොතිබුණි. එම නිසා මූල්‍ය වංචා සහ විෂමාචාරයන් සඳහා කඩිනමින් විසඳුම් ලබා දීම සහ එමගින් සමෘද්ධි බැංකුවලට සහ සමෘද්ධි බැංකු සමිතිවලට සිදු වී ඇති මූල්‍ය පාඩුව අවම කර ගැනීමට නොහැකි වී තිබුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(i) ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ සුදුසු අස්වැසුම් ප්‍රතිලාභී පවුල් 300,000 ක් තෝරා ගැනීමට සමාලෝචිත වර්ෂය තුල සැලසුම් කලද පවුල් 173,713 ක් එනම් සියයට 58 පමණක් තෝරාගෙන තිබුණි.

(ii) දත්ත කළමණාකරන පද්ධතියට තෝරාගත් ප්‍රතිලාභී පවුල් 400,000 ක දත්ත ඇතුලත් කිරීමට සහ විශ්ලේෂණය කිරීමට ක්‍රියාකාරී සැලසුම් අනුව සිදු කල යුතු වුවත් පවුල් 4,218 ක් එනම් සියයට 1 කට අදාල දත්ත පමණක් ඇතුලත් කර තිබුණි.

(iii) ජීවනෝපාය සංවර්ධනය සඳහා පවුල් සංවර්ධන සැලසුම් 400,000 ක් සකස් කිරීමට සැලසුම් කලද පවුල් සංවර්ධන සැලසුම් 232,309 ක් එනම් සියයට 58ක් පමණක් සමාලෝචිත වර්ෂයතුලදී පිළියෙල කර තිබුණි.තවද ස්වයං රැකියා සඳහා උපරිමය රු.50,000 ක් දක්වා මූල්‍ය ආධාර පවුල් 9,861 කට ලබා දීම වර්ෂයේ ඉලක්කය වුවත් පවුල් 8,679 කට පමණක් මූල්‍ය ආධාර ලබා දී තිබුණි.

(iv) රැකියා නිර්මාණය සහ ව්‍යවසායකත්වය සංවර්ධනය වෙනුවෙන් තරුණයින් 4,576 කට වෘත්තීය පුහුණුව ලබා දී සේවා නියුක්ත කිරීමට සැලසුම් කලද තරුණයින් 4,417 ක් පමණක් වෘත්තීය පුහුණු ආයතන වෙත යොමු කර තිබුණි. එමෙන්ම කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙනුවෙන් ධාරිතා සංවර්ධන වැඩසටහන් 600 ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කලද වර්ෂය තුල වැඩසටහන් 544 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.තවද එම වැඩසටහන යටතේ අඩු ආදායම් පවුල් සඳහා රැකියා 700 ක් ඇති කිරීමේ අරමුණින් සුව බොජුන්හල් 70 ක් ඉදිකිරීමට සැලසුම් කලද වර්ෂයතුල සුව බොජුන්හල් 03 ක් පමණක් විවෘත කර තිබුණි.

(v) ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන පිළිබඳව ප්‍රචාරණ කටයුතු සඳහා FM WEB රේඩියෝව පරීක්ෂණ මට්ටමේ සම්ප්‍රේෂණය ආරම්භ කර ඇතත් සැලසුම්ගත ප්‍රචාරණ කටයුතුවල යෙදී නොතිබුණි.

4.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) අධ්‍යක්ෂ ජනරාල්ගේ 2025 ජූනි 04 දිනැති අංක 2025/05 දරන චක්‍රලේඛයේ (4) උපවගන්තිය ප්‍රකාරව අස්වැසුම්, සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන් සඳහා රැකියා අවස්ථා ඇතිකිරීම අරමුණු කරගනිමින් සුවබොජුන්හල් 09 ක් ස්ථාපිත කිරීම සඳහා එක් සුවබොජුන්හලකට උපරිම රු.1,000,000 බැගින් වෙන්කර තිබූ අතර නියැදි විගණනය සිදු කරන ලද කුරුණෑගල

දිස්ත්‍රික්කය වෙත රු. 9,000,000 ක් වෙන් කර තිබුණි. සුවබොජුන්හල් 05 ක් සඳහා ඉන් රු.8,000,000 ක් ලබා දී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම සුවබොජුන්හල් වලින් 02 ක් පමණක් නිමකර තිබුණි. තවද මෙම සුවබොජුන්හල් 09 තුලින් ව්‍යවසායකයින් 90 ක් සඳහා රැකියා ලබාදීමට අපේක්ෂා කලද එම අපේක්ෂිත ව්‍යවසායකයින් සඳහා රැකියා අවස්ථා උදාකර දීමට අපොහොසත් වී තිබුණි.

(ආ) එක් ගමක් - එක් වැඩසටහනක් ව්‍යාපෘතිය යටතේ ඇළහැර ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 25 දෙනකු සඳහා එක් ප්‍රතිලාභියකුට රු.100,000 බැගින් රු.2,500,000 ක් ලබා දී තිබුණි.එම රු10,000 ක මුදලින් රු. 60,000 ක් කිකිළි පැටවුන් ලබා ගැනීමට හා කුඩු සකස් කිරීමට ලබා දී තිබුණද නියැදි විගණනයේදී ප්‍රතිලාභීන් 05 දෙනෙකුගේ රු. 98,400 ක් වූ කිකිළි පැටවුන් 82 ක් මිය ගොස් තිබුණි. සත්ත්ව ආහාර මිල ඉහළ යාම, අධික පිරිවැය ආදී හේතු නිසා ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි.

(ඇ) 2024 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තුවේ මෘදුකාංග පද්ධති 02ක් නියාමනය කිරීම සඳහා උපදේශක ලෙස මොරටුව විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ පීඨයේ ආචාර්යවරයෙකු පත් කර තිබූ අතර, ඔහුගේ සේවය සඳහා 2025 සැප්තැම්බර් 09 දක්වා රු.2,023,000 (බදු අඩු කල අගය) ක් ගෙවා තිබුණි. මෙම උපදේශක විසින් තමන් විසින් සිදුකරනු ලැබූ කාර්යාන්ට අදාලව 2024 සැප්තැම්බර් සිට 2025 දෙසැම්බර් දක්වා වාර්තා 8ක් නිකුත් කර තිබුණි. නමුත් මෙම වාර්තා මඟින් නිර්දේශ කර ඇති නිර්දේශයන් ක්‍රියාත්මක කර ඇති බවට විගණනයට තොරතුරු ඉදිරිපත් නොකෙරුණි.

4.1.5 ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දැමීම

(අ) ප්‍රජා සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහන යටතේ මාතර දිස්ත්‍රික්කය තුල අනුමත ව්‍යාපෘති 367ක් ක්‍රියාත්මක කිරීම සඳහා එකතුව රු.18,350,000ක් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘති 349ක් වෙනුවෙන් එකතුව රු.15,879,312 වැය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති 18ක් ක්‍රියාත්මක කර නොතිබීමෙන් එකතුව රු.2,470,688 ක් ඌණ උපයෝජනය වී තිබුණි.

(ආ) සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන් යටතේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහනක් වූ අස්වැසුම්ලාභී, සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන් සඳහා රැකියා අවස්ථා ඇතිකිරීම අරමුණුකර ගනිමින් මාතර දිස්ත්‍රික්කයේ සමෘද්ධි සුව බොජුන්හල් 4 ක් ඇති කිරීම සඳහා රු. 4,000,000 ක ප්‍රතිපාදන වෙන්කල නමුත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ බැවින් අදාළ අරමුණු ඉටු වී නොතිබුණි.

4.1.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2025 ජූනි 25 දිනැති අංක 2025/08 දරන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රජා සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහන යටතේ අස්වැසුම ප්‍රතිලාභ නොලබන සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභීන් ස්වයං රැකියා මඟින් සවිබලගැන්වීම සඳහා පළමු අදියර යටතේ නියැදි විගණනය සිදු කරන ලද කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 217 ක් සඳහා රු.15,617,624 ක් කුරුණෑගල, වාරියපොළ, හොරම්බාව, පසුවස්නුවර නැගෙනහිර සහ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දී තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් එම මුදල් වලින් උපකරණ මිලදී ගෙන ප්‍රතිලාභීන්ට ලබා දී නොතිබුණි. තවද පළමු අදියර අවසන් වී නොතිබියදී දෙවන අදියර සඳහා ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් සඳහා රු.4,985,480 ක් ලබා දී තිබුණි.

4.1.7 වාර්ෂික කාර්යසාධන වාර්තාව

සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව අනුව 2023 අප්‍රේල් 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධානම කාර්යය වන දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 12 ක් නිශ්චිත කාල සීමාවක් තුල ආර්ථික ,සමාජීය හා මානසික යන අංශයන් ගෙන් සවිබලගැන්වීමයි.ඒ අනුව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද සැලැස්ම තුල පවුල් 400,000 ක් සවිබල ගැන්වීමට සැලසුම් කර තිබුණි.ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) භාණ්ඩාගාර අරමුදල් රු.මිලියන 836.22 ක් යොදවා 131,000 ක් පවුල් සවිබල ගැන්වීමට සැලසුම් කර තිබුණි.

(i) පවුල් 50,000 ක් හොටෙල් හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා යොමු කිරීමට රු.මිලියන 278.81 ක් වෙන්කර කර තිබුණද රු.මිලියන 240.69 ක් වියදමින් කර ප්‍රතිලාභීන් 4,417 ක් පමණක් රැකියාගත තිබුණි. භෞතික ප්‍රගතිය සියයට 9 ක් වුවත් මූල්‍ය ප්‍රගතිය සියයට 86 ක් වී තිබුණි.

(ii) ස්වයං රැකියාගත කිරීමේ වැඩසටහන යටතේ රු.මිලියන 82.35 ක් වෙන් කර එමඟින් පුද්ගලයන් 1,000 ක් රැකියාගත කර සවිබලගැන්වීමට සැලසුම් කර තිබුණත් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 77.15 ක් වැය කර 264 ක් පමණක් රැකියාගත කර තිබුණි.ඒ අනුව එහි භෞතික ප්‍රගතිය සියයට 26 ක් පමණ වුවත් වෙන් කරන මුදල් සියයට 94 ක් වැය කර තිබුණි.

(ආ) ආසියානු සංවර්ධන බැංකු හා ලෝක බැංකු මූල්‍යධාර වැඩසටහන යටතේ පවුල් 23,000 ක් සවිබලගැන්වීමට රු.මිලියන 2,803 ක් සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කර තිබුණත් රු.මිලියන 1,429.64 වැය කර පවුල් 8,980 ක් සඳහා පමණක් ප්‍රතිලාභ ලබා දී තිබුණි.ඒ අනුව වැඩසටහන් වල භෞතික ප්‍රගතිය සියයට 39 ක් වුවත් මූල්‍ය ප්‍රගතිය සියයට 51 ක් වී තිබුණි.

(ඇ) සමෘද්ධි ප්‍රජාමූල බැංකු ණය වැඩසටහන යටතේ අන්ත දුප්පත් හා දුප්පත් පවුල් 30,000 ක් සවිබලගැන්වීම සඳහා රු.100,000 බැගින් ණය ලබා දීමට රු.මිලියන 2,500ක්ද සංකාන්තික හා අවදානමකට ලක් වූ පවුල් 120,000 ක් සවිබලගැන්වීම සඳහා පවුලකට රු 250,000 බැගින් ලබා දීමට රු.මිලියන 15,500 ක්ද ලබා දීමට සමාලෝචිත වර්ෂයේදී වෙන් කර තිබුණත් පවුල් 2,035 කට රු.මිලියන 260.42 ක් පමණක් ලබා දී තිබුණි.ඒ අනුව එම වැඩසටහනේ භෞතික ප්‍රගතිය සියයට 1.35 ක් පමණි.මෙම ණය මඟින් ඔවුන් සවිබලගැන්වීමේ කාර්යයන් සිදුකළ බවට පසු විපරම් සිදු කර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) 2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරන වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ (ආ) ප්‍රකාරව ධාවන තත්වයේ නොපවතින අළුත්වැඩියා කිරීම් ඵලදායී වන වාහන අළුත්වැඩියා කර වහාම භාවිතයට ගැනීමට ආයතනය ප්‍රධානීන්ට උපදෙස් ලබා දී තිබුණත් අළුත්වැඩියා කිරීම් සඳහා ගරාජ්වල පවතින දෙපාර්තමේන්තුව සතු වාහන 04 ක් වසර 01 සිට වසර 02 දක්වා කාලයක් ගරාජයන් තුල රඳවා නිසි ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි.

(ආ) ආයතනය සතු වාහන 03 ක් සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවලදී ධාවනයෙන් ඉවත්කර අළුත්වැඩියා සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මූදල් රෙගුලාසි අංක 880 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා බලය ලබා දී ඇති සියලුම සේවකයින්, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවද, සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල සහ දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල වල මුදල් ගණුදෙනු සඳහා සෘජුව සම්බන්ධ වන බැංකු කළමණාකරු, ගිණුම් ලිපිකරු, මුදල් අයකැමි හා ක්ෂේත්‍රයේ ණය එකතු කිරීමේ යෙදී සිටින නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි.

4.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

(අ) 2020 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදයට අදාලව දෙපාර්තමේන්තු විමර්ශන අංශයට මූල්‍ය වටිනාකම් රු. මිලියන 270.47 ක් වූ මූල්‍ය වංචා 181 ක් වාර්තා වී තිබුණ අතර ඒ තුලින් විමර්ශන සිදුකර, මුදල් රෙගුලාසි 104 පරීක්ෂණයෙන් පසු සිද්ධි 58 කට අදාලව මූල්‍ය වටිනාකම රු. මිලියන 42.51 ක් අයකිරීම් සිදුකරගෙන තිබුණි .නවද 2014 ජනවාරි සිට 2019 දක්වා බැංකු හා බැංකු සමිතිවල සිදු වූ මූල්‍ය අක්‍රමිකතා වලින් රු. මිලියන 56.19 ක අක්‍රමිකතා 05 ක කටයුතු අවසන් කර නොතිබුණි. නිලධාරීන් විසින් දිගින් දිගටම මෙසේ මූල්‍ය වංචා සිදු කිරීමට බැංකු පද්ධතිය තුල පවතින අඩුපාඩු සකස් කිරීම හා විනය නියෝගය තුළින් දඩුවම් ලිහිල් වීමද වංචා වැඩිවීමට හේතුවී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII වැනි පරිච්ඡේදයේ 13.2 ඡේදයට අදාලව 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2019 තුළින් මූලික විමර්ශනය මාස 2 ක් ඇතුළත අවසන් කළ යුතු වුවද වංචා, දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධතාවයෙන් මූලික විමර්ශන සිදුකර විනය නියෝග ලබාදීම ප්‍රමාදවීම් වසර 04 සිට වසර 08 දක්වා කාල පරාසයක පැවතුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 29.1, 29.2 හා 29.3 වගන්ති මඟින් දක්වා ඇති පරිදි විගණකාධිපති වාර්තාවක් මඟින් අනාවරණය වන විෂමාචාර සම්බන්ධයෙන් අදාල කටයුතු කළ යුතු වුවද පොලොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද සමෘද්ධි ප්‍රජාමූල බංකුවේ 2017 හා 2018 වර්ෂවලදී එහි කළමණාකරු උපරිම ණය සීමාව වූ රු.300,000 ඉක්මවා රු.500,000 බැගින් 11 දෙනෙකු වෙත ණය මුදල් ගෙවීම සම්බන්ධයෙන් 2024 මැයි15 දින නිකුත් කල විගණකාධිපතිගේ විගණන වාර්තාව මඟින් ඉදිරිපත් කර තිබු කරුණු සහ සෙවනපිටිය සමෘද්ධි බැංකුවේ සේවය කරන සමෘද්ධි දෙපාර්තමේන්තුවට අයත් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් කුට ලේඛණ පිළියෙල කර රු.7,365,970 ක් ණය මූදල් ලෙස හා ණය වාරික ලෙස ලබා ගත් රු.333,420 ක මූදල් පෞද්ගලික පරිහරණයට ගෙන ඇති බව අභ්‍යන්තර විගණන වාර්තා මඟින් හෙළිදරව් කර තිබුණද ඒ පිළිබඳව ඉදිරි කටයුතු කර නොතිබුණි.

4.5 අනාරක්ෂිත ගණුදෙනු

2021 වර්ෂයේදී සමෘද්ධි FM අන්තර්ජාල රේඩියෝව විකාශනය නවතා දමා තිබූ අතර වසර 04 කට පසු සමාලෝචිත වර්ෂයේදී තාක්ෂණික මෙවලම් සහ අවශ්‍යතා ඉටුකිරීම සඳහා රු.537,600 ක්ද මාසිකව රු.65,000 ක්ද වැය කර සමෘද්ධි FM අන්තර්ජාල රේඩියෝව නැවත ආරම්භ කර තිබුණි.සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ජනතාව අතරට ගෙනයාම මාධ්‍ය අංශයේ මූලික අරමුණ වශයෙන් තබාගෙන මෙම රේඩියෝව නැවත විකාශනය ආරම්භ කර තිබුණත් මෙම අරමුණ ඉටුකර ගැනීමට ඉලක්ක වන අන්තර්ජාල පහසුකම්,ස්මාර්ට් ජංගම දුරකතන පහසුකම් අවම අඩු ආදායම්ලාභී ජනතාවට මෙම FM අන්තර්ජාල ගුවන් විදුලි සේවයෙන් ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් ලබා

ගැනීමේ හැකියාවක් පවතිද යන්න නිරීක්ෂණය නොවීණි.කළමණාකරනය විසින් මෙවැනි තිරසර නොවූ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට වරින් වර අනුමැතිය ලබා දීම සහ ඒ වෙනුවෙන් වියදම් දැරීම මතභේදයට තුඩුදෙන කරුණු විය.

4.6 කළමනාකරණ දුර්වලතා

(අ) වාහන ඇණියේ පවතින යතුරු පැදි 10 ක් ලියාපදිංචිය සමාද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතු නොවන අතර හිමිකම් පවරා ගැනීමට අදාල නිසි ක්‍රියාමාර්ග කළමණාකරණය විසින් ගෙන නොතිබුණි.

(ආ) ජීවනෝපාය සංවර්ධන අංශයේ අධ්‍යක්ෂකට ලබා දී තිබූ නිලරථය 2024 මැයි 16 දින ගිලන් රථයක ගැටීම හේතුවෙන් අනතුරට භාජනය වී ඇති අතර 2025 පෙබරවාරි 24 දිනැති මු.රෙ.104 (4) ප්‍රකාරව අලාභයන් පිලිබඳ අවසන් වාර්තාවේ දක්වා ඇති පරිදි රු.88,300 ක මුදලක් එම නිලධාරියාගෙන් අයකිරීමට තීරණය කර තිබුණි. අනතුර සිදු වී වසර 01 මාස 07 ක් ගත වී තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අලාභය අය කර අවසන් කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ඇ) 2024 දෙසැම්බර් 30 දින සිදු වී තිබූ රථයේ අනතුර සම්බන්ධයෙන් 2025 අප්‍රේල් 02 දිනැති මු.රෙ.104 (4) ප්‍රකාරව අලාභයන් පිලිබඳ අවසන් වාර්තාවේ දක්වා ඇති පරිදි රියදුරු විසින් අවසරයකින් තොරව සහ බීමතින් වාහනය රැගෙනයාම හේතුවෙන් වාහනයට සිදුවූ අලාභය රු.693,000 ක මුදල එකවර රියදුරුගෙන් අයකර යුතු බව තීරණය කර තිබුණි. අනතුර සිදු වී මාස 08 කට පසු අවසන් වාර්තාව නිකුත්කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනතුර සිදු වී වසරක් ගත වී තිබුණත් එම මුදල අයකර ගැනීමටත් වාහන භාරව කටයුතු සිදු කරනු ලැබූ නිලධාරීන් සම්බන්ධව සිදු කල යුතු පරීක්ෂණයන් පැවැත්වීමටත් කළමනාකරණයේ වගකිව යුතු පාර්ශවයන් විසින් සිදු කර නොතිබුණි.

(ඈ) ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII පරිච්ඡේදයේ 13.2 ඡේදයට අදාලව සහ 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2019, 13.2 උප වගන්ති සංශෝධනය අනුව කිසියම් විෂමාචාරයක් සම්බන්ධ සිදුවීමක් පිළිබඳව මූලික විමර්ශනයක් පැවැත්වීම මාස දෙකක් ඇතුලත අවසන් කල යුතු බව නියෝගය නිකුත් කරන අවස්ථාවේ දීම මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා නියෝග කරන බලධරයකු විසින් මූලික විමර්ශන නිලධරයා හෝ නිලධර කමිටුව වෙත අනිවාර්යයෙන්ම නියම කල යුතුය. එසේ වුවද, ඊට අමතර කාලයක් අවශ්‍ය වන්නේ නම් මූලික විමර්ශන නිලධරයා හෝ නිලධර කමිටුව විසින් ප්‍රමාණවත් පිළිගත හැකි හේතු ඉදිරිපත් කරමින් අදාල බලධරයාගෙන් අනුමැතියක් ලබාගත යුතුය. එතෙකුදු වුවත් සෑම මූලික විමර්ශනයක්ම නොපමාව නිම කිරීමට අදාල සෑම පාර්ශවයක්ම නිරන්තරයෙන්ම වග බලා ගතයුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී ඒ අනුව අදාල නිලධාරීන් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි

(ඉ) ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII පරිච්ඡේදයේ 23.6 ඡේදය අනුව අධිභාරයක් වශයෙන් හෝ රජයට සිදු වූ අලාභහානි සම්බන්ධයෙන් හෝ වූදිත නිලධරයාගෙන් යම් මුදලක් අයකර ගැනීම් හෝ විනය නියෝගයේ කොටසක් වන අවස්ථාවලදී එම මුදල් අයකර ගැනීම අදාල ගණන්දීමේ නිලධරයාගේ වගකීම් වන්නේය. නියැදි පරීක්ෂාවට අනුව මූල්‍ය අක්‍රමිකතාවය සිදු කර දීර්ඝ කාලයක් ගත වී ඇතත් විමර්ශන ක්‍රියාවලිය අවසන් කර මූල්‍ය පාඩුව අයකර ගැනීමට ගණන්දීමේ නිලධාරියා විසින් කටයුතු කර නොතිබුණු අවස්ථා පැවතුණි. තවද ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII පරිච්ඡේදය අනුව රාජ්‍ය නිලධාරීන් විසින් සිදුකල හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනය යටතේ වන අල්ලස් හෝ දූෂණ හෝ කටයුතු සම්බන්ධයෙන් වැරදි සිදු කිරීම සහ රාජ්‍ය සේවය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීම යන වරදවල් සිදු කර ඇති නිලධාරීන්ට බරපතල දඬුවම් ලබා නොදී ලඝු විනය දඬුවම් (සුළු දඬුවම්) ලබා දී තිබුණි

(ඊ) 2013 අංක 1 දරන දිවිනැඟුම් ආඥාපනතේ 36 වගන්තිය යටතේ දිවිනැඟුම් සංවර්ධන අරමුදල පිහිටුවනු ලැබිය යුතු වන අතර දෙපාර්තමේන්තුවට ලැබෙන සියළු ප්‍රදාන, ත්‍යාග පනත යටතේ පිහිටුවන ලද බැංකු හා බැංකු සමිති විසින් ත්‍යාග වෙනත් දායක මුදල්, බැංකු වල ලාභයෙන් අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන මුදල් ප්‍රතිශතයක් වශයෙන් සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැරකර ඉන් පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව දිවිනැඟුම් සංවර්ධන අරමුදලට බැරකල යුතු වුවත් එම අරමුදල මේ දක්වා පිහිටුවා නොතිබුණි.

(උ) දෙපාර්තමේන්තුගත නිලධාරීන් පෞද්ගලික ලිපි ගොනුවේ ලේඛන ස්කෑන් කර පද්ධතියට උඩුගත(upload) කිරීමට නිබු මුළු ලිපිගොනු සංඛ්‍යාව වූ 21,641 න් 4958 ක් පමණි.ඒ අනුව තව දුරටත් ලිපි ගොනු 16,683 ක් උඩුගත කර නොතිබුණි.

5 තිරසාර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

(අ) සමාලෝචිත කාර්යසාධන වාර්තාව අනුව තිරසර සංවර්ධන අරමුණු තුනක් හඳුනා ගෙන තිබුණි. ඉන් පළමු අරමුණ වන දුගී බව අවසන් කිරීමට සමගාමීව ඉලක්ක ලෙස "2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන සියලුම පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම" සහ "පහල ආදායම් මට්ටමේ අයද ඇතුලත්ව සියලුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම" දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාලව සපුරා ගත යුතු ඉලක්ක සහ දර්ශක හඳුනා ගෙන නොතිබුණි. ඒ අනුව ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රගතිය ලෙස දක්වා ඇති ප්‍රතිශතයන්වල නිරවද්‍යතාවය තහවුරු නොවුණි.

(ආ) දෙවන තිරසර සංවර්ධන අරමුණ වන ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනයට සමගාමීව ද සමාලෝචිත වර්ෂයට අදාලව සපුරා ගත යුතු ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන නොතිබුණු අතර එක් දර්ශකයක් ලෙස අඩු ආදායම්ලාභී ව්‍යවසායකයින් සංවර්ධය සඳහා අඩු පොලී ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලෙස ණය 295,054 ක් ලබා දී තිබූ බව දැක්වුවත් අඩු ආදායම්ලාභී ව්‍යවසායකයින්ටම එම ණය ලබා දී නොතිබුණු බව නියැදි විගණනයේදී නිරීක්ෂණය විය. මෙසේ ලබා දුන් ණය අයකර ගැනීමේ දුර්වලතා මත වැඩි ප්‍රතිශතයක් බොල් ණය වී ඇති බවද නිරීක්ෂණය විය.

6 යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

ප්‍රධාන කාර්යාලයට හා දිස්ත්‍රික් කාර්යාල වලට අනුබද්ධව ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුලු 352 ක කාර්යමණ්ඩලයක් අභ්‍යන්තර විගණන අංශය සඳහා අනුයුක්ත කර තිබුණද විගණනයට ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුලදී ද 2022 සහ 2023 වර්ෂයන්ට අදාලව අත්හැරුණු විගණනයන් 504 ක් සිදු කර වාර්තා 1741 ක් නිකුත් කර තිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂය තුලදී සිදු කිරීමට සැලසුම් කරන ලද විගණනයන් අත්හැරී තිබුණි.

7. මානව සම්පත් කළමනාකරණය

(අ) 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ XVIII වැනි පරිච්ඡේදයේ ස්ථානමාරු කිරීම්හි 244 වගන්තිය ප්‍රකාරව සෑම රජයේ නිලධරයෙක්ම ස්ථාන මාරු කිරීම් වලට යටත් වන නමුත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අවුරුදු 6 ත් 10 ත් අතර සේවා කාලයක් සහිත නිලධාරීන් 57 ක්ද, අවුරුදු 11 ත් 15 ත් අතර සේවා කාලයක් සහිත නිලධාරීන් 32ක්ද, අවුරුදු16ත් 20 ත්අතර සේවා කාලයක් සහිත නිලධාරීන් 29 ක්ද,

අවුරුදු 20 ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් 87 ක්ද, දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ වලට අනුයුක්තව සේවයේ නියුක්තව සිටී. තවද දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ අවුරුදු 6 ත් 10 ත් අතර සේවා කාලයක් සහිත නිලධාරීන් 143 ක්ද, අවුරුදු 11 ත් 15 ත් අතර සේවා කාලයක් සහිත නිලධාරීන් 37ක්ද, අවුරුදු16ත් 20 ත් අතර සේවා කාලයක් සහිත නිලධාරීන් 25 ක්ද, අවුරුදු 20ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් 43 දෙනෙකු ද එකම සේවා ස්ථානයේ සේවයේ නියුක්තව සිටින බව කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය

(ආ) නිළධාරීන් 363දෙනෙකු විසින් සිය පත්වීම් ලබා ගැනීමට පෞද්ගලික ලිපිගොනුවට ඉදිරිපත් කර තිබුණු අධ්‍යාපන සහතික ව්‍යාජ සහතික බවට සනාථ වී තිබූ අතර ඉන් 77දෙනෙකු සේවයෙන් පහකර තිබුණු අතර 20 දෙනෙකු පනත ප්‍රකාරව වන්දි ලබාගැනීමේ එකඟතාවයෙන් සේවයෙන් ඉවත් වී තිබුණි .ව්‍යාජ ප්‍රතිඵල සටහන් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදක් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවන බණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ සඳහන් පළමු වන උපලේඛනය අනුව රජයේ නිලධාරීන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධයෙන් වන වරදක් සිදුකර ඇති බව හඳුනාගෙන තිබූ නමුත් ඊට එරෙහිව සමාලෝචිත වර්ෂය තුළදී ද ක්‍රියාමාර්ග ගෙන අවසන් කර නොතිබුණි .නියදි විගණනයට භාජනය වූ බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක සේවයේ නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 07 දෙනෙකු පත්වීම් ලබාගැනීමේදී ව්‍යාජ අධ්‍යාපන සහතික ලබාදී තනතුරු ලබාගෙන තිබූ බව නිරීක්ෂණය වූ අතර නිලධාරීන් 06 දෙනෙක් සඳහා 2005 වර්ෂයේ සිට 2024 දක්වා වසර 19 ක් වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු.45,111,618 ක් ගෙවා තිබුණි.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය - 04 - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක

අංශය අනු.	වැඩසටහන	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ව නිමැවුම		
			100% - 90%	75% - 89%	20% - 74%
01	ප්‍රජා සවිබල ගැන්වීමේ වැඩසටහන	**ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම** • පවුල් හඳුනාගැනීම - 10,500 • නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණුව - 538 • පාර්ශවකරුවන් දැනුවත් කිරීම- 1,881 • පවුල් සංවර්ධන ගැලපුම් සකස් කිරීම - 10,500 • ජීවනෝපාය ගැලපුම් - 10,201 • ව්‍යාපාර සැලසුම් සකස් කිරීම - 6,500 • ජීවනෝපාය ආධාර ලබා දීම - 7,866 • මූල්‍ය පිරිවැය රු.මි.1,242.00			74%
		ලෝක බැංකු මූල්‍යාධාර නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම • පවුල් හඳුනාගැනීම - 4,650 • නිලධාරීන් දැනුවත්කිරීම හා පුහුණු වැඩසටහන් - 174 • ප්‍රතිලාභීන් පුහුණු කිරීම - පවුල් 4,558 • පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම - 4,345 • ජීවනෝපාය ගැලපුම් - 4,221 • ව්‍යාපාර සැලසුම් සකස් කිරීම - 1,117 • ජීවනෝපාය ආධාර ලබාදීම - පවුල් 1,114 • මූල්‍ය පිරිවැය - රු.මි.187.64			20%
		ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම • පවුල් හඳුනාගැනීම - 276,900 • නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණුව -11,358 • පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම - 232,309 • ව්‍යාපාර සැලසුම් සකස් කිරීම - 14,699 • ජීවනෝපාය ආධාර ලබාදීම - 8,555 • තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම- 4,417 • සවිබල සහන පොළී ණය ලබාදීම - 2,035 • සමෘද්ධි රන්පත ණය ලබාදීම - 1,576 • මනෝ සමාජීය වැඩසටහන් - පවුල් 108,784 • නීතිමය සවිබලගැන්වීමේ වැඩසටහන් - 27 • **EIS** දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම • මූල්‍ය පිරිවැය - රු.මි. 861.28		86%	

අනු. අංකය	වැඩසටහන	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ව නිමැවුම		
			100% - 90%	75% - 89%	20% - 74%
02	ව්‍යවසාය සංවර්ධන වැඩසටහන	• වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම තරුණ තරුණියන් - 57,243 • අඩු ආදායම්ලාභී ව්‍යවසායකයින් සඳහා වසායකත්ව ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම - ව්‍යවසායකයින් 12,240 • අඩු ආදායම්ලාභී නිෂ්පාදන අළෙවිය වැඩිදියුණු කිරීම සඳහා සුව බෝජුන්හල් 33 ක් ඇති කිරීම • මූල්‍ය පිරිවැය - රු.මි. 116.77		80%	
03	ක්ෂුද්‍රමූල්‍ය ණය වැඩසටහන	• අඩු ආදායම්ලාභී පවුල් සඳහා ක්ෂුද්‍රමූල්‍ය ණය 295,054 ක් නිකුත් කිරීම. • මුළු ණය වටිනාකම - රු.මි. 57,575.75	98%		
04	සමාජ ආරක්ෂණ වැඩසටහන	• අඩු ආදායම්ලාභී පවුල්වල උසස් පෙළ හදාරන දරුවන් 44,621 ක් සඳහා සිප්දොර ශිෂ්‍යත්ව ආධාර ලබාදීම. • මූල්‍ය පිරිවැය රු.මි. 773.32 කි.		75%	
05	නිවාස සංවර්ධන වැඩසටහන	• අඩු ආදායම්ලාභී පවුල් 911 ක් නිවාස සංවර්ධනය සඳහා නිවාස ආධාර ලබාදීම • මූල්‍ය ප්‍රගතිය - රු.මි.136.65			20%
06	සමාජ සංවර්ධන වැඩසටහන	• අඩු ආදායම්ලාභී පවුල්වල පුද්ගලයින් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය, උපදේශනය, දුම්වැටි නිවාරණය, කැකුළු ළමා සමාජ වැඩසටහන්, පාරිසරික හා ක්‍රීඩා ආදී වශයෙන් වැඩසටහන් 1,100 ක් ප්‍රජාමූල සංවිධාන හරහා ක්‍රියාත්මක කිරීම • මූල්‍ය පිරිවැය - රු.මි. 20.70 කි.			70%
07	තොරතුරු තාක්ෂණ වැඩසටහන	• සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,097 ක් සහ බැංකු සමිති 355 ක් පරිගණක ගත කිරීම • ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන පසු විපරම් කිරීම සඳහා EIS දත්ත පද්ධතිය හඳුන්වා දීම • මූල්‍ය ප්‍රගතිය රු. මි. 6.53 කි.		80%	
08	සැලසුම් හා මෙහෙයුම් වැඩසටහන	• ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන් හා අනෙකුත් සංවර්ධන වැඩසටහන් පසු විපරම් කිරීම හා සමාලෝචනය කිරීම සඳහා ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 07 ක්ද දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 150 ක් ද සහ ප්‍රාදේශීය මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 1,924 ක්ද පවත්වන ලදී. • මූල්‍ය පිරිවැය රු.මි.25.34 කි.		80%	
09	මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන	• දෙපාර්තමේන්තුවේ සේවාවන් පොදු ජනතාව වෙත ප්‍රචාරණය කිරීමේ අරමුණින් **Samurdhi FM Web Radio** ව ආරම්භ කරන ලදී. • මූල්‍ය පිරිවැය රු.මි.0.59 කි.			60%

පරිච්ඡේදය – 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

අනු අංකය	ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
				0% - 49%	50% - 74%	75% - 100%
01	දුගී බව අවසන් කිරීම	2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන සියලුම පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම.	2025-2029 කාලය තුළ අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 12 ක් සඳහා ආර්ථික, සමාජීය හා මානසික යන අංගයන්ගෙන් සවිබලගැන්වීම සඳහා තිරසර වැඩසටහන් සකස් කිරීම.			100%
			ආර්ථික සවිබලගැන්වීම යටතේ අඩු ආදායම්ලාභී පවුල්වල ස්වයං රැකියා ඇතුළු ආදායම් උත්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරීම (පවුල් 12,166)	45%		
			අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණයින් වෘත්තීය පුහුණුව හරහා රැකියාගත කිරීම (තරුණ තරුණියන් 4,417)	20%		
			මනෝ සමාජීය සංවර්ධනය හරහා අඩු ආදායම්ලාභී පවුල් සමාජීය හා මානසික සවිබලගැන්වීම (පවුල් 108,784)	27%		
		අඩු ආදායම් ලබන පිරිසද ඇතුළත්ව සියලුම ප්‍රජාව වෙනුවෙන් ජාතික සමාජ ආරක්ෂණ වැඩසටහනක් ක්‍රියාවට නැංවීම.	ශිෂ්‍යත්ව වැඩසටහන් හරහා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීම (සිප්දොර ශිෂ්‍යත්ව 44,621)			75%
02	ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය	කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම’	අඩු ආදායම්ලාභී ව්‍යවසායකයින් සංවර්ධනය සඳහා අඩු පොළී ක්ෂුද්‍රමූල්‍ය ණය පහසුකම් ලබා දීම. (ණය 295,054)			80%
			අළෙවි පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. (ව්‍යවසායකයින් 12,240)	40%		
			අඩු ආදායම්ලාභී ව්‍යවසායකයින් දිරි ගැන්වීම් සඳහා ව්‍යවසායකයින්ට ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම (ව්‍යවසායකයින් 12,240)		50%	
03	නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.	ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිළට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම.	අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස සංවර්ධනය සඳහා රු.1,000,000/- ක නිවාස ආධාර ලබා දීම. (නිවාස 1,020 කට)		50%	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

i. 2025 වර්ෂය තුළ අස්වැසුම ප්‍රතිලාභ වැඩසටහන යටතේ දුප්පත්, අන්ත දුපප්පත්, අවදානමට ලක් වූ හා සංක්‍රාන්තික යන සමාජ කාණ්ඩයන් යටතේ ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභී පවුල් 300,000 ක් හා අනෙකුත් අඩු ආදායම්ලාභී පවුල් 100,000 ක් වශයෙන් පවුල් 400,000ක් ආර්ථික හා සාමාජයීය ක්ෂේත්‍රයන් යටතේ සවිබලගැන්වීම සඳහා හඳුනාගැනීම.

ii. සවිබලගැන්වීම සඳහා හඳුනා ගත් පවුල් සංවර්ධනය කළ යුතු මානයන් හඳුනා ගැනීම සඳහා පවුල් 232,309 කට පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම.

iii. පවුල් සංවර්ධන සැලසුම් සකස් කළ පවුල් අතරින්, ආර්ථික ක්ෂේත්‍රය යටතේ සවිබලගැන්විය යුතු පවුල් 14,699 සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කිරීම.

iv. ව්‍යාපාර සැලසුම් සකස් කළ පවුල් 8,155 ක ගේ ස්වයං රැකියා ඇතුලු ආදායම් උත්පාදන කටයුතු ප්‍රවර්ධනය සඳහා එක් පවුලකට රු.50,000 බැගින් ජීවනෝපාය ආධාර ලබා දීම.
වැය කළ මුදල රු.මි. 431.21 ක් වේ.

v. හඳුනාගත් පවුල් වල තරුණ තරුණියන් රැකියාගත කිරීමේ අරමුණින් වෘත්තීය පුහුණුවකට යොමු කිරීම සඳහා පහසුකම් සැලසීමට එක් තරුණයෙකුට රු.50,000 ක මූල්‍යාධාරයක් තරුණ තරුණියන් 4,417 ක් වෙනුවෙන් ලබා දීම.

vi. අස්වැසුම ප්‍රතිලාභ නොලබන සමෘද්ධි සහනාධාර ලැබූ පවුල් අතරින් පවුල් 100,000 ක් සවිබලගැන්වීමට හඳුනාගෙන පවුල් 2,853ක ගේ ජීවනෝපාය සංවර්ධනය ඇති කිරීම උදෙසා ස්වයං රැකියාවක හෝ රැකියාගත කිරීම වෙනුවෙන් එක් පවුලකට උපරිම රු.75,000 ක ජීවනෝපාය ආධාර ලබා දීම සිදු කරන ලදී. වැය කළ මුදල රු.මි.189.26 කි.

vii. ප්‍රජා සවිබලගැන්වීමේ **ADB** නියමු ව්‍යාපෘතිය යටතේ දුප්පත් හා අන්ත දුප්පත් පවුල් 10,500 ක් හඳුනාගෙන පවුල් 7,866 සඳහා ජීවනෝපාය ආධාර ලබා දීම. වැය කළ මුදල රු.මි.1,242 ක් වේ.

viii. ප්‍රජා සවිබලගැන්වීමේ **World Bank** මූල්‍යාධාර නියමු ව්‍යාපෘතිය යටතේ දුප්පත් හා අන්ත දුප්පත් පවුල් 4,650ක් හඳුනාගෙන පවුල්1,114ක් සඳහා ජීවනෝපාය ආධාර ලබා දීම.
වැය කළ මුදල රු.මි.187.64 ක් වේ.

ix. දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,907 ක් මගින් 8% සහන පොළි ප්‍රතිශතයක් යටතේ, තෝරාගත් අස්වැසුම පවුල්වල ව්‍යවසාය සංවර්ධනය, ජීවනෝපාය සංවර්ධනය, ස්වයං රැකියා අවශ්‍යතා වෙනුවෙන්, ප්‍රතිලාභීන් 2,035 දෙනෙකු සඳහා උපරිමය රු. 250,000/- දක්වා සවිබල ණය වැඩසටහන් යටතේ ක්ෂුද්‍රමූල්‍ය ණය පහසුකම් ලබා දීම. ලබා දුන් මුළු ණය වටිනාකම රු.මි. 5,260.42 ක් වේ.

x. දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍රමූල්‍ය වාර්ෂික ණය වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල් 295,054 ක් සඳහා උපරිමය රුපියල් ලක්ෂ 50 ක් දක්වා සමෘද්ධි බැංකු හරහා ක්ෂුද්‍රමූල්‍ය ණය පහසුකම් ලබා දීම. ලබා දුන් මුළු ණය වටිනාකම රු.මි.57,575.75 ක් වේ.

xi. අස්වැසුම ප්‍රතිලාභ නොලබන සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ පවුල් සවිබලගැන්වීම යටතේ හඳුනාගත් පවුල්වල ජීවනෝපාය සංවර්ධනය සඳහා ආදායම් උත්පාදන ව්‍යාපෘතීන් ආරම්භ කිරීම හා ඒ සඳහා මූල්‍ය ප්‍රාග්ධනය ලබා ගැනීමට 4% ක උපරිමය රු.300,000 දක්වා සහනදායී පොළී අනුපාතයකට සමෘද්ධි රන්පත නමින් ණය වැඩසටහනක් ක්‍රියාත්මක කර පවුල් 1,576 කට ක්ෂුද්‍රමූල්‍ය ණය පහසුකම් ලබා දීම. ලබා දුන් මුළු ණය වටිනාකම රු.මි.393.58 වේ.

xii. සමෘද්ධි ව්‍යවසායකයින් දිරිගැන්වීම යටතේ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 544 ක් පවත්වා ව්‍යවසායකයින් 12,240 කට ව්‍යවසායකත්ව පුහුණුව ලබා දීම. වැය කළ මුදල රු.මි.25.63 කි.

xiii. තරුණ තරුණියන් 57,243 ක් සඳහා දිස්ත්‍රික් මට්ටමින් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.වැය කරන ලද මුදල රු.මි. 13.98 කි.

xiv. අලෙවි පහසුකම් වැඩි දියුණු කිරීම් යටතේ කුඩා අළෙවිසැල් 33 ක් වැඩි දියුණු කිරීම තුළින් සමෘද්ධි ව්‍යවසායක පවුල්වල ජීවන මට්ටම ඉහළ නැංවීමට ක්‍රියා කිරීම. වැයකරන ලද මුදල රු.මි. 77.16 ක් වේ.

xv. නිවාස ලොතරැයි අරමුදල යටතේ, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම නියෝජනය වන පරිදි එක් නිවාසකට රු.මි. 01 බැගින් මූල්‍යාධාරයක් ලබා දීම සිදු කරන ලදී. ඒ යටතේ නිවාස 911 ක් සඳහා රු.මි.136.65 ක නිවාස ආධාර ලබා දෙන ලදී.

xvi. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල උසස් පෙළ හදාරන දරු දැරියන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කරනු ලබන සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ**,** මසකට රු**.**1,500/- බැගින් මාස 24 ක කාලයක් සඳහා රු.36,000 මූල්‍ය ආධාරයක් ලබා දෙන ලද අතර**,** ඒ අනුව 2025 වර්ෂය තුළ සමෘද්ධි සිසු දරු දැරියන් 44,621 ක් සඳහා සිප්දොර ශිෂ්‍යත්ව ලබා දී ඇති අතර**,** ප්‍රදානය කළ මුළු ශිෂ්‍යත්ව වටිනාකම රු.මි. 773.32 කි.

xvii. ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ සවිබලගැන්වීමට හඳුනාගත් පවුල් මානසික හා සමාජ සවිබලගැන්වීම වෙනුවෙන් දැනුවත් කිරීම් උපදේශන වැඩසටහන්, සායන වැනි වැඩසටහන් යටතේ පවුල් 108,784 ක් සඳහා පහසුකම් සලසන ලදී.

xviii. සමාජ සංවර්ධනය යටතේ ජාත්‍යන්තර දුම්වැටි විරෝධී සැමරුම්, කාන්තා දින සැමරුම්, ළමා දින සැමරුම් වැඩසටහන්, ප්‍රජා හා පරිසර වැඩසටහන් 1,100 ක් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම. වැය කරන ලද මුදල රු.මි.20.70කි.

xix. ප්‍රතිලාභී ගණුදෙනු කාර්යක්ෂම කිරීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,097 ක් සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 335 ක් පරිගණකගත කිරීමට කටයුතු කිරීම.

<u>අභියෝග</u>

1. දිස්ත්‍රික් මට්ටම් නිලධාරීන් හා ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් පුරප්පාඩු පැවතීම නිසා ප්‍රාදේශීය මට්ටමේ දී සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දුෂ්කරතා මතු වීම.

2. සමෘද්ධි සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක නොවීම නිසා නිවාස ලොතරැයි හා සමාජ ආරක්ෂණ අරමුදලට දායකත්ව මුදල් නොලැබීමෙන් අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස වැඩසටහන් හා සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම දුෂ්කර වීම.

3. අස්වැසුම ප්‍රතිලාභී පවුල් සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු යාන්ත්‍රණය හා සෘජුවම සම්බන්ධ නොවීම නිසා, ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් සම්බන්ධ කර ගැනීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ දීම.

4. අස්වැසුම ප්‍රතිලාභ අහිමිවේ යන අදහසින් ඇතැම් අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන හා සම්බන්ධ වීමට අකමැති වීම.

5. කාර්යසාධනය මත ප්‍රාදේශීය හා වසම් මට්ටමේ නිලධාරීන් ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම.

පරිච්ඡේදය - 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව (2025.12.31 ට අනුමත කාර්ය මණ්ඩලය අනුව)		පවතින සේවක සංඛ්‍යාව 2024.12.31 දිනට	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	131	63	68
තෘතීයික	369	1,253	-884
ද්විතීයික	24,801	19,920	4,881
ප්‍රාථමික	431	405	26
එකතුව	**25,732**	**21,641**	**4,091**

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

මෙම දෙපාර්තමේන්තුවේ සමෘද්ධි බැංකු පද්ධතිය හා වෙනත් අරමුදල් මෙහෙයවීම සඳහා අවශ්‍ය ප්‍රශස්ථ කාර්යමණ්ඩල සංයුතිය සඳහා 2023.11.01 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව පුරප්පාඩු තනතුරු සඳහා විධිමත් බඳවා ගැනීම් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. කාර්යමණ්ඩලය පුරප්පාඩු වීම මත අනියෝග රැසකට මුහුණදීමට සිදුව ඇත.

6.3 මානව සම්පත් ධාරිතා සංවර්ධනය

2025 - ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල - භෞතික සහ මූල්‍ය ප්‍රගතිය

අ.ක්‍රි. අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්භාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	නායකත්ව හා ආකල්ප සංවර්ධනය - කෑගල්ල	83	දින 01	67,125.00		දේශීය	ඉතා උනන්දුවෙන් රාජකාරීවල නියැලීම
02	විශ්‍රාම ගැන්වීමට අදාළ දැනුම - කළුතර	52	දින 01	70,000.00		දේශීය	
03	විනය කළමනාකරණ පුහුණුව, විශ්‍රාම වැටුප් ලිපිගොනු සැකසීම, විනය කළමනාකරණ පුහුණුව - කුරුණෑගල	317	දින 01	301,940.00		දේශීය	අදාළ ලිපිගොනු සකස් කිරීම කාර්යක්ෂම වීම
04	ආකල්ප සංවර්ධනය, ලිපිගොනු කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, කාර්යාල හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මානසික සවිබලගැන්වීම - රත්නපුර	124	දින 01	86,180.00		දේශීය	ඉතා උනන්දුවෙන් රාජකාරීවල නියැලීම
05	කාර්යාල කළමනාකරණය හා කාර්යාල ක්‍රම, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර සැලසුම් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන - අනුරාධපුරය	195	දින 01	254,020.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
06	ධනාත්මක සංවර්ධන ආකල්ප, විශ්‍රාම වැටුප් සම්බන්ධ පුහුණුව -චව්නියාව	202	දින 01	227,000.00		දේශීය	ඉතා උනන්දුවෙන් රාජකාරීවල නියැලීම
07	ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණුව - මුලතිව්	160	දින 01	149,810.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
08	විශ්‍රාම වැටුප් කළමනාකරණය හා කාල කළමනාකරණය - යාපනය	120	දින 01	186,000.00		දේශීය	විශ්‍රාම වැටුප් රාජකාරී කාර්යක්ෂම වීම
09	ආයතන සංග්‍රහය (නිවාඩු, පෞද්ගලික ලිපිගොනු, විශ්‍රාම සහ විනය පරිපාටි) - මඩකළපුව	48	දින 01	58,096.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
10	ආකල්ප කුසලතා සංවර්ධන වැඩසටහන, ප්‍රජාමූල සංවිධානවල ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව	80	දින 01	117,200		දේශීය	ඉතා උනන්දුවෙන් රාජකාරීවල නියැලීම

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්භාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
11	නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, කාර්යාල කළමනාකරණය හා ලිපිගොනුකරණය, ගිණුම් ක්‍රියාවලිය හා ගබඩාකරණය, විනය කාර්ය පිළිබඳ, මූල්‍ය ප්‍රකාශ සැකසීම පිළිබඳ පුහුණුව -ගම්පහ	210	දින 01	150,000.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
12	වැටුප් පරිවර්තන සැකසීම / විශ්‍රාම ගොනු සැකසීම/අග්‍රහාර අයදුම්පත් නිවැරදිව යැවීම. - මහනුවර	198	දින 01	114,335.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
13	සවිබලගැන්වීමේ වැඩසටහනට සම්බන්ධ ප්‍රතිලාභීන්ට බැංකු ණය ලබාදීමට අදාළ ව්‍යාපෘති වාර්තා සකස් කිරීම සහ ධනාත්මක චින්තනය පිළිබඳ පුහුණුව / ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පුහුණුව - නුවරඑළිය	160	දින 01	200,000.00		දේශීය	සවිබලගැන්වීමේ කටයුතු කාර්යක්ෂම වීම
14	ආයතන සංග්‍රහය / ව්‍යාපෘති ක්‍රියාකාරකම්/පරිගණක පුහුණුව/ධාරිතා සංවර්ධනය - කිලිනොච්චි	104	දින 01	183,210.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
15	ආයතන කටයුතු හා මුදල් රෙගුලාසි වැටුප් සැකසීම, වැටුප් සාරාංශ සැකසීම, විශ්‍රාම ගොණු සැකසීම. – ගාල්ල	174	දින 01	121,392.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
16	විනය කාර්ය පටිපාටිය හා රාජ්‍ය සේවයේ ආචාර ධර්ම MS Office Training – කොළඹ	53	දින 01	120,750.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
17	කාර්යාල ක්‍රමවේදය පිළිබඳ පුහුණුව / ආකල්ප සංවර්ධනය - පොලොන්නරුව	187	දින 01	185,487.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
18	ආයතනික ගිණුම් පුහුණුව/ ITMIS පුහුණුව/ කාර්යාල කළමනාකරණය හා ආයතන ක්‍රම පිළිබඳ පුහුණුව - හම්බන්තොට	43	දින 01	82,740.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
19	ජීවනෝපාය ව්‍යාපෘතිකරණය / විශ්‍රාම ගොනු සැකසීම - මාතලේ	90	දින 01	77,095.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
20	බැංකු මාර්ගගත හා ගිණුම් ක්‍රියාවලි පුහුණුව/ආයතන කටයුතු පුහුණුව - ත්‍රිකුණාමලය	100	දින 01	84,006.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
21	ආකල්ප සංවර්ධන/ ඵලදායිතා සංවර්ධනය - මාතර	225	දින 01	170,020.00		දේශීය	ඉතා උනන්දුවෙන් රාජකාරීවල

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්භාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
							නියැලීම
22	Online බැංකු ගිණුම් පුහුණුව/ කාර්යක්ෂමතා කඩඉම් හා මුදල් රෙගුලාසි - මන්නාරම	120	දින 01	154,800.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
23	කාර්යාල ක්‍රම/ව්‍යාපෘති වාර්තා සකස් කිරීම/ ධාරිතා සංවර්ධනය - පුත්තලම	112	දින 01	253,680.00		දේශීය	කාර්යාල කටයුතු ක්‍රමවත් වීම
24	දිස්ත්‍රික් අභ්‍යන්තර විගණන නිලධාරීන් පුහුණු කිරීම - කළුතර, කොළඹ, ගම්පහ, කෑගල්ල, පුත්තලම	82	දින 01	71,325.00		දේශීය	විගණන කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම
25	දිස්ත්‍රික් අභ්‍යන්තර විගණන නිලධාරීන් පුහුණු කිරීම - මාතර, ගාල්ල, හම්බන්තොට	56	දින 01	53,877.50		දේශීය	විගණන කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම
26	දිස්ත්‍රික් අභ්‍යන්තර විගණන නිලධාරීන් පුහුණු කිරීම - අනුරාධපුර, පොලොන්නරුව	33	දින 01	42,920.00		දේශීය	විගණන කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම
27	දිස්ත්‍රික් අභ්‍යන්තර විගණන නිලධාරීන් පුහුණු කිරීම - යාපනය, මන්නාරම, මුලතිව් කිලිනොච්චිය	40	දින 01	57,900.00		දේශීය	විගණන කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම
28	දිස්ත්‍රික් අභ්‍යන්තර විගණන නිලධාරීන් පුහුණු කිරීම - ත්‍රිකුණාමලය, මඩකළපුව, අම්පාර (දමිල)	44	දින 01	72,600.00		දේශීය	විගණන කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම
	එකතුව	**3,412**		**3,713,508.50**			

සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන යටතේ කරන ලද පුහුණු වැඩසටහන්

ඒකක අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය මුදල (රු.)		වැඩසටහනේ ස්භාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	මනෝ සමාජීය ලෙස සවිබලගැන්වීම සඳහා ප්‍රාදේශීය උපදේශන නිලධාරීන් පුහුණු කිරීම	43		270,648.00		දේශීය	තාක්ෂණික දැනුම නිලධාරීන් වෙත ලැබීම
02	තිරසාර ජීවනෝපාය සංවර්ධනය පිළිබඳ පුහුණුව (Sustainable Livelihood Development	53		446,717.00		දේශීය	තාක්ෂණික දැනුම නිලධාරීන් වෙත ලැබීම
03	ව්‍යාපාර සැලසුම් සකස් කිරීම පිළිබඳ පුහුණුව	52		435,221.00		දේශීය	තාක්ෂණික දැනුම නිලධාරීන් වෙත ලැබීම
04	"ජීවනෝපාය ගැලැපීම්" පිළිබඳ පුහුණුව (Livelihood Machine)	61		399,458.00		දේශීය	තාක්ෂණික දැනුම නිලධාරීන් වෙත ලැබීම
05	"නායකත්ව සංවර්ධනය සහ මූල්‍ය සාක්ෂරතාවය" (Leadership Development and Financial Literacy)	79		773,476.00		දේශීය	තාක්ෂණික දැනුම නිලධාරීන් වෙත ලැබීම
06	සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන 2025 ප්‍රජාව මනෝ සමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම	10,995		10,457,609.24			තාක්ෂණික දැනුම නිලධාරීන් වෙත ලැබීම
	එකතුව	**11,283**		**12,783,129.24**			

ආසියානු සංවර්ධන බැංකු (ADB) හදිසි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ පැවැත් වූ පුහුණු වැඩසටහන්

අංක	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය මුදල (රු.)		වැඩසටහනේ ස්භාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
1	"ජීවනෝපාය ව්‍යාපෘති ගැලපීම" පිළිබඳ ප්‍රධාන පුහුණුකරුවන් (TOT) සඳහා සිංහල මාධ්‍ය පුහුණුව - නිල්ලඹ	61	දින 02	399,458.00		ADB අරමුදල්	තාක්ෂණික දැනුම වර්ධනය
2	"ජීවනෝපාය ව්‍යාපෘති ගැලපීම" දෙමළ මාධ්‍යය පිළිබඳ ප්‍රධාන පුහුණුකරුවන් (TOT) පුහුණු කිරීම - - නිල්ලඹ	24	දින 02			ADB අරමුදල්	තාක්ෂණික දැනුම වර්ධනය
3	ව්‍යාපාර ධාරිතා සංවර්ධනය පිළිබඳ ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම - නිල්ලඹ	35	දින 02	279,586.50		ADB අරමුදල්	තාක්ෂණික දැනුම වර්ධනය
4	ව්‍යාපාර ධාරිතා සංවර්ධනය පිළිබඳ මාස්ටර් පුහුණුකරුවන් පුහුණු කිරීම - නිල්ලඹ	20	දින 02	154,700.00		ADB අරමුදල්	තාක්ෂණික දැනුම වර්ධනය
5	තිරසාර ජීවනෝපාය සංවර්ධනය පිළිබඳ ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම - නිල්ලඹ	35	දින 02	272,362.00		ADB අරමුදල්	තාක්ෂණික දැනුම වර්ධනය
6	"තිරසාර ජීවනෝපාය සංවර්ධනය (දෙමළ) ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම - නිලාවේලි	14	දින 02	174,355.55		ADB අරමුදල්	තාක්ෂණික දැනුම වර්ධනය
7	නායකත්ව සංවර්ධනය සහ මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ පුහුණුව - නිල්ලඹ	52	දින 03	511,919.50		ADB අරමුදල්	තාක්ෂණික දැනුම වර්ධනය
8	නායකත්ව සංවර්ධනය සහ මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ පුහුණුව - දෙමළ මාධ්‍ය - නිලාවේලි	27	දින 03	261,557.50		ADB අරමුදල්	තාක්ෂණික දැනුම වර්ධනය
එකතුව				**2,053,939.05**			

ප්‍රධාන කාර්යාලයේ සේවය කරන අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ
ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු කිරීම පිළිබඳ විස්තර

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය මුදල (රු.)		වැඩසටහනේ ස්භාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
1	මූලික විමර්ශන නිලධාරියාගේ කාර්යභාරය, ඇතිවන ගැටළු, මූලික විමර්ශන වාර්තාවල දක්නට ලැබෙන අඩුපාඩු, චෝදනා පත්‍ර කෙටුම්පත් කිරීම පිළිබඳ පුහුණුව	87	දින 02	483,653.00		දේශීය	මූලික විමර්ශන කාර්යක්ෂම වීම
2	පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම, වැටුප් පරිවර්තනය	55	දින 02	250,085.00		දේශීය	කාර්යාල කටයුතු කාර්යක්ෂම වීම
3	ප්‍රාදේශීය සමෘද්ධි සන්නිවේදකයින් සඳහා, රූපවාහිනී මාධ්‍ය,සමාජ මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය පිළිබඳව විධිමත් පුහුණුවක් ලබාදීම.	200	දින 02	931,410.00		දේශීය	ප්‍රාදේශීය සමෘද්ධි සන්නිවේදන කටයුතු විධිමත් වීම
4	විශ්‍රාම වැටුප් ලිපිගොනුවක් ආරම්භ කිරීම, විශ්‍රාම වැටුප් ලිපිගොනුවක තිබිය යුතු මූලික ලේඛණ	64	දින 01	64,622.00		දේශීය	විශ්‍රාම වැටුප් ලිපිගොනුවල නිරවද්‍යය තාවය ඉහළ යාම
එකතුව		**406**		**1,729,770.00**			

පරිච්ඡේදය - 07- අනුකූලතා වාර්තාව

ඡේදය අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ	වාණිජ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	ගබඩා අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	විශේෂ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.6	වෙනත්	අදාළ නොවේ	වෙනත් අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම. (මූ.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංශය අංක	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.9	හානි පාඩු ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			

ඡේදය අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට , සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	නිකුත් කරනු ලබන විමසුම් සඳහා පිළිතුරු ලැබිය යුතුය.	දිස්ත්‍රික් විගණන ඒකක හරහා පිළිතුරු ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මු.රෙ. 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංශය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		

ඡේදය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.6	කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ආයතන ඒකාබද්ධ කිරීමේදී මතුවූ තත්ව හේතුවෙන් ගැටළු මතුවන තව දුරටත් නිරවුල් කළ යුතු ණය ශේෂ පවතී.	ණය ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය විධි විධාන සලසා ඇත.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		

අංශය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රේ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රේ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාළ නොවේ	වෙන් කළ ආදායම් ශීර්ෂයක් නොමැත	
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ	වෙන් කළ ආදායම් ශීර්ෂයක් නොමැත	
15.3	මු.රේ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ	වෙන් කළ ආදායම් ශීර්ෂයක් නොමැත	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			

අංශය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය තුළ තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කොට තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		

ඡේදය අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කර තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		



ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment



සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

Department of Government Printing